# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016දෙසැම්බර්15** වන බ්‍රහස්පතින්දා
2016 மார்கழி 15 வியாழக் கிழமை
Thursday15th December 2016

බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුවමාවතේ, අංක **204** හි පිහිටි බස්නාහිර පළාතේ සභාගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.00ට පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.00 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.00 a.m.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා[යසපාල කෝරළගේ මහතා]මූලාසනාරූඪ විය.**
*கௌரவ பிரதித் தவிசாளர் [யசபால கோறலகே அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Deputy Chairman [Yasapala Koralage] in the Chair*

## නියෝජ්‍ය සභාපතිවරයාගේ නිවේදනය
ANNOUNCEMENT OF DEPUTY CHAIRMAN

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධක, පරිවාස, ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධ විවාදයෙන් අනතුරුව ඡන්ද විමසීම පෙරවරු 10.00 ට සිදු කිරීමට තිබෙනවා. ඉන් අනතුරුව 2017 වර්ෂයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳව වැඩ කටයුතු ආරම්භ කර ඒ පිළිබඳව ඡන්ද විමසීම මධ්‍යාහ්න 12.00 ට සිදු කිරීමට නියමිත බවත් සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත මේ අවස්ථාවේදී දැනුම් දෙනවා.

## නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම් වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙම අවස්ථාවේදී පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

## වාර්ෂික මුදල් ප්‍රකාශය - 2017
## පූර්ණ කාරක සභාව
ANNUAL FINANCIAL STATMENT - 2017
COMMITTEE OF THE WHOLE COUNCIL

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 105** | - | **සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 113** | - | **සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 114** | - | **ආයුර්වේද දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 115** | - | **සමාජ සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 116** | - | **පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව** |
| Head No 105 | - | Ministry of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs |
| Head No 113 | - | Department of Health Services |
| Head No 114 | - | Department of Ayurveda |
| Head No 115 | - | Department of Social Services |
| Head No 116 | - | Department of Probation and Child Care Services |

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයට අනුව දැන් තිබෙන්නේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් විවාදය. ඊයේ එනම් 2016.12.14 වන දින නතර කළ තැන් පටන් ඉදිරියට ගෙන යැමයි. ඒ අනුව රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා.09.04]

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුභ උදෑසනක්. ගරු විපක්ෂ නායකතුමනි, සෞඛ්‍ය ඇමැතිතුමනි, ගෞරවනීය මන්ත්‍රීවරුනි,අද බස්නාහිර පළාතේ අයවැය විවාදය අවසන් දවසේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. බස්නාහිර පළාතේ සෞඛ්‍ය තත්ත්වය කථා කිරීමට පෙර, රටේ සෞඛ්‍ය තත්ත්වය කථා කිරීමට පෙර මම නියෝජනය කරන මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නැත්නම් මීගමුව මැතිවරණ කොට්ඨාශයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව ගරු සෞඛ්‍ය ඇමැතිතුමාගේ අවධානය යොමු කිරීම සඳහා මගේ කථාව පෙළගස්වන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීගමුව දිස්ත්‍රික් මහ රෝහල අක්කර 10 රූඩ් 02 යි පර්චස් 17 ක බිම් ප්‍රමාණයකින් සමන්විත වුණු මේ රෝහල 1909 වසරේදී මධ්‍යම බෙහෙත් ශාලාවක් සහ මාතෘ නිවාසයක් ලෙස ආරම්භ කළා. පියවරින් පියවර නව ගොඩනැගිලි එක් වෙමින් පුළුල් වූ මෙම රෝහලට කොරියානු රජයේ පරිත්‍යාගයක් ලෙස ක්යුං සමාගම විසින් තුරෙයි රාජා ඇසෝසියේට්ට් වෙත උප කොන්ත්‍රාත් භාර දීමෙන් පසු 2002 වසරේ වර්ග අඩි72,000 ක විශාලත්වයෙන් යුතු සත් මහල් ගොඩනැගිල්ලක් ඉදි කරනු ලැබුවා. මේ ගොඩනැගිල්ල විවෘත කරලා අවුරුදු දෙකක් පමණ ගත වූ පටන් මේ ගොඩනැගිල්ලේ උඩ සිට පහළට ජලය කාන්දුවීමක් ආරම්භ වුණා. මෙම ගැටලුව 2014 වර්ෂය වෙද්දී උග්‍ර අතට හැරෙන තත්ත්වයකට පත් වුණා. ඒ නිසා රෝගීන්ගේ අනාරක්ෂිත තත්ත්වය පිළිබඳව ජාතික පරමාණු බලශක්ති අධිකාරියෙන් වාර්තාවක් ලබා ගත්තා. එම වාර්තාව අනුව මෙම ගොඩනැගිල්ල අනාරක්ෂිත බැවින් වහාම මෙම ගොඩනැගිල්ලෙන් ඉවත් වන ලෙස නිර්දේශ කළා. ඉන්පසු හදිසියේ රෝගීන් සහ කාර්ය මණ්ඩලය රෝහලේ පිහිටි අනිකුත් ගොඩනැගිලිවලට අනුයුක්ත කළා. ඉන්පසුව අර්ධ තාවකාලික ගොඩනැගිලි හතරක් කඩනමින් ඉදි කළා. ඒවා අද warehouse බවට පත් වෙලා. 2015 ඔක්තෝබර් මස අතිගරු ජනාධිපතිතුමා විසින් සේවා කටයුතු සඳහා මෙය විවෘත කළා. සත් මහල් ගොඩනැගිල්ල සඳහාත්, තාවකාලික ගොඩනැගිලි සඳහාත් විශේෂ කැබිනට් පත්‍රිකාවක් මගින් මිලියන 500 ක මුදලක් ලබා දුන්නා. ඒ මිලියන 500 න් දැනට රුපියල් මිලියන 260 ක් තාවකාලික ගොඩනැගිල්ල සඳහා වියදම් කරලා තිබෙනවා. සෞඛ්‍ය ගරු අමාත්‍යතුමනි, මේ වන විට පැරණි සත්මහල් ගොඩනැගිල්ල යථා තත්ත්වයට පත් කිරීමට ඉතිරියමුදල් ප්‍රමාණවත් නොවන බවට නිර්දේශ වෙලා තිබෙනවා. මෙම රෝහලේ බාහිර රෝගී අංශයට දිනකට රෝගීන් 1000 කට වැඩි ප්‍රමාණයක් ප්‍රතිකාර සඳහා පැමිණෙනවා. තවදුරටත් මන්දගාමීව ඉදි කිරීම් සිදු කරන මෙම ගොඩනැගිල්ල පියවරෙන් පියවර මේ විදියට ප්‍රමාද වෙද්දී, රෝගීන් අපා දුක් විඳින තත්ත්වයට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම රෝහලේ අර්බුදකාරී තත්ත්වයට පත් වුණු වෙලාවේ මීගමුව නගරයේ ආගමික නායකයන්, සිවිල් සංවිධාන, විද්වතුන්, බුද්ධිමතුන්, අහිංසක ජනතාව සමඟ වීදි බැස්සා. ඊට පෙර සාකච්ඡා වට කිහිපයක් පැවැත් වූවා. මේ රෝහල අනාරක්ෂිතයි. මේ රෝහල ක්‍රම ක්‍රමයෙන් පැත්තකට ඇදී යන තත්ත්වයක් තිබුණා. ඇල වන තත්ත්වයක්. ඒ නිසා මේ රෝහල පිළිසකර කර දෙන්නය කියලා ඉල්ලුවා. වීදි බසින තුරු කිසිම බලධාරියෙක් ඔවුන්ගේ බලතල පාවිච්චි කරලා වගකීම් ඉෂ්ට කරන්න ඉදිරියට ආවේ නැහැ. ජනතාව උද්ඝෝෂණය සඳහා පෙළ ගැසිලා වීදි බැස්සායින් පස්සේ ජනතාවගේ ඉල්ලීම වුණේ, මෙම රෝහල පළාත් සභා අධිකාරිය, නැත්නම් පළාත් සභාවෙන් ගලවාගෙන මධ්‍යම ආණ්ඩුවට කරුණාකර පවරාගන්න කියලා. දිස්ත්‍රික් මහ රෝහලක් මේ තත්ත්වයට පාලනය කරන්න බැරි නම්, මුදල් වියදම් කරලා, මේක නවීකරණය කරන්න බැරි නම්, යථා තත්ත්වයට පත් කරන්න බැරි නම්, කරුණාකර මෙය මධ්‍යම රජයට පත් කරගන්න කියලා. එම ඉල්ලීමට, බස්නාහිර පළාත් සභාවේ එවකට හිටපු සෞඛ්‍ය අමාත්‍ය රංජිත් සෝමවංශ මැතිතුමා එපමණ ප්‍රතිචාරයක් දැක් වූයේ නැහැ. එතුමා මේක අපේ

දේපළක්. නමුත් මිලියන 500 ක්, 600 ක් අපට දෙන්නත් බැහැයි කියන මධ්‍යම ප්‍රතිපදාව තමයි අනුගමනය කළේ. අවසානයේ ජනතාවගේ ඉල්ලීම ක්‍රමක්‍රමයෙන් උග්‍ර අතට හැරෙද්දී, හිටපු අමාත්‍යවරයෙක්, අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වන නිමල් ලන්සා ඇමැතිතුමා ඒ උද්ඝෝෂණවල මුලසුන ගත්තා. සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ මැතිනිය එම උද්ඝෝෂණවල පෙරමුණේ සිටියා. මමත් සිටියා. තව පළාත් සභා මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සිටියා. ජනතාවගේ ප්‍රබල ඉල්ලීම නිසා මේ අයට සිද්ධ වුණා, මේක මධ්‍යම රජයට පවරාගන්න කියන්න. නමුත් ඒ වෙලාවේ හිටපු සෞඛ්‍ය ඇමැති රංජිත් සෝමවංශ මැතිතුමා කිසිසේත්ම කැමැති වුණේ නැහැ, පළාත් සභාවේ දේපළක් මධ්‍යම රජයට දෙන්න. දැන් ජනතාවගේ ඉල්ලීම තෙරපි තෙරපි එද්දී නිමල් ලන්සා මැතිතුමා මීගමුවේ දේශපාලඥයෙක් නිසා රංජිත් සෝමවංශ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා නැති දවසේ න්‍යාය පත්‍රය අත්හිටුවලා මෙම රෝහල මධ්‍යම රජයට පවරාගන්න එතුමා යෝජනාවක් ගෙනාවා. විෂයය භාර ඇමැතිවරයා මෙතැන නැහැ. එතුමාගේ කථාව කරලා සභා සම්මුතියක් අරගෙන, එතුමා ලකුණු දා ගත්තා. සාමාන්‍ය භාෂාවෙන් කියනවා නම්. අන්න, මම යෝජනාව ගෙනාවේ. මීගමුවට මට යන්න ලෙහෙසියි. මම ඔබතුමන්ලාගේ ඉල්ලීම ඉෂ්ට කළා. ස්වාමීලාගේ, හාමුදුරුවන්ගේ, ආගමික නායකයන්ගේ, විද්වතුන්ගේ, බුද්ධිමතුන්ගේ අවශ්‍යතාවය, දුප්පත් ජනතාවගේ ඉල්ලීමට මම කන් දුන්නා. පළාත් සභාවට මම යෝජනාව ගෙනාවා. න්‍යාය පත්‍රය අත්හිටෙව්වා. යෝජනාව සභා සම්මත වුණා. දැන් මධ්‍යම ආණ්ඩුවට ගන්නවා කියලා එතුමා ප්‍රකාශ කළා. සතියකට පස්සේ විෂයය භාර අමාත්‍යවරයා රංජිත් සෝමවංශ මැතිතුමා මෙතැනට ආවා.

ඒ එද්දී රාජිත සේනාරත්න සෞඛ්‍ය ඇමැතිතුමා මීගමුවට ඇවිල්ලා සල්ලි දෙන්න පොරොන්දු වුණා. එදා නිමල් ලන්සා ඇමැතිතුමා Absent. එතුමා නැහැ. දැන් ඔන්න අර මල්ලෙන් බළලා එළියට පැන්නා. එතුමා කියනවා, නිමල් ලන්සා මැතිතුමා මේ යෝජනාව ගෙනැල්ලා සම්මත කරන දවසේ එතුමා හිටියේ නැහැ නේ?කිසිසේත් මධ්‍යම රජයට මේක දෙන්නේ නැහැ. මේක පළාත් සභාව සතු දෙයක්. මට රාජිත සේනාරත්න ඇමැතිතුමා කිව්වා, මුදල් දෙනවා කියලා. ඒ නිසා මේක දෙන්න සූදානම් නැහැයි කියලා ඒ ප්‍රකාශය කරද්දී, අර ඇමැතිවරයා එදා මේ සභාවේ නැහැ.මෙන්න මේ විධියට දෙබිඩි පිළිවෙතක් අනුගමනය කරලා රෝගීන්ගේ, ගිලන් වුණු අයගේ ජීවිතත් එක්ක සෙල්ලම් කරපු කාලයක් තිබුණා,ගරු සෞඛ්‍ය ඇමැතිතුමනි.

මේ සියල්ල ඔබතුමා වෙත කර පටවනවා නොවෙයි. නමුත් ඔබතුමා අද විෂයය භාර අමාත්‍යවරයා නිසා ඔබතුමාගේ ගෞරවනීය අවධානයට යොමු කිරීමටත්, මෙතැන් පටන් මේ කාර්යය හරියට කිරීම සඳහා ඔබතුමාට අවශ්‍ය කරන, අපි දන්න කරුණු කාරණා කියලා නිවැරැදි මාර්ගය අවතීර්ණය කර ගන්න උත්සාහ කිරීමක් පමණයි මේ. කෙසේ වෙතත් අද මේ සියලු කාර්යයන්වල අවසානයේ සිද්ධ වෙලා තිබෙන්නේ රෝගීන්ටwarehouse වල ඉන්න සිද්ධ වීමයි. රුපියල් මිලියන 260 ක් වියදම් කරපු - ඊයේ පෙරෙයිදා රාජිත සේනාරත්න සෞඛ්‍යඇමැතිතුමා ආවා. මමත් ගියා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත් ගියා. තවත් මන්ත්‍රීවරු සිටියා. රාජිත සේනාරත්න ඇමැතිතුමාගේ පුතාත් සිටියා. පුතාම කියනවා, ඇමැතිතුමා කථා නොකළාට මම පාර්ලිමේන්තුවේ කථා කරනවා. මම දන්නේ නැහැ, යහපාලනය තමයි. මොන විධියට යනවාද කියලා. අර රෝගීන් දවල් කාලයේ රස්නෙන්, warehouseකියලා මම කිව්වේ ඒකයි. පීඩාවෙන් පීඩාවට ලක් වෙලා. රෝගී තත්ත්වයෙන් පීඩාවට ලක් වෙලා. පහසුකම් නැති නිසා පීඩාවට පත් වෙලා. ඒ රෝගීන් මෝචරියට ගියා නම් ඊට වැඩිය හොඳයි කියන තත්ත්වයට ඇත්තටම පත් වෙලා. ඒ නිසා මම ගෞරවණීය ලෙස අද තමුන්නාන්සේගේ වැය ශීර්ෂය දවසේ අවධානයට යොමු කරනවා. මේක කොරියානු සමාගමකින් හැදුවේ. ඒක sub - contract දුන්නා. නමුත් අද වනතුරු කිසිම ලිය කියවිල්ලක් නැහැ. මම ඔබතුමාගෙන් අහලා, ඔබතුමාව අසීරු තත්ත්වයට පත් කරන්නේ නැහැ. එදා කොරියානු සමාගමක් විසින් මේක හදන්න භාර දීපු තුරෙයි Rajaassociate ට උප කොන්ත්‍රාත්තුව භාර දීමෙන් පසුව වැය කරපු මුදල කීයද කියලා ඇහුවොත් රෝහල තුළ කිසිම ලිපි ලේඛනයක් නැහැ. අපි පරීක්ෂා කරලා බැලුවා. ගිය මුදලක් නැහැ. තව පැයක් තිබෙනවා. නිලධාරීන්ගෙන් අහන්න පුළුවන්. මම හිතන්නේ නැහැ, ඔබතුමාටත් මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ,2002 වර්ෂයේ හදපු මේ සත් මහල් ගොඩනැගිල්ලට කොපමණ මිලියන ප්‍රමාණයක් වියදම් කළාද කියලා සොයන්න. අද වනතුරු එය සොයාගන්න බැහැ. ඒ විධියට තමයි මේවා වෙලා තිබෙන්නේ. ඇත්තටම
[ගරු රොයිස් විජිත ප්‍රනාන්දු]

මේවා සම්බන්ධයෙන්FCID යන්න ඕනෑ. මේ පොළවෙත් නැහැ.අපි දන්නවා.දේශපාලඥයන් හම්බ කරනවාඒවායේ බරක් තිබෙනවා. ඒවායේ ක්‍රමයක්, ශිෂ්ටාචාරයක් තිබෙනවා. මම කියන්නේ නැහැ, ඒවා හරියි කියලා. ගහලා තිබෙන ගැහිලිවලටමේකේ කැල්කියුලේටරයේ බිංදු නැහැ. අනික මේ වාගේ අංශවලින් කන්නේ නැහැ. රෝහලකින්. එක්කෝ, ඒ රෝහල හරියට හදන්න තිබුණා. 2002 වර්ෂයේ හදලා.2014 කියන්නේ අවුරුදු 12 ක් යද්දී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වතුර කාන්දු වෙන්න ගත්තා. පරමාණු බලශක්ති අධිකාරිය මොනවාද කිව්වේ. බිත්ති අස්සෙන් බට ගියා. බටවලින් වතුර ලීක් වුණා. ඒවා ගලාගෙන ආවා. ඔබතුමාගේ ගෞරවණීය අවධානය ඒ සඳහා යොමු කරනවා.

තව විශේෂ කරුණක් තිබෙනවා. මෝචරිය. සෞඛ්‍යගරු ඇමැතිතුමනි, මේකේ ඇස්තමේන්තුව තිබෙනවා. ඔබතුමාත් බලන්න ආවා. මිලියන 26 ක්. තාවකාලික මෝචරිය. අද මේ වෙද්දී කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට,වෙළඳ කලාපයට, කොළඹ සිට කිලෝ මීටර් 22 යි. මහා සංචාරක පුරවරයක මෝචරියේ මළ මිනී දාන්නේ, මාළු දාන ෆ්‍රීසර් එකක. කථා කරන්න අපි කනගාටු වෙන්න ඕනෑ. ප්‍රමිතියක් නැති මාළු දාන ෆ්‍රීසර්වල තමයි අද මළ මිනී දාන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මාසයකට මරණ පරීක්ෂණ 60 ක් පමණ පවත්වන, ගබඩා පහසුකම් මෘත ශරීරවලට 20 කට පමණ තිබෙන,වසර 70 කට වැඩි පැරණි මේ ගොඩනැගිල්ල්ට මේ ශීතකරණ ලැබුණෙත් Donation එකක් හැටියට. මේවා කූලර්. මරණ පරීක්ෂණයට ගෙනෙන මළ මිනී - මැරුණු විධිය සොයා ගන්න, මෘත දේහ කපනවා නම් ඒ මරණ පරීක්ෂණයට පෙර මේවා නිසි ප්‍රමිතියකින් ගබඩා කරලා තිබෙන්න ඕනෑ. එහෙම නොවුණොත් ඒවාෆීසර් නොවන නිසා ඒ මළ මිනීවල පවත්න මරණ පරීක්ෂණයේදී Post-mortemඑකේදී ඒ මරණයට හේතුව සොයා ගැනීමේදී වෛද්‍යවරුන්ට ඒක අභියෝගයකට ලක් වෙනවා. මම කනගාටු වෙනවා. මම ඔබතුමා පිට බර පටවනවා නොවෙයි. ඔබතුමා අභිනවයෙන් පත් වුණා. නමුත් අපට කියන්න ඉන්නේ ඔබතුමායි. ඔබතුමායි විෂයය භාර අමාත්‍යවරයා. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරලා, කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට ආසන්නයේ තිබෙන මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ මේ වර්තමාන තත්ත්වය ගැන සලකා බලලා ජනතාවත් රෝගීනුත් මළ මිනිත් - මොකද, සුසාන භූමි ආඥා පනතේ තිබෙනවා, මළ මිනියකට අගෞරව කරන්න බැහැයි කියලා. ඒ නිසා මළ මිනී ටිකත් අපවත් බේරගන්න පුළුවන් පුළුල් වැඩ පිළිවෙළක් දියත් කරලා, ඒ රෝගීන්ව මේ පීඩාවෙන් ගලවා ගන්න කියලා ඔබතුමාගෙන් ඉතාමත්ම ගෞරවයෙන් මම ඉල්ලමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා.09.17]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට වචන ටිකක් කථා කරන්න මෙම අවස්ථාව ලබා දීම පිළිබඳවඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මුලින්ම කියන්න ඕනෑ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විධියට අපි කළු පටි පැළඳ ගැනීමේ ව්‍යාපාරයක් කරගෙන යනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි, ජනතාවට තොරතුරු දැන ගැනීමට තිබෙන අයිතියට බාධා කරමින්, ලංකාවේ නාවික හමුදාපති ලවා මාධ්‍යවේදීන්ට පහර දීලා, ජනතාවට තොරතුරු දැන ගැනීමේ අයිතියට කරන බාධාව නතර කරන්න බල කරන්න සහ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියන බල කිරීම කරන්න තමයි මේ කළු පටි පැළඳීම කරන්නේ කියන එක මතක් කරන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි කියන්නේ පොහොට්ටුවේ අයද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි කියන්නේ, මාධ්‍යයට හිතවත් සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය නිදහස අගය කරන අය. (බාධා කිරීමක්)ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් සුමිත්ලාල් මැන්දිස් මැතිතුමා අත්දැකීම් බහුල බොහොම කාර්යක්ෂම ඇමැතිවරයෙක් විධියට මේ අමාත්‍යාංශය කරගෙන යන්න එතුමාට බොහොම ශක්තියක් තිබෙනවා. ඒ නිසාම තමයි මේ අඩුපාඩු, පුංචි කාරණා කිහිපයක් මතක් කරන්න යන්නේ. ප්‍රථමයෙන් මම කැමැතියි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන ගැටලුවක් පිළිබඳව කථා කරන්න. ගරු

නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේඇතුළේ ඉන්න රියැදුරන්27 දෙනෙක් වැඩ ආවරණය කරන රියැදුරන්

විධියට, සමහරු අවුරුදු 13 ක් තිස්සේ, සමහරු අවුරුදු 16 ක් තිස්සේ, සමහරු අවුරුදු හය හතක් තිස්සේ සේවය කරමින් ඉන්නවා. ඔවුන්ට ස්ථිර රියැදුරු තනතුරු දෙන්න කියන පුංචි අරගලයක් තිබුණා. මේ අරගලය ඉස්සරහාට ගිහින් අවසානයේ විසඳුම් ලැබෙන්නේ නැති නිසා මේ රියැදුරන් අධිකරණයට ගියා. අද අධිකරණයෙන් නියෝගයක් දීලා තිබෙනවා. විශේෂයෙන් මම මේ වෙලාවේ ආණ්ඩුකාරතුමාට, ප්‍රධාන ලේකම්තුමාට සහ වර්තමාන අමාත්‍යාංශ ලේකම්තුමියටස්තූතිවන්ත වෙනවා. ඔවුන්ගේ මැදිහත්වීම මත මේ නඩුවට සමතයක් ඉදිරිපත් කරමින්, නඩුව සමතයට පත් කරගන්න කටයුතු කරලා තිබෙනවා.ඒ අනුව අද පුළුවන්කම ලැබිලා තිබෙනවා,මේ රියැදුරන් 27 දෙනාට ස්ථිර රැකියා අවස්ථා ලබා දෙන්න. මම ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේකට වැඩි කල් යවන්නේ නැතිව - මොකද ප්‍රශ්නය තිබෙන්නේ, මේ ඉන්න ස්ථිර රියැදුරන්, දැනට ඉන්න රියැදුරු සංගමය මේ නඩුවට කොටස්කරුවන් විධියට මැදිහත් වෙලා, මේ ස්ථිර කිරීම සිද්ධ කරන්න එපාය කියන බාධාව කළා. මේකේදී අධිකරණය ඉතාම පැහැදිලිව කිව්වා,

*" තවද මැදිහත්කාර පෙත්සම්කරුවන් පවසන අන්දමට පරිපාලන ව්‍යාකූල තත්ත්වයට පත් වන්නේ මෙම නඩුවේ පෙත්සම්කරුවන් ඇතුළු 27 දෙනාගේ රැකියා ස්ථිර කිරීම මගින් නොව තම සහෝදර අනික් සේවකයින් සම්බන්ධව මැදිහත්කාර පෙත්සම්කරුවන් ද්වේශසහගත අන්දමට ක්‍රියා කරමින් එසේ ක්‍රියා කිරීමට වග උත්තරකරුවන්ට සිදු කරන බලපෑම් නිසා වන බවද පෙනී යයි. එයින් මෙම නඩුවට මැදිහත් වීමට මැදිහත්කාර පෙත්සම්කරුවන්ගේ ඉල්ලීම කිසිසේත් සාධාරණ සහ යුක්ති සහගත නොවූ ඉල්ලීමක් ලෙස සලකමි කියලා"*

එය නිෂ්ප්‍රභා කළා.

ඒ අනුව තමයි මහ අධිකරණයේ විනිසුරුතුමිය කුසලා සරෝජනී අබේවර්ධන මැතිනිය මේ නියෝගය දුන්නේ. ඒ නිසා මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා,මේ නියෝගය මත කඩිනමින් මේ අයට ස්ථිර තනතුරු ලබා දීලා, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රියැදුරන්ගේ අඩුපාඩු නිසා යම් අපහසුතාවයක් තිබෙනවා නම් ඒ අපහසුතාවය මඟහැරගන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරන ගමන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මම මේ නඩු තීන්දුව සභාගත කරනවා.[1]

මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳව. අපි දන්නවා, මේ සෞඛ්‍ය කියන දැවැන්ත විෂයය නිසා මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගරු ඇමැතිතුමා යටතේ තිබෙන අනිකුත් විෂයයන් සියල්ල වැසී යන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මේ පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳව සාකච්ඡා කරන්නම ඕනෑය කියලා මම විශ්වාස කරනවා. මොකද,මේ කොල්ලකාරීසමාජයේ අසරණ වන පිරිස තමයි දරුවන් කියලා කියන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දරුවන්ට හැකියාවක් නැහැ තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන්න. වීදි බහින්න. වතුර ටැංකිය උඩට නගින්න. එහෙම හැකියාවක් දරුවන්ට නැහැ. දරුවන්ගේ අයිතිවාසිකම් හැම වෙලාවේම රැකෙන්නේ, සමාජයක වැඩිහිටියන් දරුවන් පිළිබඳව අවබෝධයකින්, අවධානයකින් කටයුතු කළොත් විතරයි. ඒ නිසා වැඩිහිටියන් විධියට විශේෂයෙන් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට බරපතළ වගකීමක් පැවරිලා තිබෙනවා. දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කටයුත්තට තමන්ගේ දායකත්වය දෙන්න. දරුවන් කොයිතරම් අවාසනාවන්ත තත්ත්වයට පත් වෙලා තිබෙනාවද කියලා පුංචි සංඛ්‍යා ලේඛන කිහිපයකින් මම කියන්න කැමැතියි.

මේ ගෙවන අවුරුද්දේ 2016.07.31 දින වන කොට ආයතනගත දරුවන් 4045 ක් හිටියා. ළමා මව්වරු ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. 2014 වසරේ ළමා මව්වරු 49 දෙනෙක් වාර්තා වුණා. බස්නාහිර පළාතඇතුළේ. 2015 වසරේ 50 ක්. 2016 සැප්තැම්බර් දක්වා 26 දෙනෙක් ළමා මව්වරු වාර්තා වෙනවා. ළමා මව්වරු නිවාස ගත වෙලා ඉන්නවා. මේක වාර්තා වෙන පිරිස විතරයි. මීට අමතරව තව පිරිසක් ඉන්න පුළුවන්. 2015 වර්ෂයේ අධිකරණයට නඩු කටයුතු වෙනුවෙන් 3266 ක් ඉදිරිපත් වෙලා තිබෙනවා. 2016.07.31 වන කොට 2563 ක් දරුවන්ගේ කටයුතු වෙනුවෙන් අධිකරණයේ නඩු පැවරිලා තිබෙනවා. නව ළමා නිවාස 06 ක් ආරම්භ කරලා තිබෙනවා. බස්නාහිර පළාතේ ළමා නිවාස 120 ක් තිබෙනවා. තවත් 06 ක් ආරම්භ කරනවා. ඉතින් මේකෙන් පේනවා,ළමයින්

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

[ගරු මහේෂ් අල්මේදා]

කොයිතරම්අසරණ වෙනවාද? ළමයින්ට කොයිතරම් ප්‍රශ්න තිබෙනවාද? ළමයි වෙනුවෙන් සමාජයේ දරන ආකල්පය මොකක්ද?මේ නිසාම මේ ළමයින්ගේ සුභ සාධනය වෙනුවෙන් කටයුතු කරන්නවිශේෂ වගකීමක් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට පැවරෙනවා. අර සෞඛ්‍යයේ කියවෙන කියමනක් තිබෙනවා, prevention is better than cure කියලා. අපි ළමයින් අමාරුවේ වැටුණාට පස්සේ ළමයින්ට සහන සලසනවාට වැඩිය ළමයින් අමාරුවේ වැටෙන්න කලින්, ළමයින්ට කරදරයක් වෙන්න කලින් එයින් ගලවා ගන්න වැඩ සටහන් මෙහෙයවීම තමයි වඩා වටින්නේ කියලා තමයි මම විශ්වාස කරන්නේ. හැබැයි, මේ පරිවාස හා ළමාරක්ෂක දෙපාර්ත්මේන්තුවේ මෙහෙවර ප්‍රකාශයේ ළමයින් ඒ තත්ත්වයෙන් මුදා ගැනීමේ ප්‍රජාව දැනුවත් කිරීම කියලා පුංචි කෑල්ලකට සීමා කරලා තිබෙනවා. ඉතින් මෙතැන විතරක් ළමයාට සෙනෙහස අත්‍යවශ්‍ය වන, ඔහුගේ මුල් ළමා විය සංවර්ධනය කරන්න මැදිහත් වෙනවා කියලා විතරක් සඳහන් කරලා තිබෙනවා. මම කියන්නේ, එතැනට විතරක් යොමු වෙලා මදී. ඊට එහා ගිය ක්‍රියා මාර්ගයක් ළමයින් වෙනුවෙන් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගෙවෙන අවුරුද්දේ ළමයින් අපයෝජනය සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් ළමයින්ට සිදුවන හානිය අවම කරන්න, දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න, මුදල් වෙන් කරලා තිබෙනවා. ඒක ඉතාම අල්ප මුදලක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මූලස්ථාන පරිවාස කාර්යාල බස්නාහිර පළාත ඇතුළේ12 ක් තිබෙනවා. මේ පරිවාස කාර්යාල 12 ඇතුළේ 2014 වර්ෂයේ මේ දැනුවත් කිරීමේ වැඩ සටහන් 36 ක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම 2015 වර්ෂයේ 50 ක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. හැබැයි, 2016 වර්ෂයේ 10 යි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. මේකෙන් අවිස්සාවෙල්ල අපි නියෝජනය කරන ප්‍රදේශයේ එකම දැනුවත් කිරීමේ වැඩ සටහනක්වත් ක්‍රියාත්මක කරලා නැහැ. ගරු නියෝජ්‍යසභාපතිතුමනි, මේ වෙනුවෙන් වෙන් වන්නේ,රුපියල් 25,000 ක විතර මුදලක්. වැඩසටහන් දෙකක් අවුරුද්දට කරන්න. මේකෙ ඉතාම ප්‍රමාණවත් නැති තත්ත්වයක්. මීට වැඩිය වැඩ සටහන් ප්‍රමාණයක් මේ දැනුවත් කිරීම සඳහා කරන්න ඕනෑ. ඒකෙනුත් අවිස්සාවෙල්ල පරිවාස කාර්යාලයට පුළුවන් වුණේ, එක වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න විතරයි. ඒ වැඩ සටහන කියාත්මක කරනවා මම දැක්කා. මේක කළේ, පොලීසිය සම්බන්ධ කරගෙන. 15 ක්වත් සහභාගි වෙලා සිටියේ නැහැ. මන්ත්‍රීවරු දැනුවත් කරන්නෙත් නැහැ. ඒ පරිවාස නිලධාරීන්ටත් එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. පරිවාස නිලධාරීන් ඉන්නේ බරපතළ අපහසුතා මැද්දේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවිස්සාවෙල්ල පරිවාස කාර්යාලය ගත්තොත් එතැන මූලස්ථාන පරිවාස නිලධාරියාත් එක්ක පරිවාස නිලධාරීන් දෙදෙනෙක් සේවය කරනවා. පසුගිය අවුරුද්දේ හතරවැනි මාසයේ සිට මේ කාර්යාලයේ හිටපු කළමනාකරණ සහකාරවරයාව අයින් කරලා තිබෙනවා. ස්ථාන මාරු කරලා තිබෙනවා. කළමනාකරණ සහකාරවරයෙක් නැහැ. සමහර දවසට පරිවාස නිලධාරීන් උසාවියට යන්නේ, කාර්යාලය වහලා දාලා. එදාට කවුරු හරි අමාරු වැටිලා, කරදරේ වැටිලා දරුවෙක්ගේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න ආවොත්, ඒ කටයුත්ත ඉටු කරන්න පුළුවන්කමක් නැහැ. පරිවාස කාර්යාලයට කරන්න වැඩ රාශියක් තිබෙනවා. මේ පරිවාස කටයුතු සිද්ධ කරද්දීඅවිස්සාවෙල්ල සුවිශේෂී තැනක්. මොකද, අවිස්සාවෙල්ලේ තියෙන මූලස්ථාන පරිවාස කාර්යාලයට සබරගමු පළාතේ වැඩත් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. පොලිස් කොට්ඨාශ හයක වැඩ අවිස්සාවෙල්ල පරිවාස කාර්යාලය සිදු කරනවා. අවිස්සාවෙල්ල උසාවියට, ඇහැළියගොඩ සහ රුවන්වැල්ල පොලීසිවලත් වැඩ කරන්න සිද්ධ වෙනවා. අවිස්සාවෙල්ල උසාවියට එන හින්දා. ඒ නිසා මේ පරිවාස කාර්යාලය මීට වැඩිය සවිමත් කරන්න ඕනෑ.ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිය අවුරුද්දේ අවසාන මාසවල පත් කරපුකාර්යාල කාර්යය සහායකයෙක් ඉන්නවා, . ඔහුට ලියන්න කියන්න තේරෙන්නේ නැහැ. ගොඩක් වෙලාවට මේ පරිවාස නිලධාරීන් දරුවන්ගේ වැඩ වෙනුවෙන් මේ කාර්යාල කාර්ය සහයකයාව සහායට ගත්තා. නමුත් මේ කාර්යාල කාර්ය සහායකයා නිසා ඒ සහාය ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පරිවාස කාර්යාලය දුවන්නේ ඉතාම අමාරුවෙන්. මේ පරිවාස කාර්යාල 12 ටම කිසිම වාහනයක් නැහැ. අඩුම තරමින් ත්‍රීවිල් එකක්වත්. ගරු ඇමැතිතුමා කියයි කථා කරන කෙනත් හිටපු ඇමැතිවරයෙක්. ඇයි? ඒ කාලයේ කර ගත්තේ නැහැයි කියලා. ඒ කාලයට වැඩිය ප්‍රශ්න සංකීර්ණයි. මේ පරිවාස කාර්යාල එකකටවත්, අඩුම තරමින් හැම කාර්යාලයකටම ත්‍රීවිල් එකක්වත් ලබා දෙන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම තමයි අද හුඟක් කටයුතු කරන්නේ, තාක්ෂණය පාවිච්චි කරලා. ලැප්ටොප් එකක් අඩුම ගණනේ මූලස්ථාන පරිවාස

කාර්යාලයට දෙන්න. මේ දරුවන් ගැන තොරතුරු තියාගන්න. සබරගමු පළාතේ, වයඹ පළාතේ මේක දීලා තිබෙනවා. මේක කරන්න කියන ඉල්ලීම කරනවා. Multi –Media Projector එකක් නැහැ.යම් දේශනා ක්‍රියාත්මක කරවන්නස්ක්‍රීන් එකක් නැහැ..ඒ නිසා පරිවාස කාර්යාලවල තිබෙන අඩුපාඩු ළමයින් වෙනුවෙන් හැදුවොත් ඒ අයට කටයුතු කරන්න විශේෂ සහනයක් හම්බ වෙනවා. රුපියල් 2500/- ක ගමන් දීමනාවක් තමයි තවමත් ගෙවන්නේ. මේක කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දරුවන්ගේ කටයුතු වෙනුවෙන් අවිස්සාවෙල්ල පරිවාස කාර්යාලය නඩු 324 කට දායකත්වය දීලා තිබෙනවා. පරිලෝචන වාර්තා156 කින් පරිලෝචන නියෝග අරගෙන තිබෙනවා. දරුවන් නිවාස ගත කරනවා වෙනුවට, දරුවන්ව සමාජය තුළ තියාගෙන, පවුල් පරිසරය තුළ තියාගෙන බලාගන්නඋසාවියෙන් අවසර ගන්න නියෝගය තමයි, පරිලෝචන නියෝග කියන්නේ. ඒ නියෝග ගන්න156 කට අවිස්සාවෙල්ල පරිවාස කාර්යාලය දායක්තවය දීලා තිබෙනවා. කුල වැද්දීම් 18 ක් කරලා තිබෙනවා. දරුවන් නීත්‍යානුකුල භාරකරුවෙකුට දීලා ජීවිතාන්තය දක්වා රැක බලා ගැනීමේ අයිතිය දෙන එක තමයි කුල වැද්දීම් පනත හරහා කරන්නේ. මේ ගෙවෙන අවුරුද්දේ එහෙම කුල වැද්දීම් 16 ක් කරලා තිබෙනවා. මේවාට අසීමිතව පරිවාස නිලධාරීන් ඇවිද ඇවිද මහන්සි වෙනවා. ඒ නිසා ඒ තත්ත්වය ඇති කරන්න ඔවුන්ට පහසුකම් සලසන්න ඕනෑ. ඒ නිසා ළමයින් වෙනුවෙන් කටයුතු කරන්න නම් මීට වඩා පරිවාස කාර්යාලත් නිලධාරීනුත් ශක්තිමත් කරමින්, දැනුවත් කරමින් කටයුතු කරන්න ඕනෑ. මේ එළැඹෙන අවුරුද්දේ ඒ සඳහා මැදිහත් වෙන්නය කියන ඉල්ලීම ගරු ඇමැතිතුමාගෙන්මේ වෙලාවේ කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.09.26]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හදිසියේ වුණත්,විනාඩි 05 කින් යම්කිසි පණිවුඩයක් දෙන්නයි මා අදහස් කරන්නේ. දැන් අපේ සුමිත්ලාල් මැන්දිස් සෞඛ්‍යගරුඅමාත්‍යතුමාගේ අයවැය විවාදය සඳහා ඉදිරිපත් කරලා තිබෙන මේ පොත දිහා බැලුවාම, හුඟක්ම කළුතර දිස්ත්‍රික්කයකට තමයි වැඩ වෙලා තිබෙන්නේ. කළුතර දිස්ත්‍රික්කයේ තමයි හුඟක් ව්‍යාපෘති පටන් අරගෙන තිබෙන්නේ. කරලා තිබෙන්නේ. ඉතින් මම මේ පිළිබඳව පොඩි ගවේෂණයක යෙදුණා. බැලුවාම ඒකේ වරදක් නැහැ. ප්‍රසන්න රණතුංග ගරු ඇමැතිතුමාට පස්සේ සෞඛ්‍ය ඇමැතිවරු ඔක්කෝම කළුතරින් තමයි බිහි වෙලා තිබෙන්නේ. ජගත් අංගගේ හිටපු සෞඛ්‍ය ඇමැතිතුමා, එතුමාට කර ගත්තා. ඊට පසුව රංජිත් සෝමවංශ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා ආවා. එතුමාට කර ගත්තා. ඊට පසුව දැන් අපේ කල්‍යාණ මිත්‍ර සුමිත් ලාල් මැන්දිස් මැතිතුමා ඇවිල්ලා ඉන්නවා. එයාටත් කර ගන්න ගමන් මම ඉල්ලා සිටින්නේ, අපටත් කරලා දෙන්නය කියලා. මධ්‍යම රජයෙත් සෞඛ්‍ය ඇමැති කළුතර. ඉතින් බලපුවාම කළුතර, කළුතර, කළුතර. ඉතින් ඔබතුමාගේ මාර්ගයෙන් සුමිත්ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම කරන්න එපා. කොළඹත් තිබෙනවා. ගම්පහත් තිබෙනවා. මම ගම්පහ වෙනුවෙනුත් කථා කරන්නම්. ඒ කටයුත්තේදී සුවිශේෂී කාර්යභාරයක් කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇත්තටම ගුණාත්මක වර්ධනයක් තිබෙනවා. ඒක මම නැහැයි කියන්නේ නැහැ. ඒකට මැදිහත් වෙලා තිබෙනවා, අමාත්‍යාංශයේ ලේකම්තුමිය. ඒ වාගේම අධ්‍යක්ෂවරු. ඒ වාගේ සියලූ දෙනාගේම මැදිහත්වීම තුළ අනික් සේවයන්ට සාපේක්ෂව අපි සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවයක් තිබෙනවා කියන කාරණාව කියන්න ඕනෑ. මොකද, හුඟක් වෙලාවට අඩුපාඩු කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෝහල් කමිටු කියලාසම්ප්‍රදායනුකූලව සංවිධානයක් බිහි වෙනවා. රෝහල් කමිටු බිහි වන්නේ කොහොමද? සෞඛ්‍ය ගරු ඇමැතිතුමා අපට වාර්ෂිකව ලිපියක් එවනවා. ඔබගේ ප්‍රදේශයෙන් රෝහල් කමිටුව සඳහා සුදුසු තුන් දෙනෙකුගේ නම් එවන්නයකියලා. අපිත් අරිනවා. හැබැයි, මේ රෝහල් කමිටුවල කාර්යභාරය ඒ අයගෙන් වෙන්නේ නැහැ. ඒ නිසා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ රෝහල් කමිටු පත් කළාට පස්සේ ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳව ඔවුන්ව දැනුවත් කරන්න ඕනෑ. කොහාට හරි එන්න කියලා දිස්ත්‍රික්ක තුනේම වෙන්න පුළුවන්. වෙන වෙනම දිස්ත්‍රික්ක වෙන්න පුළුවන්. මේ රෝහල් කමිටු සාමාජිකයන් ගෙන්නලා ඔබේ කාර්ය භාරය කුමක්ද කියන එක ඔවුන්ට ප්‍රකාශ කරන්න ඕනෑ. දැන් හුඟක් වෙලාවට රෝහල්

[ගරු හෙක්ටර් බෙත්මගේ]

කමිටුවට පත් වෙන්නේ කවුද? නම්බුව උදෙසා. ඒ පළාතේ නිකන් පොරක් වෙන්න බලන කෙනා කියනවා, අනේ! මගේ නම රෝහල් කමිටුවට දාන්න කියලා. හැබැයි, රෝහල පළාතෙවත් යන්නේ නැහැ. ඒ නිසා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ රෝහල් කමිටුවල සිටින අයව දැනුවත් කරලා, ඒ සඳහා යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නය කියලා.

මා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන්ම එතුමාගේ අමාත්‍යාංශයේ සමාජසේවා හා සුභසාධන දෙපාර්තමේන්තුව ගැන වචනයක් කියන්න ඕනෑ. ඉතාමත්ම ප්‍රශස්ත මට්ටමේ තිබෙනවා. මම ගිය සැරෙත් ප්‍රශංසා මුඛයෙන් කථා කළා. විශේෂයෙන්ම වර්තමානයේ ඉන්න ලේකම්තුමිය ඒ වාගේම සමාජ සුභසාධන දෙපාර්තමේන්තුවේ ඉන්න අධ්‍යක්ෂතුමිය අපට ඉතා හොඳින් ඇහුම්කන් දීලා හොඳට කටයුතු කරනවා. මම මේ අයවැය විවාද සියල්ලටම සහභාගි වුණා. දකින හොඳ දර්ශනයක් තමයි අපේ ප්‍රධාන ලේකම්තුමා, මහේෂ් ගරු මන්ත්‍රීතුමා නේද? හැම වැය ශීර්ෂයකම ඉන්නවා. ඉතින් මේක හොඳ ලක්ෂණයක්. මම හිතන්නේ වැය ශීර්ෂ හැම එකකම අධ්‍යාපනය වෙන්න පුළුවන්. මහා මාර්ග වෙන්න පුළුවන්. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වෙන්න පුළුවන්. ඒ හැම වැය ශීර්ෂයකම කථා බහ, මේ සමාලෝචනය එතුමාගේ දෙසවන් තුළට ඇතුල් වෙලා තිබෙනවා කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් සෞඛ්‍ය ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ප්‍රධාන ලේකම්තුමා ප්‍රධාන කරගෙන, ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ඇහෙන්නයි මම කියන්නේ. එතුමා ප්‍රධාන කරගෙන ඒ වර්ෂවල මුදල් බෙදන කොට ඊට ගැලපෙන ආකාරයෙන් මුදල් බෙදීමක් වෙන්න ඕනෑ. අපි හැමදාම කෘෂිකර්ම අමාත්‍යාංශයට සල්ලි මදියි කියලා කෑ ගහනවා. සෞඛ්‍යඅමාත්‍යාංශයට සල්ලි මදියි කියලා කෑ ගහනවා. හැබැයි, බෙදන තැනින් ඒක හරියට බෙදා ගන්න කටයුතු කිරීම තමයි වැදගත් වන්නේ. ඉතින් මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන් අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සුමිත්ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමාට ලබන වර්ෂයේ ඉතාම සෞඛ්‍ය සම්පන්න නිරෝගී හොඳ මනසක් එක්ක සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කරන්න ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මගේ විනාඩි පහේ කථාව අවසන් කරනවා.

[පූ.භා.09.31]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෙසේ වෙතත් මට හදිසියේ වාගේ මේ විනාඩි පහ ලැබුණේ. ඒ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡාවේදී විශේෂයෙන්ම මම හිතන්නේ ගරු අමාත්‍යතුමා යටතේ පවතින ඒ අමාත්‍යාංශ කිහිපය යටතේදීම මම හිතන්නේ වටිනා, අප කාගේත් අවධානයට යොමු වන අමාත්‍යාංශය තමයි බස්නාහිර පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය. අපි සාමාන්‍යයෙන් අධ්‍යාපනයට පසුව වැඩියෙන්ම අවධානයක් යොමු කරන විෂයය ක්ෂේත්‍රය බවට සෞඛ්‍ය ක්ෂේත්‍රය පත් වෙනවා. විශේෂයෙන් ඒ අතරිනුත් කායික රෝග විනිශ්චයට සහ ප්‍රතිකාර කිරීමට මම හිතන්නේ,සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂ අවධානයක් යොමු වෙනවා. ඒ පිළිබඳව වැඩිපුර ප්‍රතිපාදන වෙන් වන්නේ ඒ සම්බන්ධවයි. නමුත් අද අපි පිළිගතයුතු යථාර්ථය තමයි කායික රෝග විනිශ්චය සහ ප්‍රතිකාර කිරීමටත් වඩා එහා ගිය අවශ්‍යතාවයන් තිබෙන බව. ඒ මානසික රෝග විනිශ්චය සහ ප්‍රතිකාර කිරීමට. අද ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක්, විශේෂයෙන් සෑම පස් දෙනෙකුට, හය දෙනෙකුට එක්කෙනෙක් මානසික ආතතියකින් හෝ මානසික ආබාධයකින් පෙළෙනවයි කියන එක අද නෙයෙකුත් සමීක්ෂණ වාර්තාවලින් එළි දැක්වෙන මොහොතක්. ඉතින් එසේ නම් මේ සඳහා අපගේ අවධානය විශේෂයෙන්ම යොමු විය යුතුයි. අපි දන්නවා. සංවර්ධිත රටවල්වලදී මානසික සෞඛ්‍ය වඩාත් යහපත් තත්ත්වයක පවත්වාගෙන යන්නට රටේ පුරවැසියන්දක්වන සුවිශේෂී මෙහෙවර. නමුත් අපේ රටේ ඒ අතින් අවාසනාවන්ත තත්ත්වයක් තිබෙනවා කියන එක අපි පිළිගන්නවා. මානසික සෞඛ්‍යයෙන් අයහපත් කෙනෙක් උදෙසා අද සමාජ වාතාවරණයක්, වට පිටාවක්, අප රටේ සංස්කෘතියක් ගොඩනැගිලා නැහැ, ඔහුට රෝහලට ගිහිල්ලා, එහෙම නැත්නම් වෛද්‍යවරයා හමු වෙලා ඒ තමන්ගේ තත්ත්වය පැහැදිලි කරලා අවශ්‍ය ප්‍රතිකාර ලබා

ගැනීමට. තවමත් අපේ රටේ යම්කිසි සුළු මානසික තත්ත්වයක පෙළෙන පුද්ගලයෙකුට තවමත් තිබෙන පිළිගැනීම අපේ සමාජයේ යම්කිසි ආකාරයක සෘණාත්මකව පවතින නිසා තමයි ඒ තත්ත්වය අද උදා වෙලා තිබෙන්නේ. එහෙමනම් එම තත්ත්වය මඟහරින්නට පුළුවන් වැඩමුළු, ඒ වාගේම සමාජයේ දැනුවත් කිරීම් පිළිබඳව මීට වඩා බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මේ වෙනුවෙන් වැඩ සටහනක් ආරම්භ කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. ඒ සමඟම බස්නාහිර පළාතේ පවත්නා මූලික රෝහල්වල තිබෙන්නා වූ අඩුපාඩු එකින් එක යම්කිසි සැලැස්මක් ඇතිව- විශේෂයෙන්ම පසුගිය වසර කිහිපය තුළදී සැලැස්මක් ඇතිව වැඩ කටයුතු කළා. යම්කිසි සාධණීය සහ වඩාත් ධනාත්මක වර්ධනයක් මේ අමාත්‍යාංශය තුළඅපි දකිනවා. ඒ වාගේම 2017 අයවැයට ඉදිරිපත් කරලා තිබෙන ප්‍රකාශනයේ පසුගිය කාලය තුළදී ගරු අමාත්‍යවරු -විශේෂයෙන්ම රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා ඉන්න කොට, ඒ වාගේම වර්තමාන අමාත්‍ය සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමා ඉන්න කොට සිදු කළ නොයෙකුත් ව්‍යාපෘති මේ ප්‍රකාශනයේ දක්නට ලැබෙනවා. අපි ඒවා පිළිගන්නවා. නමුත් ඉන් එහාට ගිහිල්ලා මේ අමාත්‍යාංශය -විශේෂයෙන්ම රෝහල්වල තිබෙන භෞතික සම්පත් දියුණු කරලීමට අවශ්‍ය ප්‍රතිපාදන මීට වඩා යම්කිසි සැලැස්මක් ඇතිව ඉටු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම මට ලැබුණු මේ කෙටි කාලය තුළදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කර සිටිනවා. පාදුක්ක ළමා හා මාතෘ නිවාසය පාදුක්ක රෝහලේ ස්ථානගත කරන්න උත්සාහයක යෙදුණා. ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වසර දෙකක් පුරාවටම යොමු කළා. නමුත් ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ නැහැ. අවසානයේදී තීන්දු තීරණ ගත්තා,දැනට පවතින ළමා හා මාතෘ සායනය පවතින ඒ ඉඩම, බස්නාහිර පළාත් අමාත්‍යාංශයට පවරාගෙන, ඒ පවතින ස්ථානය පළාත් සභාවට පවරාගෙන ඒ ගොඩනැගිලි වැඩි දියුණු කරනවා කියලා. ඒ පිළිබඳව මම පෞද්ගලිකව මැදිහත් වෙලා ඉල්ලීම් කළා. අප ප්‍රදේශයේ අවිස්සාවෙල්ල ආසනය නියෝජනය කරන මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමාසහ මමත් ඇතුළුව ඒ පිළිබඳව අපි නිර්දේශයක් ලබා දුන්නා, පවතින ඉඩම බස්නාහිර පළාත් සභාවට පවරාගෙන එම ඉඩම තුළ මෙම ගොඩනැගිල්ල අලුතෙන් ඉදි කරන්නය කියලා. අපට මේ ඉඩම පවරා ගත්තොත් අයෝජකයෙක් -විශේෂයෙන්ම ආයෝජකයෙක් කියලා මම අදහස් කළේ. පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන් සිටිනවා, මාතෘ සායන ගොඩනැගිල්ල තමන්ගේ වියදමින්, පෞද්ගලික අංශයේ දායකත්වයෙන් ඉදි කර දෙන්නට කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කැස්බෑව නගර සභාවේ සභාපතිවරයා වශයෙන් සිටින කොට මම මගේ කාලය තුළදී කැස්බෑව නගර සභා බල ප්‍රදේශය තුළ රජයෙන් ශත පහක වියදමක් දරන්නේ නැතිව, පළාත් පාලන ආයතනයෙන්, නගර සභාවෙන් ශත පහක වියදමක් දරන්නේ නැතිව දෙමහල් අංගසම්පූර්ණ මාතෘ නිවාස දෙකක් පෞද්ගලික අංශයට කියලා ඉදි කරවා ගත්තා. ඒ කටයුත්ත කරගන්න පුළුවන්. මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ මාතෘ හා ළමා ගොඩනැගිල්ල පවතින ඒ ඉඩම පළාත් සභාවට පවරාගෙන ඒ කටයුතු විධිමත්ව කරන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේදී කරනවා. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු ඒ කාර්ය මණ්ඩලය මේ කරගෙන ගිය වැඩ කටයුතු වඩාත් ශක්තිමත්ව ඊළඟ වසරේත් කරගෙන යෑමට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

[පූ.භා.09.36]

**ගරු රංජිත් සෝමවංශ**(සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)

Hon. Ranjith Somawansha(Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා,හිටපු සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට. වර්තමාන සෞඛ්‍ය ඇමැතිතුමාත් ඉතාම හොඳින් කැපවීමෙන් දක්ෂව මගේ සහෝදරයෙක් හැටියට වැඩ කටයුතු කරගෙන යනවා. කළුතරින් තමයි සෞඛ්‍ය ඇමැතිවරු සියලු දෙනා බිහි වුණේ. ඒක දෛවපෝගත සිදුවීමක් සහ ඒ ග්‍රාමීය ප්‍රදේශවලට,පසුගාමී ප්‍රදේශවලට සිදුවුණු සාධාරණත්වයක් කියලා මම විශ්වාස කරනවා. ඉතින් මම අහගෙන හිටියා, රොයිස් විජිත ප්‍රනාන්දු අපේ ගරු මන්ත්‍රීතුමා මීගමුව රෝහල ගැන කථා කරනවා. මම එතුමාට ස්තූතිවන්ත වෙනවා. එතුමා කලිනුත් මීගමුව රෝහලට විශාල කැපවීමක් කළා. ඒ වේලාවේ බරපතළ විධියේ පීඩනයකට මම නතු වුණා. මම මතක් කරන්න ඕනෑ. ඔය රෝහල හදන්න අපට මධ්‍යම

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

රජයේ ගරු රාජිත සේනාරත්න ඇමැතිතුමා හුඟක් උදව් කළා. ඒ අභියෝග තුළ, ඒ අභියෝගය මම භාර ගත්තා. මීගමුව දිස්ත්‍රික් මහ රෝහල මිලියන 200 ක වියදමින් අපි ගොඩනැගිලි හතරක් හැදුවා. ඒවා තනිකර යකඩවලින් නිමා කරපු රෝහල්. හැබැයි, අපි අර පුපුරා ගිය ගොඩනැගිල්ල අහක දැම්මේ නැහැ. ඒ සඳහා මිලියන 300 ක් මධ්‍යම රජයේ රාජිත සේනාරත්න ගරු සෞඛ්‍ය ඇමැතිතුමා වෙන් කරන්න තීරණය කළා. මම ගරු අමැතිතුමාගෙන් ඇහුවා. දැන් අප්‍රේල් මාසයේ මේ වැඩ කොටස භාර දෙනවා. ඉතින් ඔබතුමාට ස්තූතිවන්ත වෙන්නේ -මම දන්නවා. ඒ කාලයේ ඒ පැත්තේ ජනතාවත් එක්ක ඔබතුමන්ලා පෙළ ගැහුණා. මම මේ පැත්තේ මුහුණ දුන්නා. හැබැයි, වැඩ කටයුතු කරගෙන ගියා.

හැබැයි, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, වැඩියෙන්ම සලකලා තිබෙන්නේ කළුතරට කියලා. ඇත්ත. කළුතර සැලකුවේ තනියෙන් නොවෙයි. මම කළුතරින් ආවා වාගේම මෙතුමා කළුතරින් ඇවිල්ලා ඉන්නවා. ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා කළුතරින් ඇවිල්ලා ඉන්නවා. අපි හදපු ප්‍රමාණය, මුල්ගල් තිහක්. ඔබතුමා නියෝජනය කරන හොරණ පවා අති දැවැන්ත සංවර්ධනයකට අපි කටයුතු කරනවා. හොරණ තිබෙනවා. පිඹුර තිබෙනවා. බදුරලිය තිබෙනවා. මතුගම තිබෙනවා. කටුගහහේන තිබෙනවා. මීගහතැන්න, බුලත්සිංහල, හාල්තොට,යට්ටපාත,බණ්ඩාරගම තිබෙනවා. මේ බණ්ඩාරගම අක්ෂි රෝහලක් හැටියට අපි සංවර්ධනය කරනවා. ඈත දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශයක් මගේ ආසනය වන යට්ටපාත. අලුතෙන්ම රෝහලක් හදනවා. මේ ලොකු රෝහලක් නොවෙයි. ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය කාරණාව තමයි හදිසි ප්‍රතිකාර ඒකක - මොකද රෑට හදිසියක් වුණොත්, සතෙක් සර්පයෙක් කැවොත්, එහෙම නැත්නම් හෘදය රෝග, එහෙම නැත්නම් ප්‍රසූත අවස්ථාවක් ආවොත් ඒ ග්‍රාමීය ප්‍රදේශවල මේ පහසුකම් තිබෙන්න ඕනෑ. ඒ නිසා අපි හදිසි ප්‍රතිකාර ඒකක කළුතර දිස්ත්‍රික්කයේ සෑම තැනම හදන්න ඉන්නේ. විශාල මුදලක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලෙඩ්ඩු ගෙනි යන්න ඇම්බියුලන්ස්?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඇම්බියුලන්ස් අපි දුන්නා. වර්තමාන ජනාධිපතිතුමා සෞඛ්‍ය ඇමැති වෙලා ඉන්න කාලයේ මට ඇම්බියුලන්ස් රථ විශාල ප්‍රමාණයක් දුන්නා. ඊට කලින් මම සාමාන්‍යමන්ත්‍රීවරයෙක් හැටියටත් - මේ රජයෙනුත් අපට ඇම්බියුලනස් 23 ක් දුන්නා. අපි ඒක කළුතර කච්චේරියේදී භාර දුන්නා. මම හිටියා.අපේ වර්තමාන සෞඛ්‍යඇමැතිවරයා සිටියා. හැබැයි, ඒකට ප්‍රශ්නයක් තිබෙනවා. ජනතාවගේ පැත්තෙන් දැනුවත් වෙලා මදී. මේක කියන්න ඕනෑ. ගරු ඇමැතිතුමාට අපි කියන්න ඕනෑ, ඒක පිළිබඳව දැනුවත් කරන්න ඕනෑ. ජනතාව දන්නේ නැහැ. මේක නතර කරන්නේ පොලීසියෙන්. ඒ නිසාවෙන් අදත් මම ඉතාම කෙටියෙන් වුණත් කියන්න ඕනෑ. වෙලාව පිළිබඳව සලකලා කියන්නේ. දැන් මම අධ්‍යාපන ඇමැතිවරයා හැටියට අධ්‍යාපනයයි සෞඛ්‍යයි ගහට පොත්ත වාගේ යන්නේ. විශේෂයෙන්ම අපේ පාසල් දරුවන් 50% කට දන්ත රෝග තිබෙනවා. මම අපේ ගරු ඇමැතිතුමාත් එක්ක එකඟයි,පාසල් දරුවන්ගේ දන්ත මුඛ සෞඛ්‍යය සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළකට යන්න. ඒ වාගේම 19% ක් දරුවන් ලංකාවේ අද විවිධ රෝගවලින් පෙළෙනවා. නිවැරැදි ආහාර රටාවන්, නිවැරැදි සෞඛ්‍ය හුරුපුරුදු, එතකොට වස විස නැති ආහාර රටාවන්, අපේ පාසල්වල ආපන ශාලා පරීක්ෂා කිරීම් මේ තැන් තැන්වල තිබෙන අපද්‍රව්‍යසම්බන්ධව, ජලය සම්බන්ධව නිවැරැදි තැනකට අපට යන්න වෙනවා.

ඒ වාගේම මට තව එක දෙයක් කියන්න වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කාලයේ අපට ඕනෑකමක් තිබුණා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ඉංගිරිය රෝහල. සාමාන්‍යයෙන් ඒකේ දැනටත් සේවක කාර්ය මණ්ඩලය 64 ක් විතර ඉන්නවා. මගේ මතකය. එතකොට නේවාසික රෝගීන් පස් දෙනෙකුට වඩා නැහැ. ඒකේ හොඳ වෛද්‍යවරු ඉන්නවා. සේවකයන් ඉන්නවා. ඇම්බියුලනස් රථ තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කාලයේඅපි තීන්දු කළා. ඒක ගරු ඇමැතිතුමාගේ මනසෙත් පිළිසිඳගෙන තිබෙනවා. ඒක සතුටුයි. ඒතමයි සෞන්දර්යාත්මක නේවාසික විවේකාශ්‍රමයක් බැගින් හදන්න. ඒ කියන්නේ විශ්‍රාම ගිය රජයේ සේවකයන්. විශ්‍රාම යන කොට හුඟක් අයට විවිධ රෝග තිබෙනවා. එතකොට මේ අයට විශ්‍රාම වැටුපක් ලැබෙනවා. මේ වැටුපත් එක්ක රෝහලේ නතර වෙලා තමන්ට වෛද්‍යවරු දෙන බෙහෙත් ටික බිබී රෝහල සෞන්දර්යාත්මක, එහෙම නැත්නම් පාරිසරික ගුණාංගවලින් අනූන හොඳ

සමාජවටපිටාවකින් ඒ රෝහලේ ගත කරන්න පුළුවන්. තමන්ට අවශ්‍ය දේ දවල්ට රෑට උයා පිහාගෙන කාලා හොඳ රසවින්දනාත්මක වැඩ සටහන්වලට සම්බන්ධ වෙන්න. මේවා අපි පිළිගන්නවා.

ඒ නිසා මම මීට වැඩිය අද කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම එක දෙයක් කියන්න ඕනෑ. ආයුර්වේදය පැත්තෙන් තව විශාල වැඩ කොටසක් කරන්න වෙනවා. මමඉන්න කාලයේ හොඳ වැඩ කොටසක් කළා. මම ඒක සන්තෝෂයෙන් කියන්නේ. මීගමුවෙන් පටන් ගත්තාම වතුපිටිවලින්, කිරිබත්ගොඩින් අවිස්සාවෙල්ලෙන් අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දන්නවා. සුමිත් විජයමුණිද සොයිසා ගරු මන්ත්‍රීතුමා දන්නවා. අවිස්සාවෙල්ලෙ ගියා. අපි පාදුක්කේ ගියා. අපි හෝමගම පවා - මෙතැන අපේ ගරු ඇමැතිතුමා නැහැ. අපි කසළ සම්බන්ධයෙන්, ජලයසම්බන්ධයෙන් තීන්දු ගත්තා. ඒ නිසා මම කියන්නේ, අපට ලොකු වැඩ කොටසක් ඉස්සරහාදී ආයුර්වේදය පැත්තෙන් කරන්න තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන් NCD බෝ නොවන රෝග සම්බන්ධයෙන් බරපතළ ගැටලුවක් දරුවන්ට තිබෙනවා. මේ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අද දරුවන්ගෙන් තමයි මේ සියලු ගනුදෙනු කරන්න හදන්නේ. ඒ නිසා පන්ති කාමරයේ දරුවන්ට වෙනදා තිබුණේ බෝවන රෝග. ඒ කියන්නේ පෙරුම්කායන් බැඳුපු කාලයේ. අතේ පෙරුම්කායන් බැන්දා. අද තිබෙන්නේ බෝවන රෝග නොවෙයි. බෝ නොවන රෝග වැඩි වැඩියෙන් දරුවන්ට හැදෙනවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය, විවිධබලපෑම්,විවිධඅපචාරදරුවන්ගේ පන්ති කාමරයට එනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ගරු ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා ඉතා හොඳින් වැඩ කටයුතු කරගෙන යනවා. අපි කරගෙන ආපු දේ එතුමාට තව ඉස්සරහාට කරගෙන යන්න අපි ශක්තිය ධෛර්ය දෙනවා. විශේෂයෙන් මීගමුව රෝහල ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හිතන තැනට ගෙනෙන්න අපේ සහයෝගය නිරතුරුව ලැබෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.09.44]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමැතිතුමනි මට වෙලාව වෙන් කර දීම ගැන ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මට විශේෂ යෝජනාවක් විතරයි කරන්න තිබෙන්නේ. සෞඛ්‍ය ගැන කථා කළොත් ඒක විශාල මාතෘකාවක්. නමුත් මගේ යෝජනාවක් තිබෙනවා. අද බටහිර ලෝකයේ කථා කරනවා. සෞඛ්‍ය ගැන කථා කළොත් කායික සෞඛ්‍ය, මානසික සෞඛ්‍ය, සමාජයීය සෞඛ්‍ය, ආධ්‍යාත්මික සෞඛ්‍ය ගැන තමයි අද බටහිර ලෝකයේ පිළිඅරගෙන තිබෙන්නේ. අද ඇමරිකාව ගත්තොත් වසරකට මිලියන දෙකක් වාගේ ප්‍රමාණයක් භාවනා කරනවා. ඒ තත්ත්වයට අද ලෝකය ගිහිල්ලා තිබෙනවා. නමුත් අපේ බුදුරජාණන් වහන්සේ මීට වසර 2500 කට උඩ දී තමයි කිව්වේ, කායික සෞඛ්‍ය - ආරෝග්‍යාපරමා ලාභා. මානසික සෞඛ්‍ය, සතුට පරම ලාභය. සමාජයීය සෞඛ්‍යය විශ්වාසය පරම ලාභය. ආධ්‍යාත්මක සෞඛ්‍යය නිවන පරම ලාභය කියන එක. මේ හතර මුල් කරගෙන එදා බුදුරජාණන් වහන්සේ අපේ සෞඛ්‍ය ගැන කථා කළා. අද කායික සෞඛ්‍ය කිව්වාම ආහාර රටාව ව්‍යායාම ගැන කථා කළොත් අපේ බුදුහාමුදුරුවන් ආරෝග්‍ය පරමාලාභා යනුවෙන් අපට කියලා දුන්නා. ඒ වාගේම සතුට පරම ලාභය කියන්නේ ලැබෙන දෙයින් සතුටු වීමයි. අද අපේ මානසික පීඩනය වැඩි වෙලා තිබෙන්නේ මේ ආතතිය වාගේ ලෙඩ රෝග අපට හැදෙන්නේ මේ නිසා. ඒ වාගේම සමාජයීය සෞඛ්‍ය. අද විශ්වාසය නැති වෙලා තිබෙනවා. බිරිඳට මහත්තයා විශ්වාස නැහැ. මහත්තයාට බිරිඳ විශ්වාස නැහැ. පවුලේ විශ්වාසය නැති වෙලා තිබෙනවා. මේක ආරක්ෂා කරනවා නම් අද අපට ඒඩ්ස් වාගේ - මේ මාස හය තුළ ඒඩ්ස් රෝගීන් හාරසිය හැට ගණනක් සොයාගෙන තිබෙනවා. ඒකෙන් වැඩිම ප්‍රමාණයක් බස්නාහිර පළාතේ. අද පවුල තුළ විශ්වාසය නැති වීම නිසා මෙවැනි රෝග තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා.

ඒ වාගේම ආධ්‍යාත්මික තත්ත්වය ගැන කථා කළොත් නිවන අරමුණු කරගෙන මිනිස්සු ජීවත් වෙනවා නම් ගොඩාක් දේවල් මිනිස්සුන්ට ලැබෙනවා. මේ අරමුණු හතර අද අපට නැති නිසයි අද අපි සෞඛ්‍යයක් නැති මිනිස්සු බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි සෞඛ්‍ය අමාත්‍යාංශයට යෝජනා කරනවා, අපේ සටන් පාඨය විය යුත්තේ මේක.

[ගරු නිරෝෂා අතුකෝරල]

මේක ඉස්සර කරගෙන අපි ඉස්සරහාට ගිහිල්ලා මිනිස්සුන්ගේසෞඛ්‍ය හදන්න ඕනෑ. මොකද, මොනතරම්

බිල්ඩින් හැදුවත්, මොනතරම් බෙහෙත්වලට යම් යම් දේවල් ලැබුණත් මිනිස්සුන්ව සතුටු කරන්න බැරි නම්, මිනිස්සුන්ගේ මානසික තත්ත්වය ගොඩනහන්න බැරි නම් සෞඛ්‍ය ගොඩනහන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා. මේ සෞඛ්‍ය නහා සිටුවන්න නම් මිනිස්සුන්ව මේ සතරින් ස්වයං පෝෂිත කරන්න. මොකද අද අපි වස කන්නේ. අද අපට ව්‍යායාමක් නැහැ. අද අපට මානසික ආතතිය තිබෙනවා. අපට ලැබෙන දෙයින් අපි සතුටු වෙන්නේ නැහැ. අපි මොනවාද සොයාගෙන යන්නේ. මෙන්න මේ දේවල්වලට යම් දෙයක් මිනිස්සුන්ට දෙන්න පුළුවන් නම් අන්න ඒක තමයි සෞඛ්‍ය කියලා කියන්නේ.

ගරු සෞඛ්‍ය ඇමැතිතුමනි, ඔබතුමා ආවට පස්සේ යම් වැඩ පිළිවෙළක් කරගෙන යනවා. විශාල වැඩ කොටසක් කරනවා. අද සෞඛ්‍ය ගැන කථා කළොත්, විශාල පැතිකඩ ප්‍රමාණයක් තිබෙනවා. දරුවන් ගැන. ඒ නිසා මේ තුළින් ගොඩක් දේවල්වලට විසඳුම් ලැබෙනවා, මෙන්න මේ හතර ඉලක්ක කරගෙන අපි වැඩ පිළිවෙළකට යනවා නම් මම හිතන්නේ, ඉතාමත්ම සාර්ථකත්වයක් සෞඛ්‍යයට ලබා ගන්න පුළුවන්. එම නිසා මට මේ අන්තිම මොහොතේ විනාඩි 05 ක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ගැන ගරු අමාත්‍යතුමා හිතන්න කියන එක ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. සියලුදෙනාටම ස්තුතියි.

[පූ.භා.09.50]

**ගරු සුමිත් ලාල් මැන්දිස්**(සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අද බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා වන වෙලාවේදී මේ සෞඛ්‍ය අමාත්‍ය ධූරය මට ලැබෙන කොට බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අවුරුදු 18 ක් බස්නාහිර පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ ඇමැතිවරුන්ගේ සුහදතාවය රැකගෙන කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් මට ලොකු සන්තෝෂයක් තිබෙනවා. ඒ වාගේම දේශපාලන වශයෙන් මම 1991 කළුතර නගර සභාවට ආවේ දේශපාලන ඝාතනයත් එක්ක. මට මේ වෙලාවේදී මතක් කරන්න සිද්ධ වෙනවා. කළුතර ආසනයේ හිටපු සංවිධායකවරු වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපලේකම් ඉන්ද්‍රපාල අබේවීර මැතිතුමා. මගේ සහෝදරයා සංවිධායක විජයලාල් මැන්දිස් මැතිතුමා. ඔවුන්ගේ අභාවයෙන් අවුරුදු දෙකකට පස්සේ කළුතර නගර සභාව නියෝජනය කරලා, දේශපාලනයට ඇවිල්ලා 1997 කළුතර නගර සභාවේ, ඔබත් හොරණ ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයට සුදුසුකම් ලබද්දී, මම කළුතර නගර සභාව එක්සත් ජාතික පක්ෂයෙන් අවුරුදු 35 කට පස්සේ දිනවලා දීලා, මට සභාපතිකම නොදී ඔබතුමාටත් සභාපතිකම නොදී, ඒ ප්‍රශ්න මධ්‍යයේ තමයි අපි දේශපාලන ඉතිහාසය සටහන් වන්නේ. නමුත් අපි පළාත් සභාවට ඇවිල්ලා මහජනයාගේ අවශ්‍යතාවයන් ඉෂ්ට සිද්ධ කරමින් යන මොහොතේ, මහජනයාගේ වැඩ කරගෙන යන මොහොතේ, පළාත් සභාවේ මේ අමාත්‍යධූරය මට ලබා දෙන්න අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා උනන්දු වුණා. එතුමාගැන මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට සැලකීමක් වශයෙන්, පක්ෂයේ මිය ගිය අයට සැලකීමක් වශයෙන් මට මේ අමාත්‍ය ධූරය ලබා දීම පිළිබඳව ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපි සියලුදෙනාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, අපේ ආණ්ඩු පක්ෂයේ හුඟදෙනෙක් මේ තනතුරු දරනවා. මන්ත්‍රීකම් දරනවා. විපක්ෂයේ ඉන්නවා. මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම මම හිතන්නේ දේශපාලනය මේකට ගාව ගන්න නරකයි. දේශපාලන භේදයෙන් තොරව සෞඛ්‍ය සේවය අපි බස්නාහිර පළාතේ ස්ථාපිත කරන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

ප්‍රධාන වශයෙන් අද අපට ඇති වෙලා තිබෙන ප්‍රධානම කරුණ, මම දකින විධියට මේ රටේ ඩෙංගු වසංගතය තුරන් කිරීමේ වැඩ පිළිවෙළ බස්නාහිර පළාතෙන් අපි ඉක්මණින් අවසන් කරන්න ඕනෑය කියන එකයි මගේ හැඟීම. මගේ සහෝදර හිටපු අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමා ඩෙංගු මර්දන ව්‍යාපාරය සඳහා ඒ අවශ්‍ය කරන බලකාය හදලා,ඒ වැඩ කටයුතු කරමින් යන මොහොතේ සමහර අඩුපාඩුකම් සිද්ධ වෙලා තිබෙන විත්තිය මම දන්නවා. මම පසු වෙලා ඇමැතිකම භාර ගත්තයි කියලා, මාස ගණනයි කියලා මම ඒවා අතහරින්න සූදානම් නැහැ. පසුගිය දේවල්.අපේ අර ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අමාත්‍යවරයෙක් වුණාම අපට ඒවා භාර ගන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේවා මම අධ්‍යයනය කරලා, මාස 10 ක් තුළ වැඩ පිළිවෙළවල් කිහිපයක් සකස් කරන්න මගේ නිලධාරීන් එක්ක සාකච්ඡා වට ගණනක් පවත්වලා

තිබෙනවා. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අදහස් විශාල ප්‍රමාණයක් මතු වුණා. යෝජනා විශාල ප්‍රමාණයක් කළා. අපේ මන්ත්‍රීවරු, එක්සත් ජාතික පක්ෂයේ හෝ වේවා. අනිකුත් පක්ෂයේ හෝ වේවා. අපේ පක්ෂයේ හෝ වේවා. මේ හැම දෙයක්ම හොඳ යෝජනා. මට දැනුණු දෙයක් තමයි අපේ පාසල් යන දරුවන්ගේ මානසික සෞඛ්‍යය නඟා සිටුවීමේ වැඩ පිළිවෙළ පිළිබඳව අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම යෝජනා කළ බව. ඇත්ත වශයෙන්ම මම බලාපොරොත්තු වෙනවා. පහ වසර ශිෂ්‍යත්වයට පෙර දරුවන්ගේ මානසික සෞඛ්‍යය අපි සොයා බලන්න ඕනෑ. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙන්න පෙර, උසස් පෙළ විභාගයට මුහුණ දෙන්න පෙර මානසික සෞඛ්‍යය අපි නිරාකරණය කරගන්න ඕනෑ. ඒ සඳහා අපි බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා වැඩ පිළිවෙළක් ඉදිරියේදී යොදන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම තමුන්නාන්සේලා දන්නවා, ඩෙංගු වසංගතය නැති කරන්න අපට අවශ්‍ය කරන වාහන පහසුකම් බොහොම අඩුයි. මම පත් වන කොට වාහන පහසුකම්බොහොම අඩුයි. නමුත් අපට කැබ් රථ ලබා දෙන්න, මධ්‍යම රජයෙන් මුදල් වෙන් කරනවා කියලා පසුගිය කාලයේ අපට දැනුම් දීලා තිබුණා. මධ්‍යම රජයෙන් කැබ් රථ 12 කුත්, ඒ වාගේම ඇම්බියුලන්ස් රථ 25 කුත් ලබා දෙන්න රාජිත ඇමැතිතුමා අපට පොරොන්දු වෙලා තිබෙනවා. ඒක මම හිතන්නේ,මේ අයවැයෙන් පස්සේ ලබා දෙයි. ඒවාත් උපයෝගී කරගෙන මේ ඩෙංගු වසංගතය අපි නැති කරන්න අවශ්‍ය කටයුතු කරන බව තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

ඒ වාගේම අපේ දේශීය වෛද්‍ය සේවය, ආයුර්වේද සේවය. තමුන්නාන්සේලා දන්නවා. දැන් මොල්ලිගොඩ ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථානය තිබෙනවා. ඒ වාගේම කිරිබත්ගොඩ ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථානය තිබෙනවා. මේ මධ්‍යස්ථාන දෙකෙන්ම ලොකු සේවාවක්, ලොකු ප්‍රයෝජනයක් ජනතාව ගන්නවා. නමුත් මම අමාත්‍ය ධූරයට පත් වන කොට, මොල්ලිගොඩ පංචකර්ම මධ්‍යස්ථානය හදලා අවුරුදු 02 ක් වහලා තිබුණේ. මේකේ යම් යම් පොඩි ගැටලු තිබුණේ. මම ඇවිල්ලා මාසයක් ඇතුළත ඒ පංචකර්ම මධ්‍යස්ථානය විවෘත කරලා අවශ්‍ය කටයුතු සංවිධානය කරලා දැන් කරගෙන යනවා. ඒක නිසා අපි මේ මාස 10 තුළ නිකන් හිටියේ නැහැ.

ඒ වාගේම අපට ප්‍රශ්න ගණනක් අපේ ගරු මන්ත්‍රීවරු ඉදිරිපත් කළා. ඒ වාගේම අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මට කිව්වා, මාළිගාවත්තේ මාතෘ සායනය පිළිබඳව. මම ඒ පිළිබඳව අවධානය යොමු කරන්න අවශ්‍ය කටයුතු සංවිධානය කරගෙන තිබෙනවා. ඒ වාගේම අපේ බස්නාහිර පළාත් සභාවට විශාල මුදලක් පසුගිය කාලයේ මධ්‍යම රජයෙන් ලැබිලා තිබෙනවා. මේ පොත බලලා කියැවුණා, කළුතරට තමයි මේ ඔක්කොම දාගෙන තිබෙන්නේ කියලා. නමුත් මේ කළුතරට දාගෙන තිබෙන්නේ බස්නාහිර පළාත් සභාවේ මුදල් නොවෙයි. මිලියන 450 ක්. මධ්‍යම රජයේ රාජිත සේනාරත්න ගරු ඇමැතිතුමා, එතුමා කළුතර ජීවත්වන නිසා, කළුතර ආසනයෙන් දේශපාලනය කරන නිසා එතුමා රුපියල් මිලියන450 ක් වෙන් කරලා ඒ අවශ්‍ය වැඩ කටයුතු කරගෙන යන මොහොතක් මේක. තවත් මුදල් ඉතුරු වෙලා තිබෙනවා. ඒක නිසා එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. කළුතර රෝහල් ටික සංවර්ධනය කරන්න අවශ්‍ය ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් අපට ලබා දීලා තිබෙනවා. එම නිසා මම ගරු මන්ත්‍රීවරුන්ට මේ අවස්ථාවේදී පොරොන්දු වෙනවා. කළුතර රොහල්වල ප්‍රශ්න ටික විසඳගන්න රාජිත සේනාරත්න ගරු ඇමැතිතුමා ඉන්න නිසා අපි බස්නාහිර පළාත් සභාවේ අපට වෙන් වෙලා තිබෙන මුදලින් 75% ක් විතර කොළඹටත්, ගම්පහටත් වෙන් කරන විත්තිය මම තමුන්නාන්සේලාට මේ වෙලාවේ සඳහන් කරනවා. මොකද, ඒක තමයි කෙරෙන්න ඕනෑ. අපට වැඩේ වෙනවා නම්, අනික් වැඩත් එහෙම වෙන්න ඕනෑ.ගුණසිරි ජයනාත් අපේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ මුදල් අපට පළාත් සභාව හරහා ලබා දෙන්නය කියලා. අපි ඒ ඉල්ලීමත් ගරු රාජිත සේනාරත්න මැතිතුමා හරහා කරන්න බලාපොරොත්තුවෙනවා.

ඒ වාගේම තමුන්නාන්සේලා දන්නවා, ඩෙංගු වසංගතය සඳහා අපට තිබෙන බලකාය බොහොම මදී. දෙසීයකට අඩු බලකායක් අපේ ජගත් අංගගේ හිටපු ගරු ඇමැතිතුමා හදලා තිබෙන්නේ. ඒ නිසා රාජිත සේනාරත්න ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටියා, මේ ඩෙංගු වසංගතය නිරාකරණය කරගන්න අපට බලකායක් හදාගන්න,700 ක් ලබා දෙන්නය කියලා. ඒක නිසා එතුමා කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් දාලා මට දැනුම් දීලා තිබෙනවා ඩෙංගු වසංගතය

[ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා]

නිරාකරණය කරන්න 500 ක හමුදාවක් තරුණයන්ගෙන් හදාගන්න. අවශ්‍ය ප්‍රතිපාදන මේ අයවැයෙන් පස්සේ අපට

ලබා දෙනවා කියලා. ඒකනිසා එය යොදාගෙන ඩෙංගු වසංගතය මෙහෙය වන්න ඕනෑ, ඒක නිරාකරණය කරගන්න. අපේ ජගත් අංගගේ ගරු ඇමැතිතුමාගෙන් මම උපදෙස් ගත්තා. එතුමා කියන්නෙත් මේ ඩෙංගු වසංගතය මෙහෙයවන්න ජනතාව දැනුවත් කරන වැඩ පිළිවෙළ තමයි අපි ඉදිරියට කරන්න ඕනෑ කියලා. ඒ නිසා අපට ලොකු සහයෝගයක් ජගත් අංගගේ හිටපු ගරු ඇමැතිතුමා ලබා දෙනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි. තමුන්නාන්සේලා දන්නවා,මුළු ලංකාවට වැඩිය මේ බස්නාහිර පළාතේ රෝහල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒක නිසා රෝහල්වල අඩුපාඩු සොයා බලන්න අමාත්‍යවරයෙක් වශයෙන් තමුන්නාන්සේලා දන්නවා,මම මාස 10 ක් පමණ මේ අමාත්‍ය ධූරය දරන කාලය තුළ දී මට යන්න පුළුවන් වුණේ රෝහල් 27 කට විතරයි. තවත් රෝහල් 100 කට වැඩි ප්‍රමාණයක් මට නිරීක්ෂණය කරන්න තිබෙනවා. ආයුර්වේද රෝහල් බලන්න තිබෙනවා. පරිවාස කාර්යාල බලන්න තිබෙනවා. සමාජ සේවා පැත්ත බලන්න තිබෙනවා. ඒක නිසා මම මේ අවස්ථාවේදී ගරු මහ ඇමැතිතුමාට යෝජනා කරනවා. අපි අධ්‍යාපන කාර්යාලය හරහා ව්‍යූහ කමිටු අපි සංවිධානය කරලා ව්‍යූහ කමිටු හරහා අධ්‍යාපන ප්‍රශ්න අපි විසඳ ගන්නවා. ඒක නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත් අවසරය ඇතිව අපි ඒ වාගේ වැඩ සටහනක් සියලුම ගරු මන්ත්‍රීවරුන් නියෝජනය වන විධියට ඒ සෞඛ්‍ය ක්ෂේත්‍රය නඟා සිටුවන්න වැඩ පිළිවෙළක් කලාප මට්ටමින් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම ඒ මන්ත්‍රීවරුන්ට නිකන් මේවාට ඩීසල් ගහගෙන යන්න විධියක් නැහැ. අපි දන්නවා ලැබෙන පඩිය කීය ද කියලා. ඒ නිසා මම ගරු මහ ඇමැතිතුමාට යෝජනා කරනවා, හැම මන්ත්‍රීවරයෙකුටම ලැබෙන පඩිය කීයද කියලා. ඒ නිසා මම ගරු මහ ඇමතිතුමාට යෝජනා කරනවා. ගරු මහ ඇමතිතුමනි, හැම මන්ත්‍රීවරයෙකුටම රුපියල් පන්දාහක දීමනාවක් දීලා, ඒ කමිටුවලට පත් කරන්නය කියලා මේ අවස්ථාවේදී මම ගරු මහ ඇමතිතුමාට යළිත් යෝජනා කරනවා.

**ගරු ගුණසිරි ජයනාත්-** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

මහ ඇමතිකමටත් සුදුසුයි.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්-** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

තමුන්නාන්සේලා කියනවා, දැන් මුදල් ලැබිලා තිබෙන්නේ, බොහොම අඩුවෙන් කියලා. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු ඇමතිතුමා, කථාව අවසන් කරන්න.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්-** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

අපි මුදල් සොයා ගැනීමේ වැඩ පිළිවෙළ ඉදිරියේදී ක්‍රියාත්මක කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒකට මූලිකත්වය ගෙන බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍යපමණක් නොවෙයි. අනිකුත් අමාත්‍යාංශවලටත් අවශ්‍යමුදල් සපයා ගන්න අපි, අමාත්‍ය මණ්ඩලය එකතු වෙලා වැඩ කරනවාය කියන එකත් මේ අවස්ථාවේදී අපි කියන්න ඕනෑ. මේ අවස්ථාවේදී කාලය සීමිත නිසා මට මේ වැඩ කටයුතු කර ගෙන යන්න අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, අනෙකුත් අමාත්‍යවරු, ඒ වාගේම අපේ නිලධාරීන්, ලේකම්තුමිය ඇතුළු ඒ සියලුම ආයතනවල නිලධාරීන් මම ඉන්න කාලය ඇතුළත කැපවීමෙන් වැඩ කළා. ඉස්සරත් වැඩ කරලා තිබෙනවා. එතුමන්ලාටත් මම ස්තූතිවන්ත වෙනවා.

ඒ වාගේම කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාටත් ස්තූතිවන්ත වෙමින්, සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා මට සහයෝගය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ඊට අනුකූලව ඇ.භා. 09.59 ට, ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***

*Accordingly discussion on the Expenditure Head Nos 105, 113, 114, 115 and 116 Was concluded at 09.59 a.m..*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශීර්ෂ අංක 105, 113, 114, 115, 116 වැය ශීර්ෂයන් පිළිබඳව විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ එකඟතාවය විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**

Hon. Members

එකඟයි.

***ඊට අනුකූලව,***

***ශීර්ෂ අංක 105 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 105 was proposed and adopted.*

***ශීර්ෂ අංක 113 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 113 was proposed and adopted.*

***ශීර්ෂ අංක 114 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 114 was proposed and adopted.*

***ශීර්ෂ අංක 115 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 115 was proposed and adopted.*

***ශීර්ෂ අංක 116 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 116 was proposed and adopted.*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහා පැත්තේ කළු පටි බැඳගෙන සිටින ගරු මන්ත්‍රීවරුන්ට මම මේ වෙලාවේ පොඩි යෝජනාවක් කරන්න කැමැතියි. අනික් අතෙත් කළු පටියක් බැඳ ගන්නය කියලා මම යෝජනා කරනවා. පසුගිය කාලයේ ලසන්ත වික්‍රමතුංග ඇතුළු මාධ්‍යවේදීන් ගණනාවක් ඝාතනය කළ - (බාධා කිරීම්) කළු පටියක් බැඳ ගන්නය කියලා ඉල්ලා සිටිනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මීළඟට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# 2017 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය

## THE APPROPRIATION STATUTE RELATING TO THE FINANCIAL STATEMENT - 2017

**ගරු ඉසුර දේවප්‍රිය-** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"2017 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කරන ලද මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතු ය."* යන යෝජනාව මම යළිත් ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed again*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධ සාකච්ඡාව ආරම්භ වෙනවා. මෙම සාකච්ඡාව පොදු වැදගත්කමකින් යුත් පරිපාලන ප්‍රතිපත්ති හා අදාළ කරුණුවලට පමණක් සීමා විය යුතු බව රීති අංක 51(3) හි දැක්වෙනවා. පළමුවෙන්ම විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ විවාදය ආරම්භ කිරීමට පළමුවෙන්ම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා.10.05]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විපක්ෂ නායකතුමාටත්, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත් ස්තුතිය පළ කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවර 2017 අයවැයට අදාළව අපි පසුගිය දවස් හයක් තිස්සේ අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කළා. අදහස් හුවමාරු කර ගත්තා. තර්ක විතර්ක කළා. ඒ අනුව අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා අද දිනයේදී විසර්ජන ප්‍රඥප්ති කෙටුම්පත අප ඉදිරියේ තියලා, ලබන වසර සඳහා වියදම් කරන්න බලාපොරොත්තු වන රුපියල් මිලියන හැට එක් දහස් දෙසිය හැත්තෑ හයක් සඳහා අනුමැතිය, අවසරය දෙන්නය කියලාඅපෙන්ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ තිබෙන්නේ වෙස්මිනිස්ටර් ක්‍රමයේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගරු කරන,

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

අනුගමනය කරන පාර්ලිමේන්තුවක්. ඒ වාගේම ඒ උත්තරීතර පාර්ලිමේන්තුව අනුව යන පළාත් සභා ව්‍යුහයක්. අපේ රටේ තිබෙන විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය පාර්ලිමේන්තුවයි. මේ බස්නාහිර පළාත් සභාව දෙවැනි වෙන්නේ, ඒ පාර්ලිමේන්තුවට විතරයි. මේ පළාතේ

දිස්ත්‍රික්ක තුනක අපෙන් සේවය ලබන පිරිස මිලියන 5.8 ක්. එය රටේ මුළු ජනගහනයෙන් 29% ක්. විශාල ප්‍රමාණයක්. ඒ නිසා අපට ලොකු වගකීමක් තිබෙනවා, අපෙන් සේවය ලබන ජනතාවට සැලකිය යුතු සේවයක්, ප්‍රමාණවත් සේවයක් සැලසීමට. ලබන වර්ෂයේ ඇස්තමේන්තු වියදම රුපියල් මිලියන 61,276 ක්. ඒකෙන් 54,164 ක් පුනරාවර්ථන වියදම්. අපි තර්ක විතර්ක කරන කොට, මීට කලින් සාකච්ඡා කරන කොට, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන කොට අපි කිව්වා, අපි මතක් කරලා දුන්නා, ප්‍රාග්ධන වියදම් හැටියට අපි ඉතිරි කරලා තිබෙන, වැය කරන මුදල ප්‍රමාණවත් නැහැ. ඒක රුපියල් මිලියන 7,112 ක් කියලා. ඒකේ ආදීනවත් අපි ඒ වෙලාවේදී පෙන්වලා දුන්නා.

අපි දන්නවා. රජයෙන් රුපියල් මිලියන 16,516 ක් ප්‍රධාන හැටියට අපට ලැබෙනවා. ඒ වාගේම ජාතිය ගොඩ නැගීමේ බද්දෙන් හා මුද්දර ගාස්තුවලින් අපට රජයෙන් ලබා දීමට පොරොන්දු වෙලා තිබෙනවා, රුපියල් මිලියන 22,080 ක්. හැබැයි, අපට පළාත් සභා ආදායම්වලින් හා ඉතිරිකිරීම්වලින් රුපියල් මිලියන 22,680 ක් සලසා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ ගැන අර්බුදයක් නැහැ. පසුගිය වසරේ මූල්‍ය හැසිරීම දිහා බැලුවාම, ඊට කලින් වසරේ මූල්‍ය හැසිරීම දිහා බැලුවාම අපට මුදල් ලැබුණු විධිය දිහා හැරිලා බැලුවාම, අපට විශ්වාස කරන්න පුළුවන් මේ මුදල් ලබා ගැනීමේ අර්බුදයක් මතු වෙන්නේ නැහැයි කියලා. කෙසේ වෙතත් අපි මීට කලින් විවාදයේදී, අවස්ථා ගණනාවකදී අපි බොහෝ දේවල් පෙන්වලා දුන්නා. මේ ගෙවී යන වසරේ අපේ මූල්‍ය ප්‍රගතිය බරපතළ අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. ගිය වසරේ මේ වකවානුව වෙනකොටවත් අත් කර ගෙන තිබුණු මූල්‍ය ප්‍රගතිය අද අපි අත් කර ගෙන නැහැයි කියන එක අපට පිළිගන්න වෙනවා. නමුත් මේ වන කොට 25% ත් 30% ත් අතර මූල්‍ය ප්‍රගතිය තිබෙනවාය කියලා අපේ භාණ්ඩාගාර නිලධාරීන් කියනවා. ඒක හොඳයි. නමුත් මම විශ්වාස කරන්නේ, දෙසැම්බර් 31 වන කොට අපට බලාපොරොත්තු වන ප්‍රගතියට යන්න බැරි වෙයි කියලා. කෙසේ වෙතත් මේ වාගේ තත්ත්වයක් ඇතුළේ අපි සියලුම ඇමතිවරුන්ගේ සහ ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ වැය ශීර්ෂයන් දිනෙව්වා. තර්ක කළා. වාද කළා. කොන්දේසි විරහිතව අපි උදව් කරනවාය කිව්වා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මතක තියා ගත යුතු කාරණය ඒවා අප්‍රකාශිත කොන්දේසි. කොන්දේසි නැතිව නොවෙයි. ඒවා ප්‍රකාශ වුණේ නැති වුණාට, අප්‍රකාශිත කොන්දේසි ගණනාවක් මේක ඇතුළේ තිබෙනවා. ඒ නිසා මතක තියා ගන්න. මේ ජයග්‍රහණයත් ඊට පස්සේ පරාජයත් - අර අපේ පරණ සින්දුවක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රේමයත් වෛරයත් අතරේ වෙනස කෙස් ගහකට සමයි කියලා. බිඳුනු දා පූජාවේ ප්‍රේමේ ඔහුගේ ආගම වෛරයයි කියලා. ඒ වාගේම තමයි මේ ජයග්‍රහණයත් පරාජයත් අතර වෙනස කෙස් ගහයි. ඒ නිසා මේක හිතේ ධාරණය කර ගෙන ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, ගරු ඇමතිවරුත් කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. හැබැයි, එහෙම කියලා. අපි කියන්නේ නැහැ, අපි ඔබතුමන්ලාව අමාරුවේ දානවා කියලා. එහෙම නැහැ. හැබැයි, අපි විශ්වාස කරන දේවල්, අපි බලාපොරොත්තු වන දේවල් ඒ විධියට ඉෂ්ට වෙනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පුළුවන් වෙනවා මේ තත්ත්වය සමනය කර ගෙන ඉස්සරහාට වර්ධනීය තත්ත්වයක් කරා යන්න. ඒ නිසා ඒ කෙසේ වෙතත් අපි දන්නවා. පසුගිය කාලය ඇතුළේ අපට රජයෙන් ලැබෙන ප්‍රතිපාදන කැපුවාය කිව්වා. එහෙම කප්පාදු කරලා තිබෙනවා. ඒක ඇත්තයි. නමුත් ඒකේ බලපෑමක් නොවන විධියට අපට කටයුතු කරන්න ඕනෑ තරම් ඉඩ ප්‍රස්ථා තිබෙනවා. ඒ කොහොමද කරන්නේ? අපි ප්‍රාග්ධන වියදම් සීමා කරලා තිබෙන වෙලාවක. නමුත් අපි දන්නවා. අපට ලොකු පීඩනයක් තිබෙනවා. තෙරපුමක් තිබෙනවා. ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට. හැබැයි, ඒ තෙරපුම ඇතුළේ අපි දිගින් දිගටම පෙන්වලා දුන්නා, අපේ ආදායම් වැඩි කර ගැනීමේ ක්‍රමවේදය අපි ඉතාමත්ම පරිස්සමෙන් තව ටිකක්, ඇති කර ගන්න ඕනෑ. විශේෂයෙන්ම අපි ප්‍රඥප්ති ගැන කථා කළා. ඒ නිසා අපි මේ විසර්ජන ප්‍රඥප්තියට අනුමැතිය දෙන්න ප්‍රධානම කොන්දේසිය තමයි ගරු මහ ඇමතිතුමනි, ගරු ඇමතිවරුනි, මේ පළාතේ ජනතාව වෙනුවෙන් අපි කරන්න ඕනෑ ප්‍රධානම දේ තමයි, පළාත් සභාවේ ආදායම් වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

අපි දන්නවා. මධ්‍යම ආණ්ඩුවත් විශාල මූල්‍ය අවුලක ඉන්නවා. පසුගිය සතියේ අවසන් වුණු මධ්‍යම ආණ්ඩුවේ අයවැය ප්‍රකාශය දිහා බැලුවාම අපට පේනවා, ආණ්ඩුව ලොකු මූල්‍ය අර්බුදයක ඉන්නවාය කියලා. හැබැයි, ඒ අර්බුදය හමුවේ පළාත් සභාව හැටියට, බස්නාහිර පළාත් සභාව හැටියට වැඩිම සම්පත් ප්‍රමාණයක් තිබෙන ප්‍රදේශය හැටියට අපට පුළුවන් සැලසුමක් හදන්න. මේ තත්ත්වය ජයග්‍රහණය කරන්න. ඒ නිසා ඒ සඳහා අපට උපාය මාර්ගික සැලසුමක් තිබිය යුතුමයි. ඒ උපාය මාර්ගික සැලසුම

ක්‍රියාත්මක කරන්න තනිවම ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඇමති මණ්ඩලයටත් බැහැ. අපි අහන්නේ, ඇයි මේකට අපේ සහාය ලබා ගන්නේ නැත්තේ? අපට වැටුප් ගෙවනවා. අපට දීමනා ගෙවනවා. නිලධාරීන්ට වැටුප් ගෙවනවා. දීමනා ගෙවනවා. එහෙම නම් අපට වගකීමක් තිබෙනවා, මේ පළාතේ ජනතාව වෙනුවෙන් වැඩ කරන්න. මේ ඇමතිවරුන්ගෙන් මම පෞද්ගලිකව අහලා තිබෙනවා. අපට කියන්න මොනවාද - සමහර ඇමතිවරු අපට කියනවා, ගරු මන්ත්‍රීතුමා මේ වැඩේට පොඩ්ඩක් - අපි කොන්දේසි විරහිතව උදව් කරන වෙලාවල් ඕනෑ තරම් තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා වුණත් කිව්වොත් අපට මන්ත්‍රීතුමා මේ වැඩේ කරලා අපට උදව් කරන්නය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඒ උදව් කරන්න ලැහැස්තියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ලංකාවේ තිබෙන්නේ දේශපාලන සංක්‍රාන්ති සමයක්. අපි කවුරු වුණත් නැති වුණත් සංක්‍රාන්ති සමයක අපි ඉන්නේ. ප්‍රධාන දේශපාලන පක්ෂ එකතු වෙලා අලුත් ගමනක් යන්න සැලසුම් කරන වෙලාවක් මේක. මේ තුළ පළාත් සභාව එක් නියෝජනයක්, එක් ආයතනයක් විතරයි. ඒ නිසා අපට ලොකු වගකීමක් මේක ඇතුළේ තිබෙනවා. විශාලතම ප්‍රජාතන්ත්‍රවාදීආයතනයට දෙවැනි වන එකම ආයතනය හැටියට. ඒ නිසා පාර්ලිමේන්තුවත් අනෙකුත් දේශපාලන පක්ෂත්, ඒ ඒ පක්ෂවල නියෝජිතයිනුත් එකාවන්ව ඉන්න ඕනෑ.තනියෙන් මතු වෙලා ජේන්න, තනියෙන් ඉලිප්පෙන්න හැදුවොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,මේ වැඩේ කරන්න බැහැ. මේ ගමන යන්න බැහැ. ඒ නිසා අපි එකට එකතු වෙලා, මේ ගමන යන්න ඕනෑ. නැත්නම් අපි විනාශ වන එක ඉතාම පැහැදිලියි. නැත්නම් අපට මේ විධියට මේ ගමන යන්න බැරි වෙනවා. ඒ නිසා හිතන්න එපා ගරු ඇමතිවරුනි. ගරු ප්‍රධාන ඇමතිතුමනි. ඔබතුමන්ලාට මතක් කරනවා. විපක්ෂයේ ඔබතුමන්ලා සියලු දෙනාට කොන්දේසි විරහිතව අපි සහාය දුන්නා. ඒකෙන් ගම්‍ය වෙන්නේ නැහැ, අපි ඕනෑ දෙයක් කරනකල් බලාගෙන ඉඳියි කියලා. ඒ නිසා මේ මූල්‍ය හැසිරීම, මූල්‍ය විනයක් තිබෙනවාද? මේ මුදල් හරියට හසුරුවනවාද? කියන එක ගැන අපි දැඩි ලෙස අවධානයෙන් ඉන්නවාය කියන එක මතක් කරනවා.

ඒ වාගේම මේ පළාතේ බරපතළ විධියට ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්න විසඳන්න ක්‍රමවේදයක් හදන්න. සම්පත් ඕනෑතරම් තිබෙනවා. අපේ පළාතේ එක කොල්ලෙක්වත් රැකියා නැතිව තියන්න අවශ්‍ය නැහැ. අපට රැකියා සොයන්න පුළුවන්. හැබැයි, අපි ඒ සඳහා ව්‍යාපෘතිවලට යන්න ඕනෑ. මම ඊයේත් මතක් කළා. සංචාරක ව්‍යාපාරයයි, සෞඛ්‍යඅමාත්‍යාංශයයි එකතු වුණා නම්, වෙරළ තීරයේ පංචකර්ම මධ්‍යස්ථාන දාලා මුදල් උපයන්න පුළුවන්. ඒ එක උදාහරණයක් විතරයි. ඒ නිසා ඒ සඳහා දැඩි අවධානයක් යොමු කරන්න. මොකද, පලතුරුවලින් පෝෂිත ප්‍රදේශයක් බස්නාහිර ප්‍රදේශය. බස්නාහිර පළාත ඇතුළේ ඕනෑ තරම් පලතුරු ගම්මාන ඇති කරලා, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා, ඒවා දියුණු කරන්න පුළුවන්. ඒ නිසා මම කියන්නේ ගරු ප්‍රධාන ඇමතිතුමනි, ලබන වසරේවත් අපි සියලුම මන්ත්‍රීවරු එකතු වෙලා, අපි සියලු දෙනාගෙන්ම වැඩ ගන්න ක්‍රමයක් හදමු. විශේෂයෙන්ම අපි හැමදාම කථා කරනවා, අපේ ප්‍රගිතය නැහැයි කියලා. ඒ ප්‍රගතිය සමාලෝචනය කරන්න කමිටුවක් පත් කරන්න. ඔබතුමා සභාපති වෙන්න. ඒ වාගේම අපේ ප්‍රධාන ලේකම්තුමා සභාපතිතුමා කරලා කමිටු පත් කරන්න. මාසෙන් මාසය, එහෙම නැත්නම් කාර්තුවෙන් කාර්තුවට පරික්ෂා කරන්න. අපි අවශ්‍ය ප්‍රමාණයට මේවා උපයෝගී කර ගෙන තිබෙනවාද? අවශ්‍ය ප්‍රමාණයට මුදල් වැය කරලා තිබෙනවාද? ප්‍රගතිය අත් කර ගෙන තිබෙනවාද කියලා. ඒ නිසා ඒ සඳහා අවධානය යොමු කළ යුතුයි කියලා මම දැඩි ලෙස අවධාරණය කරන්න කැමැතියි. දෙසැම්බර් 31 වැනිදා වෙලා අපි අඬන්න ඕනෑ නැහැ, එහෙම වුණා නම්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳවත් අවධානය යොමු කරලා මුදල් අව්ච්චින්න වෙන්න දෙන්නේ නැතිව,ඒ සඳහා කටයුතු යොදන්නය කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි. 2017 මූල්‍ය වර්ෂයේ සැලසුම් සකස් කරන කොට අපි සමස්ත සැලසුමක් හදන්න ඕනෑ. Master Planඑකක් හදන්න ඕනෑ.ඒ ඒ අමාත්‍යාංශවල ප්‍රගතිය අපට ඕනෑ වෙලාවක, සොයා ගන්න පුළුවන් විධියට. අපේ ප්‍රධාන ඇමතිතුමාගේ මේසයේ ඉඳගත්තාම,එතුමාට පුළුවන් වෙන්න ඕනෑ, මෙන්න
[ගරු සුසිල් කිඳෙල්පිටිය]

අමාත්‍යාංශයේ ප්‍රගතිය කියලා අපට බලලා කියන්න. ඒ සඳහා අපි කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය සහාය අපි දෙන්න ලැහැස්තියි. හැබැයි, මේ ක්‍රමය වෙනස් වුණොත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා. ගියවර රුපියල් මිලියන 275 ක් අරගෙන රුපියල් මිලියන 235 ක් මන්ත්‍රීවරුන් අතරේ බෙදුවා. ඒක ඉතාම අසාධාරණයි.

එහෙම අසාධාරණකම් කරන්න එපා. හැමෝටම සම්පත් සමසේ බෙදී යන්න අවශ්‍ය සැලසුම් සකස් කරන්න. ඒ වාගේම දූෂණයත්, වංචාවත් දුරු කරමින්, ඒ වාගේම නිලධාරීන් සියලු දෙනාගෙන් සේවය ලබා ගන්න පුළුවන් විධියේ සැලසුම් හදන්නය කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා.10.14]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ 2017 වර්ෂය වෙනුවෙන් පැවැත්වෙන අයවැය විවාදය අවසන් වන අවස්ථාවේ, අද අපි ඉදිරියට කටයුතු කරන්න මේ අයවැයත් ප්‍රයෝජනයට ගනිමින් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව, අවසාන වශයෙන් අදහසක් ඉදිරිපත් කරන්න ඉඩකඩ අවස්ථාව ලැබීම පිළිබඳව මුලින්ම ස්තුතිවන්ත වෙන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. පළාත් සභා ක්‍රමය මේ රට තුළ ස්ථාපිත කිරීමේදී විශාල පරිත්‍යාගයන්, ජීවිත කැප කිරීම් තුළින් තමයි, පළාත් සභා ක්‍රමය අපට මේ රටේ ස්ථාපිත කරන්න පුළුවන් වුණේ. ජාතීන් අතරේ තිබෙන්නා වූ පළුදු වීම් අවසන් කරලා, ජාතීන් අතරේ විශ්වාසය, සහෝදරත්වය, සහජීවනය ගොඩ නගා ගැනීම අරමුණු කර ගෙන, පළාත් සභා ක්‍රමය ඇති වුණාය කියන එකයි අපි විශ්වාස කරන්නේ. මේ පළාත් සභා ක්‍රමය තුළ ඒ ජාතික ප්‍රශ්නවලට කොපමණ දුරට විසඳුම් ලැබිලා තිබෙනවාද කියන කාරණාව නැවත නැවත අපට සලකා බලන්න තිබෙන අවස්ථාවක් හැටියටයි, අපි මේ අවස්ථාව විශේෂයෙන්ම සලකන්න බලාපොරොත්තු වෙන්නේ. අපි විශේෂයෙන්ම පුද්ගලිකව සහ දේශපාලන වශයෙන් බලාපොරොත්තු වෙන්නේ, පළාත් සභාවට ස්වාධීනව කටයුතු කරන්න තිබෙන ඉඩකඩ වඩාත් ශක්තිමත් වෙන්න ඕනෑය කියලා. පළාත් සභාවට පත් වන මහජන නියෝජිතයින් ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු ඒ අමාත්‍ය මණ්ඩලය, මන්ත්‍රීවරුන් මේ සියලු දෙනා මහජන ඡන්දයෙන්, මහජන නියෝජිතයින් හැටියට මේ පළාත තුළ කටයුතු කරන්න පත් වුණු උදවිය නිසා ඒ අයට ස්වාධීනත්වයකින් යුතුව කටයුතු කිරීමේ අයිතිය, ඉඩකඩ ශක්තිමත් වෙන්න ඕනෑය කියලා අපි විශේෂයෙන්ම විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් විශේෂයෙන්ම මෙම කාල පරිච්ඡේදය තුළ රටේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩ නැගීමට සාකච්ඡා වන අවස්ථාවක, ඒ වෙනුවෙන් යෝජනා වෙලා තිබෙන අවස්ථාවක අපි විශ්වාස කරනවා. පළාත් සභාව හැටියට අපි මේ පළාත් සභාව තුළ අපට ක්‍රියා කරන්න තිබෙන ඉඩකඩ වඩාත් ශක්තිමත් කරන්නේ කොහොමද කියන කාරණාවට අවධානය යොමු කරලා, කරුණු ඉදිරිපත් කරලා, පළාත් සභා ශක්තිමත් කිරීම සඳහා වඩාත් වැඩි වැඩ පිළිවෙළකට යන්න ඉදිරිපත් වෙයි කියලා.විශේෂයෙන්ම අපි එය බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම රටේ ජනාධිපතිතුමාවත්, පාර්ලිමේන්තුවේ කටයුතුවලට එහෙම නැත්නම් රාජ්‍ය සේවයේ කටයුතුවලට තිබෙන්නා වූ බලයටත් වැඩි බලයක් අපි දන්නවා ආණ්ඩුකාරවරයා සැම අපි පුද්ගලිකව ආණ්ඩුකාරවරයා පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. නමුත් ආණ්ඩුකාරවරයා හරහා එවැනි බලයක් ක්‍රියාත්මක වෙනවා. අපි හිතනවා, එවැනි බලයන් සීමා වෙන්න ඕනෑ. එවැනි බලයන් සීමා වෙලා මහජන නියෝජිතයින් ඇතුළු අමාත්‍ය මණ්ඩලයට ඒ සඳහා තිබෙන බලය වඩාත් වැඩි වෙන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම සමගාමී ලැයිස්තුවක් තුළ කාටවත් හරි විධියට ක්‍රියා කරන්න බැරිව දෙපැත්තකට තිබෙන තත්ත්වයන් වෙනස් කරලා සමගාමී ලැයිස්තුව අවසන් වෙලා එක්කෝ මධ්‍යම ආණ්ඩුවේ, එහෙම නැත්නම් පළාත් සභාවක තිබෙන බලතල මේවායි. ක්‍රියා කරන්න තිබෙන ඉඩකඩ මේවායි, කියන ඒවා පැහැදිලිව සටහන් වෙන්න ඕනෑය කියලා අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් අලුත් ව්‍යවස්ථාවට කරුණු ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම කරනවා. විශේෂයෙන්ම ඉඩම් බලය වැනි දේ, අපට තිබුණු ගොවිජන සේවා බලය, ඒවා අපෙන් අහෝසි වුණා. ඒවා නැවත ලබා ගැනීම සඳහා මේ 2017 වර්ෂය තුළ අපි කටයුතු කළ යුතුයි කියන දේ අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම මේ මුළු පළාත් සභා අයවැය විවාදය තුළම චෝදනාවක් නැගුනා මධ්‍යම ආණ්ඩුවෙන් අපට ලැබෙන්න තිබුණු මූල්‍ය ප්‍රතිපාදන කපා හැරලා තිබෙනවාය කියලා. එක පැත්තකින් පුනරාවර්තන වියදම් කැපිලා තිබෙන්නේ, විශේෂයෙන්ම රජයේ සේවකයින්ගේ පඩි නඩි ගෙවීම. මම විශ්වාස කරන්නේ නැහැ, කවදාවත් රජයේ සේවකයින්ගේ පඩි නඩි කපන්න, නතර කරන්න කිසිම ආණ්ඩුවකට පුළුවන් වේවිය කියලා. ඒක අනිවාර්යයෙන්ම ගෙවන්න සිද්ධ වෙනවා. ඒක විශාල දේශපාලන සහ ජාතික ප්‍රශ්නයක්. ඒ නිසා මම හිතන්නේ නැහැ,

එවැන්නකට අපට මුහුණ දෙන්න වෙයි කියලා. ප්‍රාග්ධන වියදම යම් ප්‍රමාණයකට කැපිලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම කැපිලා තිබෙනවා වාගේම, අපි අවබෝධ කර ගන්න ඕනෑ. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ වෙන්න පුළුවන්, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වෙන්න පුළුවන්. වෙනත් ක්ෂේත්‍රයන් තුළ ඊට වඩා වැඩි ප්‍රතිපාදන මුදලක්, ඊට වඩා මූල්‍ය වටිනාකමක් පළාත් කටයුතු වෙනුවෙන් මධ්‍යම රජයෙන් ලැබිලා තිබෙන නිසා එවැනි අඩුවකට අපට මුහුණ දීලා කටයුතු කරන්න පුළුවන් වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ වාගේම අපි විශ්වාස කරනවා. අපි පළාත් සභාව හැටියට අපේ ආදායම් මාර්ග වැඩි කර ගන්න කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ රටේ බදු ආදායම තිබෙන්නේ 12% ක් වැනි අඩු මට්ටමකට. නමුත් සංවර්ධනය කරා යන රටක් හැටියට, දියුණුව කරා යන්න ඕනෑ රටක් හැටියට 20% ක වාගේ බදු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

නැත්නම් රට ඉදිරියට ගෙනි යන්නපුළුවන්කමක් වෙන්නේ නැහැ. එය අඩු වශයෙන් 20% ක මට්ටමකට ගෙනෙන්න ඕනෑ. ඒක ගෙනෙන කොට සාමාන්‍ය ජනතාව පිට බදු පටවන්නේ නැතිව සල්ලි තිබෙන මිනිහාගෙන් බදු අය කර ගැනීමේ ප්‍රතිපත්තියකට යන්න ඕනෑ. අපි සතුටු වෙනවා, පසුගිය මධ්‍යම ආණ්ඩුවේ අයවැය ලේඛනයෙන් ප්‍රාග්ධන බද්ද, Capital Taxඑක නැවත 10% කට නැවත හඳුන්වා දීම පිළිබඳවත් අපි මේ අවස්ථාවේ සතුටු වෙනවා.

ඒ වාගේම අවසාන වශයෙන් කියන්න වෙන්නේ,අද පවතින්නේ සම්මුතිවාදී ආණ්ඩුවක්. සම්මුතිවාදී දේශපාලනයක් තමයි මුළු ලෝකය පුරාම ගමන් කරන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ආණ්ඩු පක්ෂය, විරුද්ධ පක්ෂය කියලා බෙදෙන්නේ නැතිව, රජයේ නිලධාරී මහත්වරුන් ඉන්නවා. ඒ අයගේ සහයෝගය අරගෙන, සියලු දෙනා එකට එකතු වෙලා අපි මේ පළාත තුළ පළාත සංවර්ධනය කරන්න, පළාතේ ජනතාවට සේවයක් කරන්න, පළාත දියුණුව කරා ගෙනියන්න, අපි කවුරුත් කටයුතු කරන්න ඕනෑ. ඒ වෙනුවට අද පාර්ලිමේන්තුව තුළත් කාරක සභා ක්‍රමයක් ඇති කරලා, පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ටත් කාරක සභා ක්‍රමය තුළ වඩාත් ක්‍රියාත්මක ආකාරයට ඒ සංවර්ධන කටයුතුවලට රට ඉදිරියට ගෙනයාම වෙනුවෙන් දායකත්වය ලබා දෙන්න කටයුතු කරන්න සූදානම් වෙලාවේ පළාත් සභාවත්,මේ මන්ත්‍රීවරුන් සියලු දෙනාගේම, ආණ්ඩු විරෝධී සියලු දෙනාගේම සහයෝගය අරගෙන, ඒ අයට යම් යම් වගකීම් පවරලා, ඒ අයට ඒ වෙනුවෙන් යම් පහසුකමක් ලබා දීලා, ඒ පහසුකම වෙනුවෙන්ම යම් පිරිවැයක් දරන්න සිදු වුණත් ඊට වඩා ඵලදායීතාවයන් ලබා ගන්න පුළුවන් වෙනවාය කියා විශ්වාසය තිබෙන නිසා එය පළ කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගරු මහ ඇමතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය, පළාත් සභාව මේ සඳහා අවධානය යොමු කරලා කටයුතු කරනවා ඇතියි කියලා විශ්වාස කරනවා. 2017 අවුරුද්දේදී මේ අයවැය මත පදනම් වූ මේ පළාත් සභාව ඉදිරියට ගෙනියන්න, අපේ සම්පූර්ණ සහයෝගය ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරමින්, සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා.10.22]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2017 වර්ෂයේ බස්නාහිර පළාත් සභාවේ විසර්ජන පනත් කෙටුම්පතට අදාළ අවසන් විවාදයට එක්වන්න මට මේ අවස්ථාව සහ වෙලාව ලබා දීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මට පෙර කථා කළ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාගේ කථාවට සවන් දීමෙන් පසුව මේ කථාව පැවැත්වීමට අවස්ථාව ලැබීම ගැනත් මම සතුටු වෙනවා. බස්නාහිර පළාත් සභාව පමණක් නොවෙයි. රටේ පළාත් සභා නවයෙන් පළාත් සභා අටක් ගැන අපට කියන්න තිබෙන්නේ - ඇත්ත වශයෙන්ම සුදු අශ්වයින් අට දෙනෙක් ඉන්නවා. ඒ සුදු අශ්වයින් අට දෙනා අතර කළු

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

අශ්වයෙක් ඉන්නවා. බ්ලැක් හෝස් කෙනෙක් ඉන්නවා. ඒ බ්ලැක් හෝස් තමයි උතුරු පළාත් සභාව. දැන් මෙතුමාගේ කථාවේදී කියා සිටියා, රටේ ජාතික සංහිඳියාව ඇති කරන්න, සුළු ජන කොටස්වල අයිතිවාසිකම් රකින්න, ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා තමයි මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කළේ කියලා. දැන් අපට පේනවා, ඒ පළාත් සභා

නවයෙන් එක පළාත් සභාවක් මේ රටේ ජාතික සංහිඳියාවට, ජාතික සමඟියට බාධා වන ආකාරයට ආගමික සමඟියකට, ආගමික සංහිඳියාවට බාධා වන ආකාරයට දිගින් දිගටම කටයුතු කරමින් තිබෙනබව. යෝජනා සම්මත කරමින් තිබෙනවා. දැන් මේ යෝජනාවලින් ඇති කරන ප්‍රතිඵලය මොකක්ද? උතුරු පළාත තුළ බෞද්ධ සිද්ධස්ථාන, වෙහෙර විහාරස්ථාන ඉදි කරන්න එපාය කියලා යෝජනාවක් සම්මත කර ගත්තා. ඒ වාගේම උතුරු පළාත් සභාවේ අරමුදල්වලින් උතුරු පළාතේ බෞද්ධ සිද්ධස්ථානවල සංවර්ධනය සඳහා මුදල් යොදවන්නේ නැහැයි කියලා යෝජනාවක් සම්මත කර ගත්තා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ බදු ආදායම්වලින් 70% ක් එකතු කරන්නේ, මේ රටේ මහා සමාජය වන සිංහල ජනතාවගෙන්. ඒ මුදල් තමයි උතුරු පළාත් සභාවටත් යොදවන්නේ. එහෙම නම් උතුරු පළාත් සභාවට ජාතිවාදීව, ආගම්වාදීව, වර්ගවාදීව, ගෝත්‍රවාදීව කටයුතු කරන්න කිසිම අයිතියක් නැහැ. ඔවුන් පැහැදිලිවම මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවා. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන වගන්තියේ ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, මේ රටේ බුදු දහමට ප්‍රමුඛස්ථානය හිමි වෙනවා. බුදු දහම ආරක්ෂා කොට පෝෂණය කොට සංවර්ධනය කරනවාය කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන වගන්තියේ තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තියේ සියලු ආගම්වලට සමානව සලකනවා. ඒක මූලික අයිතියක් කියලා සඳහන් කරලා තිබෙනවා. එසේ සඳහන්ව තිබෙද්දී තමයි රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කරමින්, උතුරු පළාත් සභාව මේ විධියට කටයුතු කරන්නේ. නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් මේ දක්වා අනුගමනය කරලා නැහැ. මම කනගාටු වෙනවා. අපේ අනෙක් පළාත් සභා අටේ ඉන්න මහ ඇමතිවරු මේ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක විවේචනයක්,ප්‍රතිවිරෝධයක්සහ ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන නැහැ. නිහඬ පිළිවෙතක් අනුගමනය කරනවා. ඇයි? ඒ නිහඬ පිළිවෙතක් අනුගමනය කරන්නේ කියන එක පිළිබඳව අපි විමසා සිටිය යුතුයි.

ඒ වාගේම තවත් බලතල ඉල්ලා සිටිනවා. ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කරන්නය කියනවා. මම අහන්න කැමැතියි. බස්නාහිර පළාත් සභාවේ ගරු මහ ඇමතිතුමා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය සඳහා පාර්ලිමේන්තුවේ ගිහිල්ලා, ඒ කමිටුව ඉදිරියේ ඉදිරිපත් කරපු යෝජනාවලිය මේ සභාවට ඉදිරිපත් කරන්නය කියලා. මොකද, මේ රටේ තොරතුරු දැන ගැනීමේ අයිතිය අප සතුව තිබෙනවා. ඒක මූලික මිනිස් අයිතිවාසිකමක්. මට දැන ගන්න ලැබී තිබෙන ආකාරයට උතුරු පළාත් සභාවත්, බස්නාහිර පළාත් සභාවත් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ, මේ සමගාමී ලැයිස්තුව ඉවත් කරන්න. වැඩි වැඩියෙන් පොලිස් බලතල, ඉඩම් බලතල ලබා දෙන්නය, ආණ්ඩුකාරවරයාගේ බලතල කප්පාදු කරන්නය කියන යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන පළාත් සභා නවයෙන් පළාත් සභා දෙකක මහ ඇමතිවරු අතර අපේ ගරු මහ ඇමතිතුමාත් ඉන්නවා. මම ඒ ගැන බලවත් ලෙස කනගාටු වෙනවා. මම ඉල්ලා සිටින්න කැමැතියි. ඒ යෝජනාවලිය මේ සභාවේ දැන ගැනීම සඳහා මේ සභාවට ඉදිරිපත් කරන්නය කියලා.

ඒ වාගේම අද සංහිඳියාව ගැන කථා කරනවා. අපි සංහිඳියාව වෙනුවෙන් කැප වෙනවා. මම මේ පළාත් සභාවට යෝජනාවක් ගෙනාවොත්, මේ බස්නාහිර පළාත තුළ කෝවිල් ඉදි කරන්න එපා. බස්නාහිර පළාත් සභාවේ අරමුදල් ඒ කෝවිල් සංවර්ධනය සඳහා යොදවන්න එපාය කියලා යෝජනාවක් ගෙනාවොත්, ඒ යෝජනාව සම්මත වුණොත් ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? අපි එකට එක කරන්න කටයුතු කරන්නේ නැහැ. වෛරයෙන් වෛරය සංසිඳෙන්නේ නැහැ. ඒ නිසා සංහිඳියාව සඳහා අපි කැප වෙලා ඉන්නවා. උතුරු පළාත් සභාවේ මේ කර ගෙන යන මේ ක්‍රියාදාමය නිසා අනිවාර්යෙන්ම මේ රටේ ජාතික සංහිඳියාව විතරක් නොවෙයි, ජාතීන් අතර තිබෙන සමගිය, සහජීවනය ඒ වාගේම අවබෝධය බිඳ වැටෙනවාය කියන එක කියන්න ඕනෑ. මේ බලතල ඉල්ලන අයට අපට කියන්න තිබෙන්නේ, එක දෙයයි. බලය දීලා තිබෙනවා. උතුරු පළාත් සභාව කරලා තිබෙන සංවර්ධනය මොකක්ද? පළාතේ ජනතාවගේ ජන ජීවිතය නගා සිටුවන්න,ඒ අරමුදල් නිසියාකාරව යොදවලා තිබෙනවාද? ඒ විතරක් නොවෙයි. රුපියල් මිලියන 67 ක මුදලකට මොකද? වුණේ කියලා අද දක්වා මේ කට්ටියට කරුණු පැහැදිලි කරන්න පුළුවන්කම ලැබිලා නැහැ. එතැන විශාල මූල්‍ය වංචාවක් සිදු වෙලා තිබෙනවා. ඒවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒ නිසා මම ඊට වඩා ඒ සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත කියලා කියන්නේ, රටේ ආර්ථිකයේ එන්ජිම. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේත් පැහැදිලි දැක්මක්, වැඩ පිළිවෙළක් තිබෙනවා. ඉදිරි කා,ය තුළ මේ රටේ විශාල ආර්ථික වර්ධනයක් ඇති කරන්න. ඒ වාගේම අපි ඉහළ ආදායම් ලබන රටක් බවට පත් කරන්න. මේ වන කොට අපේ ඒකපුද්ගල ආදායම ඇමරිකන් ඩොලර් 4000 යි. එය 2035 වන කොට ඩොලර් 8000 ඉලක්කමට යන්නඅපි බලාපොරොත්තු වෙනවා. ඉතින් ඒ ඉලක්කමට යන්න නම් - බස්නාහිර පළාත තමයි රටේ ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය බවට පත් වෙලා තිබෙන්නේ. එන්ජිම බවට පත් වෙලා තිබෙන්නේ. එහෙම නම් මේ එන්ජිමේ ධාරිතාවය වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම බස්නාහිර පළාතේ අගය වැඩි කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ. භෞතික සම්පත්වල දියුණුව පමණක් නොවෙයි, ඒ වාගේම අනික් පැත්තෙන් අපි අරගෙන බලන්න ඕනෑ තාක්ෂණය, විද්‍යාව පැත්තෙන් කොහොමද අපි බස්නාහිර පළාතේ වටිනාකම වැඩි කරන්නේ. අගය වැඩි කරන්නේ කියලා. ඒ සඳහා වැඩ පිළිවෙළක්, සැලැස්මක් අපට අවශ්‍යයි. ඒ වාගේම අපි කියන්න ඕනෑ. අපේ මානව සම්පත බස්නාහිර පළාත තුළ මුළු රටේම ඉන්න උගත් බුද්ධිමත් පිරිස්, ඒ වාගේම තාක්ෂණවේදීන්, ඉංජිනේරුවන්, කලාකරුවන්, නීතිවේදීන් මේ සියලු දෙනාම අද එකතු වෙලා ඉන්න කේන්ද්‍රස්ථානය බස්නාහිර පළාත. එහෙම නම් බස්නාහිර පළාත ආර්ථිකයේ වඩාත් සක්‍රිය කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්න නම්, ආර්ථිකයේ කේන්ද්‍රය, ඒ වාගේම දැනුමේ කේන්ද්‍රය, නාවුක බලයේ කේන්ද්‍රය බවට බස්නාහිර පත් කර ගෙන අපේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්න නම්, බස්නාහිර පළාත් සභාවට සුවිශේෂ කාර්යභාරයක් තිබෙනවා. ඒ සඳහා දැක්මක් අවශ්‍යයි. ඒ සඳහා සැලැස්මක් අවශ්‍යයි. ඒ සඳහා උපාය මාර්ගයක් අවශ්‍යයි. එතැනදී අපේ කාර්යක්ෂමතාවය, කාර්ය සාධනය ඉතාමත්ම වැදගත් කියන එක අපි කියන්න ඕනෑ.

ඒ වාගේම අපට යම්කිසි ප්‍රමිතියක් අවශ්‍යයි. අද අපේ රටේ දළ ජාතික ආදායමෙන් 10% ක් දූෂණය, වංචාව සහ අල්ලස සඳහා යට වෙලා තිබෙනවා. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. 10% ක් කියලා කියන්නේ,විශාල මුදලක්. රටේ දළ ජාතික ආදායමෙන්,අපේ ධනයෙන් අද අල්ලසට, දූෂණයට එවැනි විශාල මුදලක් යට වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ දූෂණය පිටු දකින්න ඕනෑ. අල්ලස පිටු දකින්න ඕනෑ. ගරු නියෝජ්‍යසභාපතිතුමනි,ඒක අත්‍යවශ්‍ය කාරණයක්. ඒ වාගේම තමයි කාර්යක්ෂමතාවය කියන එක.ඵලදායීතාවය, කාර්යක්ෂමතාවය මනින අලුත් මිනුම් දඬු අපට අවශ්‍යයි. ඒ වාගේම අනික් පැත්තෙන් නිරෝගී ජනතාවක් නැතිව මේ රට ඉස්සරහාට ගෙනියන්න බැහැ. මානසික වශයෙන් ව්‍යාකූල තත්ත්වයට පත් වුණු, ආවේගකාරී මිනිස්සු ඉන්න, ඒ වාගේම මානසික ආතතියක් සහිත, යම්කිසි මානසික ව්‍යාධීන්වලට ගොදුරු වුණු පිරිසක් නම් ඉන්නේ, අපට මේ ආර්ථික ඉලක්ක සපුරා ගන්න බැහැ. ඉක්මන් පැනුමකට යන්න බැහැ. ඒ නිසා 2035 අපි මේ රට ලෝකයේ ඉහළ ආදායම් ලබන රටක් බවට පත් වෙන්න නම්, අපට අවශ්‍යයි මේ මානසික නිරෝගීභාවය. කායික නිරෝගීභාවය. අද සමහරු ඇවිල්ලා මාධ්‍ය නිදහස ගැන කථා කරනවා. ඇත්ත වශයෙන්ම මාධ්‍ය නිදහස ගැන කථා කරන්න කලින්, ඒ අය ගිහිල්ලා ඔලුවෙන් හිට ගත්තා නම් හොඳයි කියලා මට කියන්න හිතෙනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ. මේ පළාත් සභාව ඇතුළේ ඉතාම හොඳ සම්මුතියක්, එකඟතාවයක් අද ගොඩනැගිලා තිබෙනවා. අන්න ඒ සම්මුතිය, එකඟතාවය, සහජීවනය මතයි අපි ඉස්සරහාට යන්න ඕනෑ. එහෙම නැතිව මේ නයි පොළොංගු වාගේ, නයි මුගටි වාගේ දේශපාලනය කරලා, මේ රට ඉදිරියට ගෙනියන්න බැහැ. තාවකාලිකව සතුටක් ලබන්න නම් පුළුවන්.චූන් වෙන්න පුළුවන්. නමුත් ඒවායින් අනාගතයක් ගොඩනැගෙන්නේ නැහැයි කියන එක ප්‍රකාශ කරමින්, බස්නාහිර පළාත් සභාවේ ඉදිරි ගමන සඳහා මේ සම්මත කර ගනු ලබන මේ වැය ශීර්ෂයටත්, විසර්ජන ප්‍රඥප්තියටත් අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙමින් අපි සියලු දෙනාම එක්සත්ව, එක්සිත්ව මේ රට ඉදිරියට ගෙනියමු. සංවර්ධනය කරමු. ඒකයි මේ රටේ ජනතාවගේ අනාගත ප්‍රාර්ථනාව කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා.10.30]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2017 අයවැය යෝජනාව තුළ විසර්ජන ප්‍රඥප්තිය සම්මත කර ගන්න යන මොහොතේ අපි සියලු දෙනාම දවස් හයක් තිස්සේ මේ ගැන කථා කරලා, විවාද කරලා, උනන්දු වන්නේ වඩාත් හොඳ වැඩ පිළිවෙළක් ජනතාවට දෙන්න ඕනෑ නිසයි. ඒ අනුව2017

කියන වැඩ පිළිවෙළ තුළ තමයි මේ ක්‍රියාත්මක වෙන්නේ. ඇත්තටම අපට ලොකු වගකීමක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාව හැටියට මේ රටේ ජනගහනයෙන් 28% කට අධික ප්‍රමාණයක් ජීවත් වෙන්නේ, ලක්ෂ 58 කට එහා ජනගහනයක් ජීවත් වෙනවා නම් ඒ අයට ඒ පහසුකම් දෙන්න, ඒ අයගේ ඒ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින්න ලොකු වගකීමක් බස්නාහිර පළාත් සභාවට තිබෙනවා. මම සන්තෝෂ වෙනවා, අපේ හිටපු ඇමතිතුමාත්, ඒ වාගේම කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාත් කථා කළාට පස්සේ, කථා කරන්න අවස්ථාව ලැබීම ගැන. එතුමා කිව්වා, එන්ජිම තමයි බස්නාහිර පළාත් සභාව කියලා. හැබැයි, එන්ජිම තියෙනවා. ඩීසල් පොඩ්ඩක් විතරක් දෙනවා. තෙල් ටික, සර්විස්, ගෙවෙන අඩුපාඩු ටික දාන්නේ නැති තැනට තමයි අද පත් වෙලා තිබෙන්නේ. ගිය අවුරුද්දේ ලබා දුන්න මුදල් ප්‍රතිපාදනවලට, ඒ පොරොන්දු වූ මුදලවත් නොදී,මේ අවුරුද්දේ තවත් බිලයන නවයක් කපලා තිබෙනවා. එහෙම කරලා එන්ජිම ඇද ගෙන යන්න පුළුවන් වට පිටාවක් ගොඩ නැගෙන ක්‍රමවේදය මම දන්නේ නැහැ. හැබැයි, සමහර විට කියනවා ඇති, අර මධ්‍යම රජයේ අයවැයෙන්ගහපු බදු වාගේම, බොලත් පළාත් සභාවේ මිනිස්සුන්ගෙන් බදුම ගහලා කොහොම හරි මේක කර ගෙන පලයල්ලා කියලා.

අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා කිව්වා, මුදල් ප්‍රතිපාදන නිලධාරීන්ගේ කපන ක්‍රමය දන්නේ නැහැයි කියලා. නමුත් ඒ අයට වෙන් වන මුදලින් මිලියන 6000 ක් අඩු කරලා එවලා තිබෙනවා. එහෙම නම් කොහෙන්ද ඒවා දෙන්නේ? මම හිතන්නේ, අර ඒ සේවකයන් සමාන්තරව ගත්තොත්, රුපියල් දහ දාහ වැඩි කරපු ගණනම අඩු කරලා එවලා තිබෙනවා. එහෙම නම් පරණ විධියටම ද යන්නේ කියන එක අපට හිතාගන්න බැහැ. ඒ කියන්නේ, මේ ජනතාවගෙන්ම යැපෙන්නය කියනවා නම්මම හිතන්නේ, මේ අපි කියන අරමුණ කරා යන්න පුළුවන්කමක් වෙයි කියලා, මම විශ්වාස කරන්නේ නැහැ.

ඇත්තටම අපි සන්තෝෂ වෙනවා. කිසිම බෙදීමක් නැතිව, කිසිම ඡන්දයක් නැතිව මේ සියලුම අපේ අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් සම්මත වුණා. ඇත්තටම ඒක හොඳ ආදර්ශයක් කියලා මම හිතනවා. ඇත්තටම හොඳයි කියලත් හිතනවා වාගේම ඉස්සරහාට ලොකු භයානකකමකුත් තිබෙන බව අපට තේරෙනවා. මේ යන වැඩ පිළිවෙළ තුළ ඔහේ ඕනෑ විධියට කර ගෙන පලයල්ලා. අපි සද්ද නැහැයි කියන එකද මෙතැනින් කියන්නේ කියලාමම දන්නේ නැහැ කියන්න. එක්සත් ජාතික පක්ෂය නම් අපට කමක් නැහැ. නායකතුමා කිව්වා කියලා. අපට කනගාටුව තිබෙන්නේ, ජනතා විමුක්ති පෙරමුණේ අපේ නායකයෝත් පළාත් සභාව තුළ ඇයි මෙහෙම කරන්නේ කියලා. මධ්‍යම රජයේ නම් විරුද්ධ වෙලා තිබෙනවා. අද අමුතු වැඩ පිළිවෙළක් යන්නේ. මධ්‍යම රජයේ විපක්ෂ නායකවරයාත් ඡන්දය දෙනවා පක්ෂව. ඒක කමක් නැහැයි කියමුකෝ. පළාත් සභාව තුළ අපේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ කිසිම සද්දයක් නැතිව යනවා. මම දන්නේ නැහැ ඇයි මේ කාරණාව කියලා. අපි දන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණත් දෙකට තුනට කැඩිලාද කියලා හිතෙනවා මෙහෙම යන කොට. ඒගොල්ලෝ ඒක මතයක යනවා. පළාත් සභාව තව මතයක යනවා. ඒ තුළ මට පෙනෙන විධියට එහෙම වැඩ පිළිවෙළක්ද මන්දා. ඒගොල්ලන්ට ඒ අයගේ ඒ නායකයන්ට රිදවන්නද දන්නේ නැහැ මෙහෙම කරන්නේ කියලා මට හිතෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ජනතා විමුක්ති පෙරමුණ ගැන අපි බලාගන්නම්. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ වැඩක් ගැන බලා ගන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඒකේ භයානකකම මම කිව්වේ. විරුද්ධ වෙන්න කවුරුත් නැත්නම්, උඹලාට ඕනෑ මගුලක් කරහල්ලා කියලා තමයි මේ සද්ද නැතිව ඉන්නේ කියලා මම හිතනවා. මොකද, එතකොට නිලධාරීන් කිසිම ප්‍රශ්නයක් නැතිව, හරි පස්සේ යන්නේ නැහැ. මහ ඇමතිතුමා කියනවා නම්, මොකද, අපි කවුරුවත් විරුද්ධ නැහැ නේ? අපි කවුරුවත් පස්සේ යන්නේ නැහැ නේ කියලා. ඒ නිසා අපට කනගාටුයි. ජනතා විමුක්ති පෙරමුණ මේ රටට පෙන්වන දේ ප්‍රායෝගිකව කරනවාද කියලා. දැන් අද කළු පටියක් බැන්දාය කියලා - ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ,මාධ්‍ය මත යැපෙන පක්ෂයක්. නමුත් ඒ මාධ්‍ය වෙනුවෙන් අපි පොඩ්ඩක් මැදිහත් වුණාය කියලා හරි අමාරුවෙන් මේ අය කෑ ගහනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපි විරුද්ධ වුණේ නැහැ.

**ගරු ලලිත් වර්ණකුමාර**

Hon. Lalith Warna Kumara

88, 89 ගැන බැලුවොත් බෙල්ලේ මිනී ඔලු එල්ලා ගන්න ඕනෑ. මාල. අතේ නොවෙයි. නමුත් ඒවා වැඩක් නැහැ. හැමදාමත් පරණ දේවල් කථා කරලා වැඩක් නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

කථා කරන්න තිබෙන්නේ එච්චරයි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔළුවෙන් හිට ගන්න ඕනෑ කිව්වා. හැබැයි, එතුමාට කියන්න බැරි වුණා, සරම ඇඳලාද, කලිසම ඇඳලා ද ඔලුවෙන් හිට ගන්න ඕනෑ කියලා ඒක කියා ගන්න බැරි වුණා. ඒකයි ප්‍රශ්නය තිබෙන්නේ. නමුත් ඒවා වැරදි හින්දා තමයි මම හැමදාම කියන්නේ. ඒ ආණ්ඩු ගෙදර යැව්වා නම්, ඊට වැඩිය හොඳ ආණ්ඩු පත් කර ගත්තා නම් ඒක යන්න ඕනෑ ඊට වැඩිය හොඳට. ඔබතුමන්ලා දෙපළම අපේ හිටපු ඇමතිතුමාත්, කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාත් මේකට මැදිහත් වුණු අය. අද බෞද්ධයෝ ගැන කථා කරනවා. කළු අශ්වයෙක් කියනවා. අශ්වයාව හදන්න ඔය තැනට ගෙනාවේ කවුද? ඔය අශ්වයාත් මේ පාටම තමයි ඉස්සර තිබුණේ. නමුත් අද කළු අශ්වයෙක් විධියට හදලා ගෙනැල්ලා, ඒ අයම කෑ ගහනවා. පුදුම ලැජ්ජා නැති වැඩක් වෙලා තිබෙන්නේ. ආණ්ඩු හදන්න කෑගැහුවා. යහපාලනය අරෙහේ මෙහේ කියලා. ඒ තුළින් තිබෙන වැරදි කියලා මෙතැන අඬනවා. මෙතැන අඬලා වැඩක් තිබෙනවාද?. ගිහිල්ලා හදපු නායකයන්ට කියන්න ඕනෑ. නායකයින්ට කිව්වා නම් තමයි වටින්නේ. මේක අපට කියලා වැඩක් නැහැ නේ? ඔබතුමන්ලානේ ඒවායේ කටයුතු කළේ? එහෙම වැඩ පිළිවෙළක් තුළ මේ පළාත් සභාව කොයි ආකාරයට ඉස්සරහාට යයිද කියලා මම විශ්වාස කරනවා.

ඒ නිසා මම සංහිඳියාව ගැන කියනවා. මේ ව්‍යවස්ථාව වෙනස් වෙන්න ඕනෑය කියනවා. ව්‍යවස්ථාව හදන්නඕනෑ - හොඳ දියුණු රටක් වෙලා නම් ඇත්තටම ඒකට ගැලපෙන ව්‍යවස්ථාවක් හැදුනාට කමක් නැහැ. දියුණු වෙන රටක් තුළ මම හිතන්නේ, මේ ව්‍යවස්ථාව හොඳටම ඇතියි කියලයි. කෙසේ වෙතත් ඉහළ නායකයෝ තම තමන්ගේ අවශ්‍යතාවය, තම තමන්ගේ පෞද්ගලික වැඩ පිළිවෙළ තුළ, අනික් අය මෙහෙයවන වැඩ පිළිවෙළ තුළ මේ කටයුතු කරන්නේ. මම හිතන්නේ, අපි මේ මොන තරම් බස්නාහිර පළාත් සභාවට සේවය කරන්න, මේ රටේ ජනතාවට සේවය කරන්න උත්සාහ ගත්තත් දැනුවත්ව හෝ නොදැනුවත්ව පවතින මේ අධිකරණ භීෂණය - එදා අපට යුධ භීෂණය තිබුණා. එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණ හෝ වේවා. වෙනත් භීෂණ තිබුණා. අද මේ අධිකරණ භීෂණය තුළ මම හිතන්නේ, මිනිස්සුන්ට ලොකු සේවයක් කරන්න අපට පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා මම නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යමණ්ඩලයට මේ දුන්න සහයෝගයම හොඳ ප්‍රයෝජනයට අරගෙන, ජනතාවගේ ඔලුවට බර නොවැටෙන වැඩ පිළිවෙළක් තුළ බස්නාහිර පළාත් සභාව ඉදිරියට ගෙනියන්න, ඒ ජනතාවට සේවය කරන්න සහයෝගය, ශක්තිය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

[පූ.භා.10.36]

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විසර්ජන ප්‍රඥප්තිය විවාද වන අවස්ථාවේ බස්නාහිර පළාත් සභාවේ 2017 අයවැය වෙනුවෙන් මම විශ්වාස කරනවා, අපේ හැසිරීම පිළිබඳව ප්‍රතිපත්තිමය පැහැදිලි කිරීමක් ඕනෑය කියලා. මේ කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා හරහාත් එහෙම එකක් අවශ්‍ය වෙලා තිබෙනවා වාගේ පේනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිය 2016 අයවැය වෙනුවෙන් අමාත්‍යාංශ වැය ශීර්ෂ සඳහා බෙදීමක් ඉල්ලා සිටියත්, මෙවර එම ක්‍රියාමාර්ග වෙනස් කිරීමට අපි ගත් තීරණය මත තමයි, අපි විශ්වාස කරන්නේ මේක ඕනෑය කියලා. මොකද, කනින් කොනින් අපට ඇහුණු කථා ටිකක් තිබෙනවා. මට මතකයි. ප්‍රධාන අමාත්‍යාංශ වැය ශීර්ෂයට අපි බෙදීමක් ඉල්ලුවේ නැති වුණාට පස්සේ, මෙන්න මේ පිටිපස්ස පැත්තෙන් ඇහුණා, "*අපි හිතුවේ ජේවීපී එක සල්ලිවලට ගන්න බැහැයි*
[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

*කියලා.*" අන්න එහෙම කථාවක් ඇහුණා. අපි ඒවාට ඒ වෙලාවේ උත්තර දෙන්න ගියේ නැහැ. මොකද, ඒකට උත්තර දෙන්න වෙලාවක් එන නිසා. ඒ වාගේම තමයි දැන් මෙතුමා කියපු විධියටත්, ඊට ඉස්සෙල්ලාත් ඇහුණු දේවල් තමයි, පාර්ලිමේන්තුවේ විරුද්ධ වෙනවා. පළාත් සභාවේ සපෝට් කරනවා. අන්න ඒ වාගේ කතන්දර ටිකක් ඇහුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම කියන අය එසේ කීමට හේතුව, මේ අපේ තීන්දු මත යැපෙමින්, තම පටු දේශපාලන උවමනාවක් ඉටු කර ගැනීමට ඉඩක් සොයමින් ඉන්න පිරිසක් සිටීමයි. ඒගොල්ලෝ අපි ගන්න තීන්දුව මත තමයි ඒ තැනට ප්‍රවිෂ්ට වෙන්නේ. එතකොට එහෙම හිටපු අයගේ ඒක කර ගන්න බැරි වුණු වේදනාව මිසක්, එහෙම නැතිව මේ ජනතා විමුක්ති පෙරමුණ තීන්දු අරගැනීම පටලවාගෙන හරි වේදනාවක් වාගේ එහෙම එකක් නොවෙයි. එහෙම ප්‍රශ්නයක් නොවෙයි ඔය තියෙන්නේ. ජේවීපී එකට මොකක් හරි වැරදිලා. ඒ නිසා මේක මාර ප්‍රශ්නයක්. ජේවීපී එක තමයි වරද්දවා ගන්නේ නැතිව ඉන්න ඕනෑ. ඒ නිසා මේ ඒගොල්ලන්ට වරදින එක හොඳ නැහැ. එහෙම එකක් නොවෙයි. එහෙම අවංක එකක් නොවෙයි ඔය තිබෙන්නේ. ඔය තිබෙන්නේ අර මම කියපු ආකාරයේ අපේ තීන්දු මත යැපෙමින්, සමහර සමහර තැන්වලට ප්‍රවිශ්ට වීම සඳහා සූදානමින් ඉන්නවා. ඉතින් අපි ඒවා සම්බන්ධව හොඳට අධ්‍යයනය කරනවා. ගියවර වුණු දේවල්, අරෙහේ මෙහේ වුණු දේවල් හැම දෙයක්ම අපි අධ්‍යයනය කරනවා. ඒක මත තමයි, අපි තීන්දු තීරණ ගන්නේ. අපි ගල් ගැසුණු දේශපාලන පක්ෂයක් නොවෙයි. ඒ නිසා අපි ඒ කාලයට, ඒ ඓතිහාසිකව, විෂය මූලිකව, අනික් කරුණුත් එක්ක අන්තර් සම්බන්ධිතව තමයි අපි අපේ තීන්දු තීරණ ගන්නේ. ඒ නිසා තමයි ගරු මන්ත්‍රීතුමා, අපට අරහේ මෙහේ වැරදීමක්නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපි දන්නවා. ගියවර සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පරාජය කිරීමට, ඒ වැය ශීර්ෂ සඳහා අපි කටයුතු කරපු ආකාරය ඒකට උදව්වක් වුණා. මට මතකයි. එදා ඒ මොහොතේ ඒ වැය ශීර්ෂය පරාජයට පත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලා අතරේ ගියා. ඒ වැඩ පිළිවෙළ එහෙන් මෙහෙන් අපි ඉස්සරහාටත් ඇවිල්ලා තිබුණා. ඒ වෙලාවේ මට මතකයි. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ හිටපු ගරු ඇමතිතුමා,මම උදේ ඇවිල්ලා මෙතැන ඉඳගෙන ඉන්න කොට සභාව පටන් ගන්න ඉස්සෙල්ලා. එතුමාට මතකද දන්නේ නැහැ. මෙතැනට ඇවිල්ලා ඇහුවා, ලක්ෂමන් මේ වැය ශීර්ෂය සම්බන්ධව මොකද කරන්නේ කියලා. මම එතුමාට ඒ වෙලාවේ බොහොම කරුණු පැහැදිලි කිරීමක් කළා. ගරු ඇමතිතුමා, අපි ප්‍රතිපත්ති තීන්දුවක ඉඳන් තමයි කටයුතු කරන්නේ අපි තීන්දු තීරණ ගන්නේකියලා. ඒ නිසා අපි ඒ වෙලාවට ඒ තීන්දු වෙනස් කරන්නේ නැහැයි කියන එක අපේ පැත්තෙන් අපි පැහැදිලි කිරීමක් කළා. එතකොට දැන් අපි මේ මොහොතේ, අපි මේ ගැන හිතන්න ඕනෑ. අපි බැලිය යුතු දේ වන්නේ දැන් ඒකෙන් මොකද වුණේ? දැන් ඒකෙන් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු ඇමතිතුමාට බැරි, සුමිත් ලාල් මැන්දිස් ඇමතිතුමා ඇති කරපු සෞඛ්‍ය දැන් කොහේද තිබෙන්නේ? අපි කල්පනා කරලා බලන්න ඕනෑ. දැන් තමුන්නාන්සේලා එතුමාගේ වැය ශීර්ෂය පරාජයට පත් කළා. එතුමාව යැව්වා. අපි අහන්නේ, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු ඇමතිතුමාට කරන්න බැරි, සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමා කරපු දෙයක් තිබෙනවාද? මොකක්ද? එයා සෞඛ්‍ය වෙනුවෙන් කරලා තිබෙන්නේ. අන්න ඒක තමයි අපට හිතන්න වෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සුමිත් ලාල් මැන්දිස් ඇමතිතුමාගේ සෞඛ්‍ය හොඳයිද?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

හොඳයි. එයාගේ සෞඛ්‍ය හොඳයි. ඉතින් ඒ වාගේම තමයි දැන් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ඇමතිතුමා ඉවත් කරලා හදා ගත්තු ඒ සෞඛ්‍ය අමාත්‍යාංශයත්, පරාජය නොකළ ඉතිරි අමාත්‍යාංශ හතරත් බස්නාහිර පළාත් ජනතාවට සංවර්ධනය රැගෙන ආවාද? ඉතිරි හතර දෙනා පළාත් සභාවට සංවර්ධනය ගෙනාවාද? ඔබතුමන්ලා ඒවා ජයග්‍රහණය කෙරෙව්වානේ? අරක පරාජයට පත් කළා. ඉතින් තමුන්නාන්සේලාට මොකක් හරි වෙනසක් දැණුනාද? ඒ ඒ මට්ටමෙන් වෙනස දැණුනු අය ඇති. මම කථා කරන්නේ එහෙම නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. බස්නාහිර පළාතේ ජනතාවගේ පැත්තෙන්, ඒ පළාත් සේවය පැත්තෙන් වෙනසක් වෙලා තිබෙනවාද? ඒක ජනතාවට කොහොමද දැනිලා තිබෙන්නේ? ඒ නිසා මෙවරත් අපට තීරණය කරන්න තිබුණා, සමහර විට රංජිත් සෝමවංශ ඇමතිතුමා යටතේ පාසල් කීයක් වහනවාද? එතුමා හැර හෙක්ටර් බෙත්මගේ ඇමතිතුමා යටතේ පාසල් කීයක් වහනවාද කියලා ඕනෑ නම් තීරණය කරන්න තිබුණා. අපි අර කලින් ගිය තීරණයට ගියා නම්, සමහර විට අද මේ මොහොත වන කොට ඔය තත්ත්වය නිර්මාණය වෙලා තිබෙන්න පුළුවන්. රංජිත් සෝමවංශ ඇමතිතුමා නැහැ. හැබැයි, හෙක්ටර් බෙත්මගේ මැතිතුමා යටතේ - හැබැයි, රංජිත් සෝමවංශ ඇමතිතුමා යටතේ පාසල් වැහෙන්න යනවා නම්, ඒකම තමයි හෙක්ටර් බෙත්මගේ

ඇමතිතුමා යටතේත් වෙන්න තිබෙන්නේ. ඒ නිසා මට පැහැදිලි කර ගන්න උවමනවා තිබුණේ වෙන එකක් නොවෙයි. අපට පුද්ගල ප්‍රශ්නයක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පුද්ගලයෝ වෙනස් කරලා හදා ගන්න පුළුවන් දෙයක් ඉතිරි වෙලා නැහැ. ඒකයි මේ වෙලා තිබෙන්නේ. මේක තමයි මේ ධනේෂ්වර දේශපාලනයේ කාර්යභාරයේ අවසානයක් මේ තිබෙන්නේ. අපි කොයි පැත්තෙන් කොහොම හදන්න හැදුවත්, අපට මේක හරි තැනකට ගේන්න බැහැ. පාර්ලිමේන්තුවේ වෙලා තිබෙන්නේත් මේක. ඇත්තටම ඒ නිසා ඒ කාර්යභාරය අවසන්. ඒකයි මේ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඇත්තටම අපි මෙහෙම බැලුවොත් එහෙම. දැන් ප්‍රධාන අමාත්‍යතුමා, එතුමා හිතා ගෙන ඉන්නවා, තමන් හරි වේගයෙන් ධාවනය කරනවාය කියලා. තමන්ගේ පැත්තෙන් වැඩේ. හැබැයි, එතුමාට මීටරේ උපරිම යන්න පුළුවන් 70 ක වාහනයක් තිබෙන්නේ. උපරිම 70 යි.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Kamal Kuruppu

මේ ගොල්ලෝ දන්නේ -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

මෙතුමා එපමණ දකින්නෙත් නැහැ. මෙතුමා මන්ත්‍රී කෙනෙක්ද? මම අදමයි දැක්කේත්. මට බාධා කරන නිසා හොඳයි. එහෙම හරි බාධා කරන්න. ඇත්තටම මම මෙතුමාව දැකලා නැහැ. මම මේ දැන් දැක්කේ.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Kamal Kuruppu

පල්ලෙහා සෞඛ්‍ය කඳවුරක් තිබෙනවා. ගිහිල්ලා ඇස් දෙක බලාගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා ඇත්තටම සමහර වෙලාවට අපි පාරේ යන කොට සමහරු හිතනවා. තමන් ධාවනය කරන වාහනය තමයි මම තමයි හයියෙන්ම යන්නේ කියලා. මොකද, ඇත්තටම එයාගේ වාහනය යන්න පුළුවන් 70 ට. එතකොට 70 වට යන කොට කීක් කීක් ගාලා සද්දයක් එනවා. ආ මම තමයි හයියෙන් යන්නේ. හැබැයි එයා දන්නේ නැහැ. පිටිපස්සෙන් එනවා 120 ට යන්න පුළුවන් වාහනයක්. 120 ට යන්න පුළුවන් වාහනයේ එන ඩ්‍රයිවර් කල්පනා කරනවා, මේ යකා මොකද මේ මැද්දේ තියාගෙන යන්නේ. අයි අපට ඉස්සර කරන්න දෙන්නේ නැත්තේ කියලා. ඉතින් ඒ නිසා මේක මහ ඇමතිතුමාගේ වැරද්දවත්, පුද්ගලික ප්‍රශ්නයකුත් නොවෙයි. මේ ඩ්‍රයිවර්ගේ ප්‍රශ්නයකුත් නොවෙයි, ඇත්තටම තිබෙන්නේ. ඩ්‍රයිවර්ගේ ප්‍රශ්නෙකුත් අරෙහේ මෙහේ තිබෙනවා. නමුත් අපට හම්බ වෙලා තිබෙන වාහනය එහෙමයි. ඒ නිසා දැන් මේ වාහනය පොඩ්ඩක් පැත්තකට අයින් කරලා, ටිකක් 120 ට වාගේ යන්න පුළුවන් වාහනයක් පාරට දා ගන්න ඕනෑ. ඒක දා ගත්තොත් ඊට පස්සේ, අපට 190 කට විතර යන්න පුළුවන් වාහනයකුත් පස්සේ හිතලා දා ගන්න පුළුවන්. ඒ නිසා මේක තමයි අපේ රටට වෙලා තිබෙන අලකලංචිය. ඒ නිසා මේ පළාත් සභාවේ මේ සම්මත කරන අයවැය හරහා, පළාතේ ජනතාවට කරන්න ඕනෑ, බලාපොරොත්තු වන උපරිම සේවය අපට කරන්න බැහැ. වෙන්න ඕනෑ සේවය කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා අපි විශේෂයෙන්ම වැය ශීර්ෂ සම්බන්ධයෙන් අපි කල්පනා කළේ මේකේ තිබෙන පුද්ගලයින් සම්බන්ධව ඇමතිකම් එහාට මෙහාට හදා ගැනීමේ, මාරු කිරීමේ - ඒ නිසා තමයි අමාත්‍ය මණ්ඩලය සාමූහිකව කටයුතු කරන්නේ නැත්තේ. ඒ නිසා ඒ තරගයට අපිව අවශ්‍ය නැහැ. එතැනට ඒ තරගයට ප්‍රවිශ්ට වීමක් අපි කරන්නේ නැහැ. ඒ නිසා තමයි අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ අපි පැත්තකට වෙලා හිටියේ. ඕගොල්ලන්ට ඕනෑ එකක් කර ගන්න කියලා. නමුත් මේ විසර්ජන ප්‍රඥප්තිය තමයි පළාත් සභාවේ බලය තීන්දු වෙන, එහෙම නැත්නම් පළාත් සභාව සම්බන්ධව ඇත්ත තීන්දුව තිබෙන්නේ මේ විසර්ජන ප්‍රඥප්තිය යටතේ. ඒ නිසා අපි පක්ෂයක් හැටියට තීන්දු කරලා තිබෙනවා, මේ විසර්ජන ප්‍රඥප්තියේදී අපේ ඡන්දය විරුද්ධව පාවිච්චි කරන්න. අන්න එතැනට තමයි අපි මේ පළාත් සභාවේ කටයුතු කළේ. ඒ නිසා කවුරු හරි හිතනවා නම්, අපි මේ ගත් තීන්දු

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

තීරණවලට මොකක් හරි කුකුසක්. මම විශ්වාස කරනවා, ඒ කුකුස දැන් නැති වෙලා ඇතියි කියලා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.10.49]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා සිය මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරමින්, 2017 වර්ෂයේ ජනවාරි 01 වැනිදා ඉඳලා දෙසැම්බර් 31 වැනිදා දක්වා කාලය තුළ තමන්ගේ මුදල් වර්ෂය තුළ මුදල් වියදම් කිරීමේ අවසරය මෙම විසර්ජන ප්‍රඥප්තිය මගින් අපේක්ෂා කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාවේ අයවැය විවාද ගණනාවකට සහභාගී වුණු මන්ත්‍රීවරයෙකු හැටියට මට මතක් වුණා, 1988 – 1993 පළාත් සභාවේ එවකට හිටපු විපක්ෂ නායක ඔසී අබේගුණසේකර මැතිතුමා කරපු ප්‍රකාශයක් පිළිබඳව. එතුමන්ලා කොපමණ බුද්ධිමත්ව මේ සභා ගර්භය තුළ තමන්ගේ වාග් ප්‍රහාර මතු කළාද කියනවා නම්, එවකට හිටපු රජයේ ප්‍රධානම ව්‍යාපෘතිය වුණේ, උදාගම් සංකල්පය. මේ සංකල්පය තුළ මහා දැවැන්ත මරණාත්මක දේශනයක් ආණ්ඩු පක්ෂය කළාම, විපක්ෂ නායකතුමා කියනවා. මැගී අක්කා තමන්ගේ අතට අහු වුණු පරාල ඇණය බිත්තියේ ගැහුවාම පෙනේරේ එල්ලන්න පූට්ටු ගෙදර එහා පැත්තේ ඉන්න ජෙසී අක්කා කුල්ල එල්ලනවාලු ඒ ඇණේ අනික් කොනේ. උදාගම්වල ප්‍රමිතිය පිළිබඳව එතුමා ඒ විධියට තමයි එදා ප්‍රකාශ කළේ. අද මේක කියාගන්න ගියා නම්, මේ සභාවේ මහා කාලගෝට්ටියක්. රණ්ඩුවක්. එදා මොන තරම් ගැඹුරින් මේ කටයුතු අධ්‍යයනය කරලා, මොන තරම් වැදගත් විධියට මේ සභාව හසුරුවලා තිබෙනවාද කියන කාරණාව පිළිබඳව අපට එයින් පැහැදිලි වෙනවා.

ඒ වාගේම මට මතකයි, 1993 – 1999 පළාත් සභාවේදී වජිර පැල්පිට ගරු මන්ත්‍රීතුමා. දවසක් මේ සභාවේ මන්ත්‍රීවරයෙක් එතුමාට බොහොම හිංසා කළා.එතුමා කලක් පැවිදි බිමේ ඉඳලා පසුව තමයි දේශපාලනයට ප්‍රවේශ වෙන්නේ. දැන් ඒක පුන පුනා කියනවා. එතුමා ඉතාමත් සිනහමුසුව කිව්වා. ගරු සභාපතිතුමනි, මේ කථා කරන මන්ත්‍රීවරයා තමන්ගේ පුටුවට මොළේ තද කර ගෙනයි ඉඳගෙන ඉන්නේ. ඒ නිසා මේ රෝගය හොඳ කරන්න නම් අර්ෂශ් රෝගයට බෙහෙත් කරන වෛද්‍යවරයෙක් සොයලා දෙන්න ඕනෑය කියලා. ඒ විධියට බොහොම උපහාසාත්මකව, අර ඇති වුණු ආවේග මර්දනය කර ගෙන, ඉතාමත් ගැඹුරු දර්ශනයක් තුළ හැසිරුණු ඇමතිවරු,මන්ත්‍රීවරු මේ හැන්සාඩ් වාර්තා කියවන කොට අපට දකින්නට,අහන්නට පුළුවන්කම තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරුතර ස්වාමීන් වහන්සේ දන්නවා. අපේ නිකායික මහා නායක හිමිවරු ඉන්නවා. විවිධ ආගම්වල නායකයෝ ඉන්නවා. මේ ආගම් නායකයෝ, මහා නායක ස්වාමීන් වහන්සේ වුණත් උපසම්පදාවෙන් ජ්‍යෙෂ්ට ස්වාමීන් වහන්සේට වන්දනා කරනවා. ඒක තමයි සාමාන්‍ය රීතිය. දැන් මෙතැන මේ පල්ලෙහා කෑම කන්න දෙනවා. අපි ගිහිල්ලා බල්ලන්ට කෑම දැම්මා වාගේ හැසිරෙන්නේ නැහැ. එකිනෙකා, එකිනෙකා පිටිපස්සේ ගිහිල්ලා කෑම ටික බෙදාගෙන කනවා. කටට කොපමණ කෙළ ඉනුවත්. බඩගින්න වැඩි කෙනාගේ කටට වැඩියෙන් කෙළ උනනවා. ඒක තමයි ශිෂ්ට සම්පන්න සමාජ ක්‍රමයක ව්‍යුහය. අද සමහර මන්ත්‍රීවරු ඉන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, භූමිතෙල් පොකුණකින් ස්නානය කරලා ගොඩ ආපු ගැරඬි රජෙක් වාගේ ජ්‍යෙෂ්ටත්වය ගැන කථා කළාම දඟලනවා. ඉතින් සභාව තුළ මේ විනය පිරිහීම නිවැරදි කර ගැනීම යහපත් හෙට දවසක් වෙනුවෙන් අත්‍යාවශ්‍ය වැදගත් කාරණාවක් බවට පත් වෙනවා. මේක තමයි ඇත්ත කාරණාව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දවසේ අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙම විසර්ජන ප්‍රඥප්තිය මගින් 2017 මුදල් වර්ෂය සඳහා රුපියල් මිලියන හැට එක්දහස් දෙසිය හැත්තෑ හයක මහා මුදල් සම්භාරයක් වියදම් කරන්න අනුමැතිය ඉල්ලනවා. මෙයින් රුපියල් මිලියන පනස් හතර දහස් එකසිය හැට හතරක් පුනරාවර්තන ආයෝජන. පුනරාවර්තන වියදම් සඳහා යොදවනවා. ප්‍රාග්ධන වියදම් හැටියට ඉතිරි වෙලා තිබෙන්නේ, රුපියල් මිලියන හත් දහස් එකසිය දොළහක් පමණයි. දැන් මේකෙනුත් අපට තිබෙනවා ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2016 වර්ෂයේ ප්‍රාග්ධන ආයෝජන රුපියල් මිලියන 17,747 ක් වන කොට 2017 වර්ෂයට ප්‍රාග්ධන ආයෝජන හැටියට අපට ලැබිලා තිබෙන්නේ, රුපියල් මිලියන 14,866 යි.ඒ කියන්නේ, රුපියල් මිලියන 6877 ක හිඟයක් තිබෙනවා. මේ හිඟය පියවා ගැනීම සඳහා අපි කරුණු විමසුවාම,භාණ්ඩාගාරයේ නිලධාරීන් කියනවා. 2016 වර්ෂයේ ගුරුවරුන්ගේ හිඟ වැටුප් ගෙවීම සඳහා රුපියල් මිලියන 3500 කට ආසන්න මුදලක් වැඩිපුර ආදායමක් හැටියට ඒ වර්ෂයේ ලැබුණා. දැන් ඒ ප්‍රශ්නය නැති නිසා මේ අවුරුද්දට ඒක ලැබෙන්නේ නැහැ. එතකොට තුන් දාහක් අඩු වෙනවා. ඊළඟට කොහොමද මේ ඉතිරි මිලියන තුන් දහස් ගණන පියවා ගන්න මේ අය උත්සාහ කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය මේක පියවා ගන්න උත්සාහ කරන්නේ ජාතිය ගොඩ නැඟීමේ බද්ද වැඩි කරලා. ජාතිය ගොඩ නැඟීමේ බද්දෙන් 2016 වර්ෂයේ ආදායම වෙලා තිබෙන්නේ, රුපියල් මිලියන 12,268 ක් පමණයි.

මෙවර යෝජනා කරනවා, මෙයින් ආදායම හැටියට රුපියල් මිලියන 16,080 ක්. එතකොට මෙතැන මේ හිඟය පියවා ගන්න හදන්නේ කොහොමද? එක්කෝ ජාතිය ගොඩ නැඟීමේ බද්ද වැඩි කරන්න ඕනෑ. එතකොට මේ බද්ද වැඩි කළාම, මේ බදු බර කාටද එකතු වෙන්නේ. මේ රටේ ජීවත් වන අහිංසක ජනතාවට මේ බදු බර එකතු කරලා තමයි මේ පුනරාවර්තන වියදම් හිඟය පියවා ගන්න පළාත් සභාවට උපදෙස් ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පැහැදිලිව දකින කාරණාවක් තිබෙනවා. මේ පළාත් සභාව, මේ ආකාරයෙන් මුදල් ආයෝජනය කරලා, තම තමන්ගේ අමාත්‍යාංශවල මුදල් හදල් ටික බෙදාගෙන, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වයෙන් මේ මුදල් වියදම් කරන කොට, මේ මුදල් වියදම් කිරීමේ ප්‍රතිපත්තිය ඉතාමත් සීමා සහිත ප්‍රාග්ධන ආයෝජනයක් තුළ මේ පළාත් සභාව වර්ෂයක් ගත කරනවා. ඒ වර්ෂය තුළ ඉතාමත් ගුණාත්මක සංවර්ධන ඉලක්ක කරා යොමු වෙන්න නම්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැඩ සටහන සහ අමාත්‍ය මණ්ඩලයේ වැඩ සටහන ඉතාමත් ප්‍රායෝගික වැඩ සටහනක් බවට පත් වෙන්න අවශ්‍යයි. දැන් මට මතකයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මම අමාත්‍යාංශයේ ඉන්න කාලයේ මට කොලොප්පම් කරනවා. උදේ ඉඳන් හවස් වෙනකල් ඇමතිතුමා, තමුන්නාන්සේගේ සංකල්ප. මේ සංකල්පවලින් මොනවාද? කරන්නේ කියලා අහනවා. දැන් මම හිතන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒක අධ්‍යයනය කරමින් සිටිනවා. ඔබතුමාට පැහැදිලිව දැනෙන්න ඇති. අපට අනාගතයේ මුහුණ දෙන්න තිබෙන ප්‍රශ්නය ගැන අපි එදා කථා කළා. අපි එදා කථා කළා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ මිනිස්සුන්ට ප්‍රධාන වශයෙන් මුහුණ දෙන්න සිද්ධ වෙනවා බෝ නොවන රෝග සම්බන්ධව. විශේෂයෙන් බෝ නොවන රෝගවලින් දැවැන්ත ආපදාවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒකට අපි දැන් දැන්ම පිළියම් සොයන්න වෙනවා කියලා. අපි ඒකට අවශ්‍ය කරන සැලසුම් සකස් කළා. ඒවා ප්‍රායෝගිකව ගමක් ගමක් ගානේ ගිහිල්ලා, ආයතනයක් ආයතනයක් ගානේ ගිහිල්ලා ක්‍රියාත්මක කළා. ඒවා පිළිබඳව මධ්‍යම ආණ්ඩුවත් අවදි වන තත්ත්වයට, අපට පළාත් සභාවට පුළුවන් වුණා මේ ව්‍යාපෘති සක්‍රීය කරවන්න. ඒ නිසා අපට පෙර දැක්මක්, අනාගතය පිළිබඳව දැක්මක් නියත වශයෙන්ම මේ අමාත්‍යාංශ හරහා කටයුතු කිරීමේදී අත්‍යවශ්‍ය වෙනවා.

ඒ වාගේම ඔබතුමන්ලාට මතක ඇති, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ 1999 දී අපි එළිදැක්වුවා "අපේ පාසල අපේ දෑතින් සුරකිමු" කියලා වැඩ සටහනක්. ඒ වර්ෂයේ රුපියල් හත් ලක්ෂ තිස් අට දහසක් ආයෝජනය කරලා, පානදුර අධ්‍යාපන කොට්ඨාශයේ පාසල් 42 ක් අතර අපි ලක්ෂ 98 ක වැඩ කළා. වැඩ කරලා, ආදායම් ඉලක්ක තුළ පළාත් සභාවට දැවැන්ත ලාභයක් අත්පත් කරලා දුන්නා. ඒක සමස්ත පළාත් සභාවේ පමණක් නොවෙයි. එවකට මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යවරයා බවට පසුකාලීනව පත් වුණු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා සමස්ත ශ්‍රී ලංකාවේම මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා, අධ්‍යාපන අමාත්‍යාංශයට මහා දැවැන්ත වාසිදායක තත්ත්වයක් ඇතුළත් කළා. ඒ මෙන්න මේකයි. ජාතික ප්‍රතිපත්තියක් නැති රටක, පළාත පිළිබඳ මූලික සැලැස්මක් නැති පළාත් සභාවක, අනාගතයේ හැමදාම වෙනස්වීම් සිද්ධ වෙනවා. ඇමතිවරු පත් වුණාම සම්පූර්ණයෙන් වෙනස් වෙනවා. අවුරුදු ගණන ගෙවුණාම සම්පූර්ණයෙන් වෙනස් වෙනවා. මේ වෙනස් වීම ප්‍රායෝගිකව මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට මොන තරම් ගැඹුරින් බලපානවාද? ඔවුන්ට සුභවාදීව මේක හඳුනාගන්න පුළුවන් වෙනවාද? බැරි වෙනවාද? දැන් ඔබතුමා ඊයේ මට කථා කළා. ඩෙංගු රෝගයෙන් මැරුණු සම්පූර්ණ සංඛ්‍යාලේඛන මම ඊයේ ඉදිරිපත් කළා. මෙන්න මෙපමණක් දැන් මැරිලා තිබෙනවා. මෙපමණ රෝගීන් දැන් මුණගැහිලා තිබෙනවා. මේ රෝගීන්ගෙන් 2010 දී හමු වුණු රෝගීන් සංඛ්‍යාව අල්පයි. මරණ සංඛ්‍යාව ඊට වඩා මහා සනත්වයකින් වැඩියි. නමුත් දැන් අපි මේ විද්‍යාත්මක වශයෙන් ඉස්සරහාට දියුණු වෙන කොට, අපි මේ රෝග මර්දනය සඳහා, රෝගවලට භාජනය වූ මිනිසුන් මරණයෙන් නිදහස් කර ගැනීමට විවිධ උපක්‍රම යොදනවා. බරවා රෝගය මර්දනය කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සහ ජාතියටම ආවේණික මහා දැවැන්ත මුදල් සම්භාරයක් ආයෝජනය කරනවා. මිනිස්සුන්ගේ ජීවිත කෙළවර කරන ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා එවන් පුළුල් වැඩ පිළිවෙළක් නැහැ. දැන් මේක තමයි අපේ

[ගරු ජගත් අංගගේ]

මේ දැකීමේ තිබෙන දුර්වලකම. අපි නිවැරදිව දකින්නේ නැහැ. කළ යුතු කාරණාව පිළිබඳව පැහැදිලි දැකීමක් සහ ඉලක්ක නැහැ. ඒ නිසා අපි ආයෝජනය කරන මුදල් ප්‍රමාණය අල්පව හරි ඒවා, නිවැරදිව ආයෝජනය කිරීමේ ක්‍රමවේදය, සැලසුම් අපට දකින්න නැති නිසා තමයි මේ ව්‍යසනයට අපි මුහුණ දෙන්නේ. ගරු

නියෝජ්‍යසභාපතිතුමනි, තමුන්නාන්සේලා අපි කවුරුත් දන්නා කාරණාවක්. බස්නාහිර පළාත තමයි ශ්‍රී ලංකාවේ වැඩිම ජන සනත්වය තිබෙන බල ප්‍රදේශය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

විනාඩියක කාලයක් තිබෙන නිසා මම වැඩියෙන් මාතෘකා යටතේ කථා කරන්න පටන් ගන්නේ නැහැ. විනාඩියක් ඇතුළේ කථා කරන්න තරම් දෙයක් නැති නිසා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ. බස්නාහිර පළාත කියන්නේ ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 28% ක් ජීවත් වන ප්‍රදේශය. මිලියන 5.8 ක්. මේ ප්‍රදේශයේ ජීවත් වන මිනිස්සුන්ගේ කොළඹ නගරය ගත්තොත්, ඉතාම ජනසනත්වය අධිකයි. ජන සනත්වය වැඩි නිසාම ගුවන් තොටුපල පිහිටා තිබෙන නිසාම, වරාය පිහිටලා තිබෙන නිසාම, රටේ සේරම ශ්‍රම බලකායම කේන්ද්‍රගත වන නිසාම, මේ වේගයෙන් පැතිරෙන වසංගත රෝග මුළු රටටම බෙදා හරින්නේ අපේ පළාතෙන්.

දැන් පසුගිය දිනවල මම දැක්කා පත්තරේක තිබෙනවා, ඩෙංගු රෝගය බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනේමඉහළින්ම තිබෙනවා. ඊට පස්සේ යාපනය, අම්පාර මේ වාගේ සමස්ත රට පුරාම විසිරිලා ගිහිල්ලා. ඒ නිසා මේවා පිළිබඳව බස්නාහිර පළාත තමන්ගේ නිසි වගකීම, නිවැරදිව දැරුවේ නැත්නම් මුළු ජාතියටම මේක ව්‍යසනයක් බව ප්‍රකාශ කරමින්, කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි. [පූ.භා.10.59]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියොජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම ගැන පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ අයවැය දවස් හයක් පුරාම මමත් බලාගෙන හිටියා. සාමාන්‍යයෙන් හැම අමාත්‍යාංශයකටම මෙතෙක් කල් කථා කරලා තිබෙනවා. නමුත් මගේ අදාළ අමාත්‍යාංශයට ඇරෙන්න මම කථා කළේ නැහැ. අපි මේ පනත සම්මත කරලා දෙන්නේ, අර අපේ හිටපු ඇමතිතුමා කිව්වා වාගේ මේ මුදල් කොහොමද වියදම් කරන්නේ කියලා. ඒ අවසරය තමයි ලබා දෙන්නේ. දැන් මේ අවසරය ලබා දෙද්දී, පසුගිය වසර පුරාම මේ මුදල් වියදම් කරපු හැටි ගැන බැලුවොත්, අවංකවම මම හිතන්නේ නැහැ, අපට මේකට ඡන්දයක් දෙන්න පුළුවන් කියලා. මොකද, අපට විශේෂයෙන්ම විශාල අසාධාරණ සිදු වෙලා තිබෙනවා. විපක්ෂයක් හැටියටත්, ඒ වාගේම අපි නියෝජනය කරන ජනතාවටත් විශාල අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. අපට අමාත්‍යාංශයකට ගිහිල්ලා වැඩක් කර ගන්න ඇත්තටම තවමත් බැරි වෙලා තිබෙනවා. තවම එක වැඩක්වත් කර ගෙන නැහැ. අපට ලබා දෙනවා කියපු ඒවා වුණත් තවම අපට හම්බ වෙලා නැහැ. ඒක පැහැදිලිවම කියන්න ඕනෑ. හැමදාම ලැබෙනවා, ලැබෙනවා කිව්වාට තවම කිසිම දෙයක් ලැබිලා නැහැ. ඒ නිසා අපි හිතන්න ඕනෑ.

මම විශේෂයෙන්ම මතක් කරලා දෙනවා. මම මීට පෙරත් කිව්වා වාගේ. අර අපි නියෝජනය කරන ප්‍රදේශයේ ඒ පාසලේ පන්ති හතරක් ඒ දරුවන් තවමත් එළියේ තමයි ඉගෙන ගන්නේ. උසස් පෙළ, සාමාන්‍ය පෙළ පන්ති හතරක්. මෙතෙක් කල්. දැන් මේ බිල්ඩිමට මුදල් ගන්න අපි කොපමණ මහන්සි වුණාද? කොපමණ බාධා ඇති වුණාද? ඒවා තවමත් වැළකිලා තිබෙන්නේ. බැරිම තැන මට සිදු වුණා, අපේ අකිල ඇමතිතුමා ළඟට ගිහිල්ලා, ඒ පාසලේ මේ ගොඩනැගිල්ල හදන්න ඒ මුදල් ටික ඉල්ල ගන්න. එතුමා ලක්ෂ 450 ක් වෙන් කරලා ඒ අවසරය ලබා දීලා තිබෙනවා. දැනටත් ඒ ඔක්කොම සම්මතත් වෙලා, මුදලුත් පාස් කරලා දීලත් තවම ටෙන්ඩරය දාන්නේ නැහැ. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇත්තටම අපි කොහොමද පළාත් සභාවක් හැටියට කටයුතු කරන්නේ. අපි පක්ෂ පාට බලලා, මේවා සම්මත කරලා දෙනවාද? අවශ්‍ය මුදල් ලබා දෙනවාද? එහෙම නැත්නම් අපේ පළාතේ සිටින ජනතාව වෙනුවෙන්, එහෙම නැත්නම් දූවා දරුවා වෙනුවෙන් කල්පනා කරලා ඒ අවශ්‍ය මුදල් ටික ලබා දෙනවාද කියන එක ගැන අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපේ පක්ෂයේ තීන්දුවක් හැටියට ඡන්දය දෙන්න කියලා අපට ඉල්ලීමක් කරලා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් ඒ ඡන්දය ලබා දෙනවා. නමුත් අපි විශ්වාස කරනවා. ලබන වසරේ මේ තත්ත්වය වෙනස් වෙයි කියලා. මේ තත්ත්වය වෙනස් වුණේ නැත්නම් අපට ඇත්තටම විශාල ප්‍රශ්නයක් තිබෙනවා.

මොකද, යහපාලන රජයක් බිහි කරලා, අද අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර ගරු මන්ත්‍රීතුමා කෑ ගැහුවා. මම කනගාටු වෙනවා. මම යහපාලනයේ ඉඳගෙන මේ කළු පටිය බැඳ ගත්තේ, අපට ප්‍රතිපත්තියක් තිබෙන නිසා. යහපාලනයේ ඉන්න කාලයේ අපි උද්ඝෝෂණ කළා. බෝඩ් උස්සාගෙන හිටියා. මාධ්‍යවේදීන්ට ගහද්දී, අපි මාධ්‍යවලට ගිහිල්ලා ප්‍රකාශ කළා. හැබැයි, අද එහෙම වෙද්දී අපට කට වහගෙන ඉන්න බැහැ. ප්‍රතිපත්තියක් තිබෙන දේශපාලනයේ ඉන්න අය හැටියට අද එහෙම වෙද්දී අපි කට වහගෙන ඉන්නවා නම් අපි කුහකයෝ වෙනවා. ඒ නිසා මම කනගාටු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ විශාල සටනක් ගෙන ගියා හිටපු ජනාධිපතිතුමාව බලයෙන් බිමට දාන්න. අද මේ සිද්ධ වුණු, මාධ්‍ය අයට පහර දුන්න එකට - ඒගොල්ලොත් විශාල වශයෙන් නැඟී සිටපු කට්ටියක්. හැබැයි, අද නිහඬව ඉන්නවා. අද මේ මන්ත්‍රීවරු ඒ වෙනුවෙන් කථා කරද්දී, ඒකට විරුද්ධවත් කථා කරනවා. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ හිටපු අමාත්‍යතුමා ගැනත්, දැන් ඉන්න අය ගැනත් මේ ඔක්කෝගේම වෙනසක් නැහැයි කියලා. ඉතින් වෙනසක් නැත්නම් ඇයි විරුද්ධ නොවී හිටියේ? ඒකත් ප්‍රශ්නයක්. ඒකත් ඇත්තටම ප්‍රශ්නයක්. එහෙම වෙනසක් නැත්නම් ඒ කියන්නේ එතුමන්ලාගේ ප්‍රතිපත්තිය තමයි වෙනස් වෙලා තිබෙන්නේ. ඒ ගැනත් අපි විශේෂයෙන්ම කනගාටු වෙනවා. අපට පක්ෂයෙන් කියලා තිබුණා, පක්ෂව ඡන්දයදෙන්නය කියලා. පාර්ලිමේන්තුවේත් පක්ෂව ඡන්දය දුන්නා. නමුත් මේගොල්ලන්ගේ එක කට්ටියක් විපක්ෂවත්, තව කට්ටියක් පක්ෂවත් කටයුතු කරන්නේ. ඊට පස්සේ මම දැක්කා ජා-ඇළ මාධ්‍යවේදීන් වෙනුවෙන් තිබුණු උද්ඝෝෂණයේ,පළාත් පාලන ආයතන නියෝජනය කරනමෙතුමන්ලාගේ මන්ත්‍රීතුමා කැමරාව ඉස්සරහාම හිටගෙන හිටියා. ඉතින් මම හිතන්නේ, මේකේ ලොකු පරස්පර වෙනසක් තිබෙනවා. ඒක ජනතා විමුක්ති පෙරමුණ පිළිගන්න ඕනෑ.අපි එතුමන්ලාවවිවේචනය කරන්න කැමැති නැහැ. අපි මෙතෙක් කල් හිතාගෙන හිටියේ ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ, ජනතාව වෙනුවෙන් පෙනී සිටින පක්ෂයක් හැටියට. නමුත් අද මේ පළාත් සභාව තුළ ඉතාමත් පැහැදිලිව මට නම් පෙනෙන්නේ, එතුමන්ලාවත් අවසානයේදී අපේ මහ ඇමතිතුමාගේ මුදල්වලට ලබාගත් බව ඉතාමත් පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, අපි මහ ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ, මේක සම්මත කරලා දෙනවා වාගේම ලබන වසර තුළ අපි ඔක්කොම, මුළු පළාත් සභාවේම දැන් එක තැනකට ඇවිල්ලා ඉන්නවා. බස්නාහිර පළාත් සභාවම. මේ මන්ත්‍රීවරු සියලු දෙනාටම එක හා සමානව සලකන්න පටන් ගන්නය කියලා මම ඉල්ලා සිටිනවා. සමහර තැන්වල අපට -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

දෙනවා. දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙනවා දෙනවා කියන එක නොවෙයි. ඒක ක්‍රියාවෙන් ඔප්පු කරලා පෙන්වන්න ඕනෑ. දැන් මගේ මන්ත්‍රී ප්‍රතිපාදන අපේ පළාත් පාලන ආයතනයක් විසින් මටත් නොකියා හරවලා අරිනවා. එහෙම තත්ත්වයක් අද පළාත් පාලන ආයතන තුළ උදා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම අපේ මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ඒ ගැන විශේෂයෙන්ම සලකලා සාධාරණයක් කරන්න. අපි දැන් සියලු දෙනාම යහපාලනයේ ඉන්නේ. සියලු දෙනාම ඉන්නේ මේ පළාතට වැඩක් කරන්න. පළාතේ ජනතාවට වැඩක් කරන්න. ඒ වෙනුවෙන් එතුමාගේ සහයෝගය සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.11.06]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ මොහොතේදී මේ මන්ත්‍රීවරු දින කිහිපයක් පුරාවට මේ අයවැය සම්බන්ධයෙන් විවිධ අදහස්, විවිධ

[ගරු නිරෝෂන් පාදුක්ක]

මතවාද, විවිධ යෝජනා මේ ගෞරවනීය සභාවට ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීවරු කථා කරපු සමහර විෂයයන් පිළිබඳව මේ කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරු දැනුමක් එයින් ලබා ගත්තා කියලා මම විශ්වාස කරනවා. කථාවක් තියෙනවා. කරපන්. කරලා දැන ගනින්. දැනගෙන කරපන් කියලා. ඒ නිසා මම හිතන්නේ ගිය අවුරුද්දම කළා. කරලා දැන් දැන ගත්තා. ඒ නිසා ලබන අවුරුද්දේ තිබෙන්නේ දැනගෙන

කරපන් කියන්නයි. ඒ නිසා ගරු නියෝජ්‍යසභාපතිතුමනි, මේ අමාත්‍ය මණ්ඩලයෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ ලංකාවේ ලොකුම පළාත් සභාව. මේකේ ගෞරවය රැකෙන විධියට අමාත්‍යවරු අතින් වැඩ වෙන්න ඕනෑ. පෞද්ගලිකව අපට ප්‍රශ්න නැතත්, මම මෙතැන ප්‍රශ්නයක් යොමු කරලා, ඉල්ලා අස් කර ගත් දවසක් තිබෙනවා. ඒ තමයි බස්නාහිර පළාතට කොළඹ දිස්ත්‍රික්කය අයිති බව ඔබතුමා දන්නේද කියලා ප්‍රශ්නයක් ඇහුවා එක්තරා ඇමතිවරයෙකුගෙන්. ඒ ඇමතිතුමා බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කය ඇහැට දැකලත් නැහැ. කොළඹ දිස්ත්‍රික්කය ගැන සොයන්නෙත් නැහැ. තමන්ගේ දිස්ත්‍රික්කය ගැන බලාගෙන ඉන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිවරුන්ට එහෙම කරන්න බැහැ. ඒ නිසා මේ ගෞරවනීය සභාව, පාර්ලිමේන්තුවට පමණක් දෙවැනි වන මේ සභාව ඉතාමත්ම වැදගත් සභාවක් විධියට අපි අනාගත අභියෝගවලට මුහුණ දෙන්න ඕනෑ. ඒ නිසා මෙතැන ඉන්න මන්ත්‍රීවරු කවුරුවත් තරහා වෙන එකක් නැහැ. ඉදිරියේදී මේ පළාත් සභාව 2017, 2019 අවුරුදුවලදී බොහෝ අභියෝගවලට මුහුණ දෙන්න වෙයි. අපි කවුරු කැමැති නැති වුණත්,HSBC බැංකුව හරහා ගත් ලෝන් දෙක 2019 දීත්, 2017 දීත් ඇමරිකානු ඩොලර් බිලියන තුන ගණනේ අපි මේ රට ගෙවන්න වෙලා තිබෙනවා. ඒ නිසා ඩොලර් බිලියන තුනයි කියන්නේ, අපේ මුදලින්,145 න් වැඩි කළාම බිලියන 500 ක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සියලු ගෙවීම් මහා භාණ්ඩාගාරය 2017 දීත්, 2019 දීත් ගෙවන්න වෙනවා. වාණිජ බැංකුවලින් ගත්ත ණය. එහෙම ගෙවන කොට මේ පළාත් සභාවලට ලැබිය යුතු ආදායම් අනාගතයේදී අඩු වෙයි. මේ අභියෝගවලට දේශපාලන පක්ෂවලට ඇඟිල්ල දික් කරලා මට කියන්න පුළුවන්,මේ ණය ගත් ක්‍රමවේද ගැන. ඒක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. අනාගත අභියෝගවලට මුහුණ දෙන්න බස්නාහිර පළාත් සභාවට වැඩ සටහනක්, පිළිවෙළක් තිබෙනවාද කියන කාරණය පිළිබඳව මේ කැබිනට් මණ්ඩලය වාඩි වෙලා කථා කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ කැබිනට් මණ්ඩලය කිව්වාම,මේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා ගන්න ඕනෑ. අපි මහ ඇමතිතුමාට ගරු කරනවා. නමුත් මම එතුමාගේ හෘද සාක්ෂියෙන් ඉල්ලා සිටිනවා. එතුමා කරපු අර ප්‍රකාශය එතුමාගේ අවසාන කථාවේදී ඉල්ලා අස් කර ගන්නවා නම් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීයි කියලා. මට මේකට ඡන්දය නොදුන්නොත් මන්ත්‍රීවරුන්ට - අල්ලස් නොවෙයි. එතුමා කිව්වේ ප්‍රතිපාදන දෙන්නේ නැහැ. මම දන්නේ නැහැ, අමාත්‍යාංශවලින් මුදල් වෙන් කරන්නේ නැද්ද කියන එක. ඡන්දේ දෙන්නේ නැති අයට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ මන්ත්‍රීවරු ඔක්කොම, මේ 104 ම පසුගිය අවුරුද්දේ මේ පළාත් සභාව දුවන්න උදව් කරලා තිබෙනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ අපට මේ පළාත් සභාව පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. අපි අපේ පක්ෂයත් එක්ක ගත්තාම, අපි ජනවාරි 08 වැනිදා බිහි කරපු ආණ්ඩුවේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එවකට මහ ලේකම්තුමා මේ රටේ ජනාධිපති කරන්න අපි කරපු රහස් සාකච්ඡා එකකවත් මේ පැත්තේ ඉන්න මන්ත්‍රීවරු, කාරියවසම් මහත්මයා හැර වෙන කවුරුවත් දන්නේ නැහැ. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මහත්තයාත් දන්නේ පස්සේ. (බාධා කිරීම්) මම දන්නවා, තමුන්නාන්සේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයාව පිළිගන්නේ නැහැ, නායකයා හැටියට කියලා. නමුත් ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමා හිතාගෙන ඉන්නවා, තමුන්නාන්සේත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පක්ෂයේ නායකයා කියලා පිළිඅරගෙන ඉන්නවා කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඉදිරිපස පේළිය එන කොට ජයනාත් මන්ත්‍රීතුමාගෙන් ඇහුවොත් හෘදය සාක්ෂියට එකඟව තමන්ගේ නායකයා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාද? මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාද කියලා. එතුමාගේ හෘදය සාක්ෂියේ පිළිතුර මොක්කද කියලා ඔබතුමා දන්නවා. ඒ වාගේම අපේ ආණ්ඩු පක්ෂයේ සභානායකතුමා.මේ ඉන්න මන්ත්‍රීවරු බහුතරයකගේ හෘදය සාක්ෂියෙන් ඇහුවොත්, මොකක්ද කියන්නේ කියන එක තමුන්නාන්සේ දන්නවා. ඒ නිසා අපි ජනවාරි 08 වැනිදා මේ රටේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපති බවට පත් කරද්දී, අප අතර තිබුණු එකඟතාවය මත අපි බස්නාහිර පළාත් සභාව එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු විධියට තීන්දු කරනවා, ඉසුරු දේවප්‍රිය මහ ඇමතිතුමාට විතරක් නොවෙයි, ලංකාව පුරා සන්ධානය පාලනය කරන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් පත් කරපු මහ ඇමතිවරු. මතක තියා ගන්න. මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් කරපු මහ ඇමතිවරු නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් පත් කරන ලද නව පළාත් සභා මහ ඇමතිවරු සහ අමාත්‍ය මණ්ඩලයට. එක්සත් ජාතික පක්ෂය විධියට සහයෝගය දෙන්න අපි තීන්දු කරනවා. ඒ නිසා තමයි, සමහර විට සමහර ඇමතිවරු ගැන මගේ හෘදය සාක්ෂියෙන් ඇහුවොත්, සමහර

අමාත්‍යවරුන්ගේ වැය ශීර්ෂයන්ට,මගේ හෘදය සාක්ෂියට එකඟව සමහර වෙලාවට ඡන්දය දෙන්න බැහැ. නමුත් පක්ෂයක් විධියට අපි ගත් ප්‍රතිපත්තිමය තීන්දුවක්. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වය යටතේ, එතුමාව විශ්වාස කරන, එතුමාට ගරු කරන කැබිනට් මණ්ඩලයක් සිටිනවා යැයි සිතා අපි ලබන වසරටත් මේ පළාත් සභාව ගෙනියන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට උදව් කරනවා.

ගරු නියෝජ්‍යසභාපතිතුමනි, තමුන්නාන්සේ හරහා ඉල්ලන්නේ, විශේෂයෙන්ම අපි දේශපාලනය කථා කළා. විවිධ මතවාද කළා. අපි දැක්කා, පාර්ලිමේන්තුවේ අවසන් දිනයේ ඇමතිවරු කථා කළේ මොනවාද කියලා. ඒ උත්තරීතර ආයතනයේත් විසර්ජනය පිළිබඳව අවබෝධයක් නැතිව කථා කළා. නමුත් මම විශ්වාස කරනවා, මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු - සමහර අය ඉන්නවා පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු බොහොමයකට වඩා දැන උගත් මන්ත්‍රීවරු. ඒ නිසා අදාළ කාරණය විෂය සමඟින් කථා කරලා, ලබන වසරේ අපට තිබෙන අභියෝග, මේ හදලා දීපු ඉලක්කම්, ගණන් ඒ අනුව අපට කරන්න පුළුවන්ද? එහෙම නැත්නම් පරිපූරක කීයක් දානවාද? පරිපූරක කීයක් දාලා ගිණුම් එහාට හරවනවාද? මෙහාට හරවනවාද? ඒක නොවෙයි අපේ සාර්ථකත්වය. අපේ සාර්ථකත්වය, ලබන වසරේ අප අප කෙරෙහි පවත්නා ස්ව ශක්තිය පිළිබඳව, බස්නාහිර පළාත පිළිබඳව විශ්වාස කරන කැබිනට් මණ්ඩලයක් තිබෙන්න ඕනෑ. ස්ව ශක්තිය පිළිබඳ විශ්වාසයක් තිබෙන්න ඕනෑ. මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනාම එකතු වෙලා, ස්වභාවික ව්‍යසනවලදී විතරක් නොවෙයි. මේ බස්නාහිර පළාත් සභාවට තිබෙන අභියෝගවලදී එකතු වෙලා කණ්ඩායමක් විධියට වැඩ කරන්න ඕනෑ. නමුත් අපි දැක්කා, ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමා මේ කැබිනට් මණ්ඩලය පත් කරන්න එදා ජනවාරි 08 වැනිදා අපි ගත්ත තීන්දුව වැදගත් වුණාට, එතුමන්ලා පස් දෙනාම සන්ධානයේ මන්ත්‍රීවරුන්ට පමණක් පසුගිය කාලයේ ලක්ෂ 35 ගණනේ අනුමත කරලා දුන්නා. අපි දැක්කා. හැබැයි, අපි ඒවාට අත උස්සලා මෙහේ අනුමත කරලා තිබෙනවා. නමුත් අපි ප්‍රධාන ඇමතිතුමාට කියනවා, ඒක එතරම් සුදුසු ක්‍රියාදාමයක් නොවෙයි. ඒ මන්ත්‍රීවරු ඉල්ලන්නේ, මේ එක්සත් ජාතික පක්ෂය කියලා නැහැ. ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු සියලු දෙනාම, මේ මුළු සභාවම අද ප්‍රධාන අමාත්‍යවරයාගේ අයවැයට ඒකමතිකව ඡන්දය දුන්නා. රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිවරයාගේ කාලයේදී, ප්‍රසන්න රණතුංග මහ ඇමතිවරයාගේ කාලයේදී මේකේ බෙදීම් තිබුණා. ඒ නිසා ප්‍රධාන අමාත්‍යතුමාට මම මේ කාරණය යොමු කරන්නේ. ඔබතුමා පිළිබඳව විශ්වාසයක්, ඔබතුමා පිළිබඳව ගෞරවයක් මේ සභාව තියලා තිබෙනවා. ඒක රැකීමේ වගකීම ඔබතුමා සතු වෙනවා.

ඒ එක්කම මේ සභාවේ මන්ත්‍රීවරු විවිධ මතවාද දරනවා. නමුත් එක්සත් ජාතික පක්ෂය විධියට අපි යමක් කිව්වා නම්, ඒ ප්‍රතිපත්තියේ රැඳී සිටිනවා. ගරු නියෝජ්‍යසභාපතිතුමනි, ඒ නිසා ලබන වසරේ මේ සභාව ඉදිරියට ගෙනියද්දී මතු වන හැම අභියෝගයකදීම - අද අපේ ගරු මන්ත්‍රීතුමා කළු පටියක් බැඳගෙන ඉන්නවා. එතුමාට ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් එක්සත් ජාතික පක්ෂය ඇතුළේ තිබෙනවා. එතුමාට අද රැට ගෙදරට නිර්නාමික දුරකථන ඇමතුම් එන්නේ නැහැ. එතුමාගෙන් අහන්නේ නැහැ, මේ පක්ෂයේ නායකතුමා කවදාවත් ඇයි? ඔබතුමා කළු පටියක් බැඳගෙන ගියේ කියලා. එතුමාගේ අයිතිය. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සමහරක්ට මම කියන එක තේරෙන්නේ නැහැ. ඒ නිසා මේ සභාව තුළ නිලධාරීවාදය - විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ඔබතුමා බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විතරක් නොවෙයි. පළාත් පාලන ආයතන 48 ක සභාපතිවරයා, නගරාධිපතිවරයා විධියටත් ගෞරවනීය රඟපෑමක් මේ ඉදිරි වර්ෂයේදී කරනවා. මාස කිහිපයක්. ඒ නිසා ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ ආයතනවල පසුගිය කාලයේ ඔබතුමා බොහෝ මාර්ග හදන්න මුදල් වෙන් කරලත්, අහිංසක මිනිස්සු ඒ නගර සභාවලට ඇවිල්ලා තමන්ගේ පාරවල් හදන්න, කාණු හදන්න ඒ ඉල්ලපු යෝජනා බොහොමයක් එකතු වෙලා තිබෙනවා. ඒවාට දේශපාලන නායකයෙක් මැදිහත් නොවුණු නිසාත්,
[ගරු නිරෝෂන් පාදුක්ක]

ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ඒ අදාළ නගර සභාවලට නැති නිසාත් ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විධියට, අපේ කැළි කසළ කළමනාකරණය පිළිබඳව ඔබතුමා හරහා දැඩි අවධානයක් යොමු කරනවා. විශේෂයෙන්ම මේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු විධියට මම වෙන් කරපු මගේ මුදලින් නිවාසවලට බෙදන්න හදලා දීපු, අපද්‍රව්‍යකළමනාකරණ අධිකාරියට ලබා දුන්න මුදලත්,මේ

මුදල් කොමිසමෙන් වෙන් කරපු මුදල ආයිත් කපලා අයින් කරලා දැම්මා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා ඉල්ලා සිටින්නේ. කාටවත් මේ සභාව අයිතියක් නැහැ. ප්‍රධාන අමාත්‍යතුමාගේ අයිතිය අපි ඉල්ලන්නේ නැහැ. හැබැයි, ප්‍රධාන ඇමතිවරයා අයිති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හෝ එහෙම නැත්නම් පොහොට්ටුවට නොවෙයි. එතුමා අයිති බස්නාහිර පළාත් සභාවටම. මේකේ ජීවත් වන හැම දරුවෙකුගේම නායකයා එතුමා. මේ බස්නාහිර පළාතේ ජීවත් වන හැම පුරවැසියෙකුගේම නායකයා එතුමා. ඒ නිසා එම තනතුරේ වගකීම්නුත් ඔබතුමාට කරනවා. කැබිනට් මණ්ඩලයේ අනික් සියලුම ඇමතිවරු ගිය වසරට වඩා දස දහස් ගුණයකින් ජනතාව වෙනුවෙන් කැප විය යුතු බව අවධාරණය කරමින්, ලබන වසරේදී මේ පළාත් සභාව සාම්ප්‍රදායික පළාත් සභාවක් නොවී, උඩුගම් බලා පිහිනන්න මේ කැබිනට් මණ්ඩලයට යෝධ බල, යෝධ ශක්තිය ලැබෙනු ඇතැයි විශ්වාස කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා.11.16]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2017 වර්ෂයේ ජනවාරි මස 01 වැනිදා සිට 2017 වර්ෂයේ දෙසැම්බර් මාසේ 31 වැනිදා වන තෙක් බිලියන 61 ක් වන පළාත් සභාවේ වියදම්, පළාත් සභාව උපයා ගන්නා මුදලුයි, පළාත් සභාවට මධ්‍යම රජයෙන් ප්‍රදාන විධියට ලැබෙන මුදලුයි, වෙනත් අරමුදල්වලින් ලැබෙන මුදලුයි පියවා ගැනීම සඳහා නීතිමය බලය ඉල්ලා සිටින ලියවිල්ල තමයි විසර්ජන ප්‍රඥප්තිය. ඒ නිසා මේ විසර්ජන ප්‍රඥප්තිය සම්මත වුණේ නැත්නම් පළාත් සභාවට තමන්ගේ වියදම් පියවා ගන්න ලැබෙන්නේ නැහැ. විසර්ජන ප්‍රඥප්තිය සම්මත වුණාම තමයි පළාත් සභාවේ අයවැය සම්මත වුණා කියලා කියන්නේ. මේකේදී මට තේරෙන්නේ නැහැ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන උපක්‍රමය, නැත්නම් දේශපාලන න්‍යාය මොකක්ද කියලා. ඒ අයට පුළුවන්කම ලැබුණා, අමාත්‍යාංශ හතරේම ඇමතිවරු හතර දෙනාටම ඡන්දය දෙන්න. අවසානයේ මුදල් වියදම් කරන නීතිමය බලය ඉල්ලන විසර්ජන ප්‍රඥප්තියට විරුද්ධ වෙනවාය කියලා ඒ අය,ඒ අයගේ සම්ප්‍රදායික දේශපාලනය නැවත වතාවක් පෙන්නුම් කරනවාය කියලා අපි විශ්වාස කරනවා. අපේ පළාත් සභාවේ ඇමතිවරු හතර දෙනාටම පක්ෂ වෙලා, හතර දෙනාගේම අමාත්‍යාංශවලින් මුදල් ගන්න ගමන් රටට කියන්න හදනවා, අපි පළාත් සභාවේ අයවැයට විරුද්ධ වෙලා තිබෙනවාය කියලා. ඒ නිසා මේ දේශපාලන කුහකකම නතර වෙන්න ඕනෑය කියලා තමයි අපේ විශ්වාසය. එහෙම නැති වුණොත් ජනතා විමුක්ති පෙරමුණටත් දේශපාලන අනාගතයක් නැති වෙයි කියලා තමයි අපි විශ්වාස කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මතකයි, පළාත් සභාවේ අවුරුදු 28 ක් වන ඉතිහාසයේ අයවැය 28 ක් තියෙද්දී, අපි පළාත් සභාවේ අයවැය18 කටපෙනී ඉඳලා තිබෙනවා. අපි අගෝස්තු මාසේත් අයවැය ප්‍රකාශ ඉදිරිපත් කරලා තිබෙනවා. ලංකාවේ ජාතික ආණ්ඩුව අයවැය ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා අපි අපේ අයවැය ප්‍රකාශනය සභාවට ගෙනැල්ලා සම්මත කරලා තිබෙනවා. හැබැයි, මෙවර අපට බැරි වුණා, අවසාන මාසය වන තෙක් අයවැය ප්‍රකාශනය ඉදිරිපත් කරන්න. ඒකට ප්‍රධානම කාර්යය වුණේ හැමදාම මධ්‍යම රජයේ භාණ්ඩාගාරය අපට නාමික අගයක් හරි දුන්නා, පළාත් සභාවට ලැබෙන මුදල මේකයි කියන කාරණය පැහැදිලි කරන්න. ඒ නිසා අපට අයවැයක් හදා ගන්න පුළුවන්කමක් ලැබුණා. නමුත් මෙවර රටේ තිබෙන දේශපාලන ව්‍යාකූලත්වය මත, ආණ්ඩුවේ මුදල් අර්බුදය මත අපට ලබා දෙන මුදල කොපමණද කියන එක අවසාන මොහොත වන තෙක් කියන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ජාතික අයවැය ඉදිරිපත් වෙලා ඉවර වන තෙක් පළාත් සභාව සතු මුදල කොපමණද කියලා කියන්න පුළුවන්කම තිබුණේ නැහැ. අපට මතකයි, සභා කටයුතු කාරක සභාව තියෙද්දී, අපේ භාණ්ඩාගාර ලේකම්තුමා අපව මුණගැහිලා කිව්වා. අමාත්‍යාංශවලට වෙන් වෙන ඒවා,අවසාන ඉලක්කම් ටික දෙන්න පුළුවන්කමක් නැහැයි කියලා. ඒ නිසා අපට හරි අගයන් සහිත අයවැයක් ගැන කථා කරන්න පුළුවන්කම ලැබුණේ නැහැයි කියලා තමයි මගේ විශ්වාසය. ඒකෙනුත් අපි දන්නවා. කොහොම හරි ආණ්ඩුව කෙකර ගාලා, කෙකර ගාලා ලොකු බිත්තරයක් නොවෙයි, පොඩි බිත්තරයක් දාලා තිබෙනවා. පුනරාවර්ථන වියදම 36% කින් කපන්න සිද්ධ වන මුදලක් තමයි අපට දීලා තිබෙන්නේ. ඒ වාගේම මුළු රජයේ ප්‍රදාන 36% කින්, ඒ වාගේම පුනරාවර්තන 31% කින් කපලා දාන, ප්‍රාග්ධන 61% කින් කපලා දාන මුදලක් තමයි අපට දීලා තිබෙන්නේ.

මේකට බලපාන ප්‍රධාන කාරණාව තමයි රටේ මුදල් සොයා ගන්න පුළුවන් ක්‍රම ජාතික ආණ්ඩුවට නැහැ. මිනිස්සුන්ගේ ක්‍රය ශක්තිය, මුදල් වියදම් කරන්න තිබෙන

හැකියාව එහෙම්පිටින් දුර්වල වෙලා. ඒ නිසා අද බදු මගින් මුදල් ගන්න ආණ්ඩුව උත්සාහ කරනවා. ඒ නිසා නැවත නැවතත් ජනතාව පෙළා දමලා තමයි අපට මේ මුදල හරි දෙන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ කියලා අපි විශ්වාස කරනවා. ඒකේදී අසමමිතික මුදල් බෙදා දීමක් තමයි මධ්‍යම රජය කරලා තිබෙන්නේ. අපි දන්නවා. පළාත් සභා සියල්ලේම මුදල් කපලා තිබෙනවා. උතුරු පළාත් සභාවට විතරක් මුදල්වැඩි කරලා. දැන් මේකෙන් කාටද මේ රිද්දන්න හදලාතිබෙන්නේ. අපි විශ්වාස කරනවා. මේ ආණ්ඩුවේ දේශපාලන අයිතිය බෙදා ගන්න, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකේ තිබෙන කඹ ඇදිල්ලේ ගොදුර බවට පත් වෙලා තිබෙන්නේ, පළාත් සභා කියලා අපි විශ්වාස කරනවා. ලංකාවේ පළාත් සභා හතක බලය තිබෙන්නේ, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා නායකත්වය දරන ශ්‍රී ලංකා නිදහස්පක්ෂය නියෝජනය කරන මහ ඇමතිවරු හත් දෙනෙකු අතේ. පළාත් සභා හතක බලය තිබෙන්නේ. මේ පළාත්සභා හතේම මුදල් කපලා දාලා. මේකේ රිද්දලා තිබෙන්නේ ජනාධිපතිතුමාට ද පළාත් සභාවට ද කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. ජනාධිපතිතුමාගේ බලය සලකන්නේ නැහැයි කියන එකද මේ කියන්නේ. ජනාධිපතිතුමා එක්ක අපේ මහ ඇමතිතුමා සාකච්ඡාවකට ගියා. ජනාධිපතිතුමා මාධ්‍යවලට කිව්වා, නැවත වතාවක් වෙනස් කරලා හරි මේ මුදල් ටික දෙනවාය කියලා. හැබැයි, අද වන තෙක් මුදල හරිගස්සන්න පුළුවන්කම ලැබිලා නැහැ. ඒ නිසා මුදල් කපලා කාටද මේ කනේ පහර ගහලා තිබෙන්නේ කියන ප්‍රශ්නයමේ අවස්ථාවේදී මතු වෙනවා. කාටද මේ කනේ පහර ගහලා තිබෙන්නේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටද? ජනාධිපතිතුමාටද? කාටද මේ කනේ පහර ගහලා තිබෙන්නේ? ඒ එක්කම ආණ්ඩුව උත්සාහ කරනවා දෙමළ ඩයස්පෝරාව සතුටු කරන්න. උතුරු පළාත් සභාව ඇතුළේ තිබෙන, උතුරේ තිබෙන දෙමළ ඡන්ද ටික ඊළඟ ව්‍යවස්ථා සංශෝධනයෙන් තමන්ගේ ගොඩට දිනා ගන්න මේ උත්සාහය කරනවා. ඒ නිසා මේ කුහකකමක් නිසා තමයි මේ පළාත් සභාවේ මුදල් අඩු වුණේ කියන කාරණය අපි මතක් කරලා දෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ තිබෙන බරපතළම ප්‍රශ්නයක් තමයි, සමහර මුදල් හංගලා මේකේ තිබෙන්නේ. දැන් විපක්ෂය දිගින් දිගට කිව්වා, පළාත් සභාවේ අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කරන්නමිලියන 7500 ක් දුන්නා කියලා, . හැබැයි, මිලියන 258 යි ඇවිල්ලා තිබෙන්නේ. මේ මුදල, ලැබෙනවා කියන මිලියන 7500 ක මුදල මේ අයවැයේ කොතැනකවත් සඳහන් වෙලා තිබුණේ නැහැ. ජාතික අයවැයේත් ඒක නැහැ. කියන්නේ, ඒක භාණ්ඩාගාරයේ තැනක හංගලා තිබෙනවාය කියලා. දැන් අපි පරිපූරක දාලා ලැබෙන මුදලට අනුව පරිපූරක දදා අයවැයට එකතු කරලා මේ මුදල් වියදම් කරන්න සූදානම් වෙනවාය කියලා තමයි අපට කියන්නේ. මේ මුදල් ලැබෙනවාද නැද්ද කියන කාරණය අපට පැහැදිලි නැහැ. අධ්‍යාපනයට තිබෙන සැලකිල්ල අඩු කරලා තිබෙනවා කියලා තමයි මේකෙන් පැහැදිලි වෙන්නේ. හැබැයි, එහෙම තිබෙන කොට මම මේ වෙලාවේ කියන්න ඕනෑ. කුහවර්ධන් ගරු මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා දෙමළ භාෂාවෙන් කථා කරලා කිව්වා, පසුගිය ආණ්ඩුව කවදාවත් කරලා නැති දැවැන්ත සේවාවක් අගමැතිතුමාගේ නායකත්වයෙන් මේ ආණ්ඩුව අධ්‍යාපනයට කරලා තිබෙනවාය කියලා. මේ වාගේ මුදල් වෙන් කරද්දී තමයි එහෙම කියලා තිබෙන්නේ.

හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේට මතක ඇති. අර තිනකුරල් පොත ලියපු, යාපනය පුස්තකාලය ඉස්සරා තිබුණු දෙමළ ජනතාවගේ මුදුන් මල්කඩ වාගේ තිනකුරල් පොත ලියපු තිරුවංගල් පඬිතුමාගේ පිළිමයේ ඔලුවට කුඩු වෙන්න කුළුගෙඩියෙන් ගහලා, යාපනයේ මහා ඥාන ගබඩාව ගිනි තියලා, ඒ ගිනි තියපු එකට දෙමළ ජනතාවගෙන්ගරු අගමැතිතුමා පාර්ලිමේන්තුව ඇතුළේ සමාව ඉල්ලද්දී, අධ්‍යාපනයට සැලකුවාය කියලා දෙමළ භාෂාවෙන් කථා කරලා කියනවා. අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනාවේ කවුද? විශ්ව විද්‍යාලය ඇතුළේ ශිෂ්‍යයෝ දහස් ගණනක් මරලා දැම්මේ කවුද? ඒ නිසා මේ දේශපාලනය තේරුම් ගන්න බැරි නම් දේශපාලනයේ වහල්ලු වෙලා, දෙමළ ජනතාව ගෙනියන්න හදනවා නම් ඒ වහල්භාවයට,මම හිතන්නේ ඒක

[ගරු මහේෂ් අල්මේදා]

රටේ දැවැන්ත ඛේදවාචකයක්.ඒ නිසා අපි කියනවා,ඒ හීනවලින්අවදි වෙන්නය කියලා. ඒ හීනවලින් අවදි වෙලා පරිසරය දිහා බලන්නය කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මුදල් කපා දැමීම, එහෙම නැත්නම් මධ්‍යම රජය පළාත් සභා මේ විදියට පාලනය කරන එක නතර කරන්න ඕනෑ කාල වකවානු ඇවිල්ලා.

අලුත් ව්‍යවස්ථාවක් හදන එකටඅද බොහෝ අය විරුද්ධ වෙනවා. අපි නොදැකපු ව්‍යවස්ථාවක් ගැන මේ රටේ බොහෝ දෙනා කථා කරන්නපටන් අරගෙන තිබෙනවා. අපට මතකයි, 2000 දීත් ව්‍යවස්ථාවක් හැදුවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ව්‍යවස්ථාවක් හැදුවා.ඒ ව්‍යවස්ථාවට එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේදී ගිනි තියලා දැම්මා. පාර්ලිමේන්තුව ඇතුළේ ගිනි තිබ්බේ ව්‍යවස්ථාව. අදත් අලුත් ව්‍යවස්ථාවක් හදන්න හදනවා. එදත් ව්‍යවස්ථාව හදපු න්‍යායාචාර්යතුමාම තමයි අදත් ව්‍යවස්ථාව හදන්නේ. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමා. ව්‍යවස්ථාවක් හදන එක හොඳ එකක්. යහපත් කටයුත්තක්. අපි හැමදාම කිව්වා, මේ රටේ සියලු ජාතීන්ට එකට කටයුතු කරන්න පුළුවන් ව්‍යවස්ථාවක් නිර්මාණය වෙන්න ඕනෑය කියලා. ඒ ව්‍යවස්ථාව නිර්මාණය වෙන්න ඕනෑ. හැබැයි, සියලු ජාතීන්ට එකට කටයුතු කරන්න පුළුවන් ව්‍යවස්ථාවක් නිර්මාණය වුණාය කියන සතුට අපට භුක්ති විඳින්න පුළුවන් වෙන්නේ, බෙදපු බලය නිවැරදිව භුක්ති විඳින්න සියලු පළාත් සභාවලට දීමෙන් විතරයි. ඒ නිසා අපි කියනවා. ගරු නියෝජ්‍යසභාපතිතුමනි, අද අලුත් ව්‍යවස්ථාවේ ලියන්න හදනවා නම්, ජාතික අයවැයේ ප්‍රතිශතය පළාත් සභාවකට අයිති වෙන්න ඕනෑ ප්‍රමාණය, ඒක තමයි අලුත් ව්‍යවස්ථාව හැදීමෙන් කරන ලොකුම සේවය, මේ රටේ සියලු ජාතීන්ට එක තැනක ඉන්න පුළුවන් විධියට. ඒ නිසා 40% ක් ජාතික අයවැයෙන් අනිවාර්යයෙන්ම පළාත් සභාවකට වෙන් වෙනවා කියලා මේ රටේ මූලික නීතියේ ලියන්න පුළුවන් නම්, පළාත් සභාවලට මුදල් කැපුවාය කියන අඳෝනාව අපට හැමදාම භුක්ති විඳින්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා එවැනි පරිසරයක් ඇති කර ගන්න තමයි අපි මේ ව්‍යවස්ථාව නිර්මාණය කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් දෙමළ ඩයස් පෝරාව සතුටු කරවන්න, දෙමළ මිනිස්සු විතරක් වෙනම අරගෙන, ඒ අය සතුටු කරලා සදාකාලික තමන්ගේ ඡන්ද බැංකුවේ තියෙන පොදියක් විධියට දෙමළ ජනතාවගේ ඡන්ද ටික පාවිච්චි කරන්න හදනවා නම්, මේ රටේ බලය බෙදීමවත්, මේ රටේ ව්‍යවස්ථා වෙනසේවත් ප්‍රතිඵලය රටේ සමස්ත ජනතාවට හම්බ වෙන්නේ නැහැ. නැවත නැවතත් අර්බුද මිසක සාමකාමී පරිසරයක්නම් නිර්මාණය වෙන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයවැය හරහා රටේ සාමයට කොයි තරම් ප්‍රමාණයක් දායකත්වය දෙනවාද කියන කාරණය මුදල් ලැබීම්, කපා දැමීම් හරහා පෙන්වලා තිබෙනවා. උතුරට දුන්නා වාගේම මේ පළාතටත් ඒ සහනය දුන්නා නම් තමයි අපට විශ්වාසය තියන්න පුළුවන්, ආණ්ඩුව සාධාරණව සියලු පළාත් සභාවලට මුදල් බලය දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ මුදල් බලය හරහා පළාතේ ජනතාවට සේවය ලබා ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවාය කියන කාරණය ගැන සතුටු වෙන්න පුළුවන් කියන කාරණය මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ මන්ත්‍රීවරුන්ට කටයුතු කර ගෙන යද්දී, පළාත් සභාවේ අයවැය නොවෙයි විවිධ සංවර්ධන ක්‍රියාවලදී නිලධාරීන්ට දෙන යම් වරප්‍රසාද, එහෙම නැත්නම් සම්පත් ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, සැලසුම් අංශයේ වැඩ කරන සෑම සැලසුම් නිලධාරියෙකුටම අලුත් තාක්ෂණය පාවිච්චි කිරීමේ, අන්තර්ජාල පහසුකම් පාවිච්චි කිරීමේ අයිතිය නැත්නම්, ඒ පහසුකම් ටික සපයා දීම අනිවාර්යයෙන්ම මේ අයවැය හරහා සිද්ධ කළ යුතුයි. බොහෝ මන්ත්‍රීවරු අද තාක්ෂණය පාවිච්චි කරලා කටයුතු කරනවා. තමන් හදන ව්‍යාපෘති සැලසුම් කඩදාසි ලියන්නේ නැතිව ඊ මේල් තැපෑලෙන්, නැත්නම් විදුලි තැපෑලෙන් එවන කටයුත්ත කරනවා. නමුත් බොහෝ සැලසුම් නිලධාරීන් සතුව පළාත් සභාවේ ඒ තාක්ෂණය පාවිච්චි කරන්න පුළුවන් උපකරණ ලැබිලා නැහැ. ඒ නිසා ඔබතුමා හරහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, සියලු සැලසුම් නිලධාරීන්ට අලුත් තාක්ෂණය පාවිච්චි කරන්න පුළුවන් පහසුකම, තවත් නිලධාරියෙකු ළඟට ගිහිල්ලා කටයුතු කරන්න නොවෙයි, තමන්ගේ මේසය උඩ මේ පහසුකම ලබා දෙන්න කටයුතු කළොත් මම හිතන්නේ, කඩිනමින් සංවර්ධන ක්‍රියාදාමය පළාත් සභාවේ ඉස්සරහාට ගෙන යන්න පුළුවන්. ඒ හරහා ජනතාවට සංවර්ධනය වේගයෙන් ගෙන යන්න පුළුවන්කම ලැබෙනවාය කියන කාරණය මතක් කරන ගමන්, මේ වෙලාව ලබා දීම ගැනත් ස්තුතිවන්ත වෙමින් මේ විසර්ජන ප්‍රඥප්තිය සම්මත කිරීම අප විසින් කළ යුතුයි කියන යෝජනාවත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.11.27]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය හයවැනිදා සිට අපි දවස් ගණනක් තිස්සේ මේ අයවැය සාකච්ඡා කළා. අමාත්‍යවරු පස් දෙනෙකුගේ අයවැය සාකච්ඡාවලට දීර්ඝ වශයෙන් සහභාගී වුණු අපි අවසානයේ මේකේ වැදගත්ම කොටසට ඉතිරි වෙලා තිබෙන්නේ, පැය දෙකක්. ඒ තමයි මේ විසර්ජන ප්‍රඥප්තිය සම්මත කිරීම. විසර්ජන ප්‍රඥප්තියේ

අවශ්‍ය මුදල් අපි අද සම්මත කරලා දුන්නොත් තමයි මේක 2017 වර්ෂයේදී කරදරයක් නැතිව එතුමාට වැඩ කර ගෙන යන්න පුළුවන්කම ඇති වෙන්නේ. ඒ නිසා මේ විසර්ජන ප්‍රඥප්තිය ඉතාම වැදගත් ප්‍රඥප්තියක්. ඒක ශක්තිමත් කරලා දෙන එක අපේ යුතුකමක් විධියට අපි කල්පනා කරනවා. මම කාරණා කිහිපයක් පිළිබඳව ඉතාම කෙටියෙන් මතක් කරන්න කැමැතියි. එයින් එකක් තමයි, තමුන්නාන්සේලා හුඟක් දෙනෙක් දන්නවා ඇති දැන් අපේ ප්‍රධාන ඇමතිතුමා මේ වෙලාවේ සපත්තු 111,000 ක් බෙදා දෙන්න සූදානම් වෙලා තිබෙනවා. ඒක අපට ආරංචි වුණාම, එතුමාගේ අමාත්‍යාංශය යටතේ ඇති පළාත් පාලන ආයතනවල මිල මුදල් අරගෙන තමයි මේ සපත්තු ටික බෙදලා දෙන්න හදන්නේ.

දැන් අපි කියන්නේ, ඒකට හේතුව විධියට සමහර වෙලාවට කියන්න පුළුවන්, හිටපු ඇමතිවරයා මහ ඇමතිතුමා ඡන්දය කාලයේදී පොත්පත් බෙදලා දුන්නා. ඒ නිසා මටත් උරුමයක් තිබෙනවා, මේ මහ ඇමති තත්ත්වයට පත් වුණාම යුතුකමක් ඉෂ්ට කරන්න කියලා. අපි ඒ ගැන බොහොම සන්තෝෂයට පත් වෙනවා. අඩු ආදායම්ලාභී දරුවන්ට තමයි ඒක බෙදලා දෙන්න හදන්නේ. හැබැයි, මේවා ගන්නකල් අපි දන්නේ නැහැ. අපට එහෙන් මෙහෙන් හොරෙන් තමයි මේවා දැන ගන්න හම්බ වෙන්නේ. මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මඟින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියන්නේ, මේවා දුන්නාට කමක් නැහැ. හැබැයි, මේවා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු හරහාත්, තමන්ගේ ඉන්න මන්ත්‍රීවරු හරහාත් මේවා බෙදා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න. ඒක තමයි මම එතුමාට කියන එකම දේ. ඒ නිසා -

**ගරු ඉසුර දේවප්‍රිය-** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

මන්ත්‍රීවරු තමයි බෙදන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක තමයි. අපි දන්නේ නැහැ නේ? අපි දන්නේ නැහැ. අපි ගරු ප්‍රධාන ඇමතිතුමාට මේ මතක් කරන්නේ වෙන මුකුත් නොවෙයි. ඒකට අපිවත් සම්බන්ධ කර ගන්න. එකට මේ වැඩේ වුණාම කිසිම ගැටළුවක් නැහැ. අනික් පැත්තෙන් මම මතක් කරනවා. නිතරම අපේ මන්ත්‍රීවරුන්ගේ අඳෝනාවක් තිබුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපට ලක්ෂ 15 ක් දුන්නා. නමුත් අපි දන්නවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට තව ලක්ෂ 35 ක් දීලා තිබෙනවා. එදා අපි ත්‍රිකුණාමලයේදීත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මතක් කළා. මෙහෙම කරන්න එපා. මේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමක් තිබෙනවා. තමුන්නාන්සේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනාටම ලක්ෂ 35 ක් ලබා දීලා තිබෙනවා. මේකට උදව් කරන්නය කියලා. මේක තවම වුණේ නැහැ. ගරු ප්‍රධාන ඇමතුමනි, ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. ඒ නිසා දැන් අපි මේ මතක් කරන්නේ වෙන මොකුත් නොවෙයි. දැන් මේ විසර්ජන ප්‍රඥප්තිය සාකච්ඡා කරන ගමන්ම ගරු ප්රධාන අමාත්‍යතුමා පිළිබඳව මට අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න තිබෙනවා. අපි සභාවකදී මන්ත්‍රීවරුන්ගේ යුතුකම් ටිකක් ඉෂ්ට කරන්නය කියනවා. දැන් එකක් තමයි මේ තිබෙන වෛද්‍යාධාර ක්‍රමය. වෛද්‍යාධාර ක්‍රමය ලක්ෂ තුනයි. අද ගිහිල්ලා දවස් පහක් හරියට රෝහලක හිටියොත් රු. 250,000 ක්, රු. 300,000 ක්, රු. 400,000 පහු වෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කළා. දැන් අපි මේක කථා කරන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. පාර්ලිමේන්තුවේ පසුගිය දිනවල පැවති අයවැය දිනයකදී ගරු අගමැතිතුමා පුළුවන්තරම් මන්ත්‍රීවරුන්ට පහසුකම් දුන්නා. ජනවාරි මාසයේ සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ දීමනාව රුපියල් ලක්ෂ පහ පනිනවා. මට දැනෙන විධියට. එක පැත්තකින් රක්ෂණ සංස්ථාවේ දුන්නා. අනික් පැත්තෙන් වාහනවලට දුන්නා. අනික් පැත්තෙන් කාර්යාල වියදම් දුන්නා. පොකට් මනී. මගුල් ගෙවල්වලට ගියාම දෙන්න දුන්නා. අපේ සමහර මන්ත්‍රීවරු මගුල් ගෙවල්වලට ගියාම කීයක්වත් දෙන්නේත් නැහැ. වාහනයට බැංකු ණය පහසුකම් දුන්නා. මේ සියල්ලෙන්ම ගරු අගමැතිවරයා කළේ වෙන මොකක්වත් නොවෙයි. තමන්ගේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ගේ ශක්තිය වැඩි කරලා දුන්නා. දැන් අපට මහ ඇමතිතුමාට කියන්න තිබෙන එකම දේ තමයි, මේ මහ ඇමතිතුමා කීර්තිමත් පුද්ගලයෙකු බවට

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

පත් වෙන්න අපේ මේ මන්ත්‍රීවරුන්ගේ දීමනා ටික ලබා දෙන්න. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ලැබෙන හැම දෙයින්ම අපට හිමි හැමදේම අපට ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්නය කියන එක මම ඉතාම සන්තෝෂයෙන් මතක් කරනවා. ඒකේ ප්‍රශ්නය වෙන මොකුත් නොවෙයි. එතුමා පාර්ලිමේන්තුවේ නියෝජිතයෙකු හැටියට එතුමා පාර්ලිමේන්තුවේ කැබිනට්

එකට යන කෙනෙක්. එතුමාට ගියාම, මේක යෝජනා කරලා මේ වැඩේ කර ගන්න පුළුවන්. අපි අගමැතිවරයා එක්ක පසුගිය දවසක සාකච්ඡාවක් කළා. අපි එතුමාටත් මතක් කළා. මේ මන්ත්‍රීවරු හරියට මැසිවිල්ලක් නගනවා, මේ පර්මිට් එක නැතිව. ඒ නිසා තමුන්නාන්සේ මේ කටයුත්ත කරලා දෙන්න කියලා. එතුමා කිව්වා, ඒකටත් මම දවස් දහයක් විතර බැනුම් අහයි. ඉක්මණට අපි මොකක් හරි කරලා දෙන්නම්ය කියලා කිව්වා.

අපි මතක් කරන්නේ ප්‍රධාන ඇමතිවරයාට මේ කාරණයත් අගමැතිවරයා එක්ක කථා කරලා වචනය කටින් පැනපු වෙලාවේ මේ ටික ඉක්මන් කර ගන්නය කියන එක තමයි මම ඔබතුමාට මතක් කරන්නේ. විසර්ජන පුඥප්තියේ තමුන්නාන්සේට මුදල් ලැබිලා නැහැයි කියලා අද දවසේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කළා. හැබැයි, ඒකේදී හොඳ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කළා. කෙනෙකුගේ මුදල් බලාපොරොත්තු වෙලාම ඉන්නවාට වැඩිය අපට පුළුවන් නම් මුදල් සොයන්න. ඒ මුදල් සෙවීම තුළ අපට ඒ වන අඩුපාඩුව සම්පූර්ණයෙන්ම සකස් කර ගන්න. ඒක ලොකු දෙයක්. ඒ නිසාම තමයි ගරු ප්‍රධාන ඇමතිවරයා කිව්වේ, මේ මුදල් කපලා තිබෙනවා. මේ මුදල් කපලා තිබුණාට කමක් නැහැ. අපට ආදායම් මාර්ග තිබෙනවා. මේ ආදායම් මාර්ග වැඩි කරන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරු, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු අපි කණ්ඩායමක් විධියට, groupඑකක් විධියට එකට හැදිලා මේ ශක්තිය වැඩි කරලා දෙන්න අවශ්‍ය කටයුතු කරන්නය කියලා. ඒ නිසා මම මේ මතක් කරන්නේ, වෙන කිසි දෙයක් නොවෙයි. මේ කාරණාවේදී එකම දේ තිබෙන්නේ. අපි එක පැත්තකින් කනගාටු වෙනවා. ආණ්ඩුව ඒ විධියේ මුදලක් කපලා තිබෙන එක ගැන. අපි දන්නවා. අද පාර්ලිමේන්තුවේ යන්නෙත් සීරෝ බජට් එකක්. ඒ නිසා අපට අද ඒ සීරෝ බජට් එකටත් අනුගත වෙන්න වෙලා තිබෙනවා. ඒක අද මුළු රටටම ක්‍රියාත්මක වන දෙයක් බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ඉතාම සන්තෝෂයෙන් මතක් කරනවා. තමුන්නාන්සේගේ ඒ ක්‍රමවේදය අනුව ඉතාම හොඳින් ඒ කණ්ඩායම සාකච්ඡාවට මෙහෙයවලා ඉතාම ඉක්මණින් මේ කටයුත්ත කරන්න පුළුවන් නම් ඒක හොඳ කාරණයක් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අනික් පැත්තෙන් අපි දන්න එක කාරණයක් තමයි ගරු ප්‍රධාන ඇමතිතුමනි, මේ සාකච්ඡාව තුළ මම සම්පූර්ණ දවස් ගණන ඉන්න කොට මම දැක්ක එක දෙයක් තමයි, මේ අමාත්‍යාංශ පහ කැබිනට් මණ්ඩලයේදී විතරක් නොවෙයි. අනික් සෑම අවස්ථාවලදීත් එකට එකතු වෙලා, සැලැස්මක් ඇතිව එක ගමනක් යන්න සාකච්ඡා කරන්න පුළුවන් නම්, මේකේ තිබෙන වියදම්නුත් අඩු කර ගන්න පුළුවන්කම තිබෙනවා. සමහර දේවල් සම්බන්ධයෙන් අධ්‍යාපන ඇමතිවරයා එක්ක සෞඛ්‍ය ඇමතිවරයා කථා කරන්න ඕනෑ. සමහර දේවල් පිළිබඳව සෞඛ්‍ය ඇමතිවරයා එක්ක කෘෂිකර්ම ඇමතිවරයා කථා කරන්න ඕනෑ. සමහර දේවල් පිළිබඳව ප්‍රධාන ඇමතිවරයා එක්ක අනික් ඇමතිවරු සියලු දෙනාම කථා කරන්න ඕනෑ. මෙලෙස එකට එකතු වෙලා කථා කරලා එක සාකච්ඡාවක් කළොත් මම හිතන්නේ මේ කටයුත්ත ඉතාමත් සාර්ථකව කර ගෙන යන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ගරු ප්‍රධාන ඇමතිතුමනි, අපි තමුන්නාන්සේට ඉතාම කාරුණිකව මතක් කරන දේ තමයි. එක පැත්තකින් කැබිනට් එක හැටියට ඔබතුමන්ලා රැස් වෙනවා වාගේම, ඔබතුමන්ලා හතර පස් දෙනා එකට එකතු වෙලා එක වැඩ සටහනකට ගියොත්,මේ තිබෙන මුදල් ටිකත් ඉතාම හොඳින් සකසුරුවම් කර ගෙන එක ගමනක් යන්න පුළුවන්කම තිබෙනවා. අද එක ඇමතිවරයෙක් තමන්ගේ අමාත්‍යාංශයේ ඉඳලා, තමන් යන තනි ගමනක යන්නේ. අනික් ඇමතිවරුත් තමන් යන තනි ගමනක යන්නේ. ඒ නිසා මේ කාරණාවේදී අමාත්‍යාංශ ටික එක සැලසුමක් යටතේ එකට එකතු වෙලා වැඩ කරන්න පුළුවන්කම තිබෙනවා නම්, මේ කටයුත්ත ඉතාම හොඳින් සාර්ථකව කර ගන්න පුළුවන්කම තිබෙනවා.

ඔබතුමාට මම මේ විසර්ජන පුඥප්තිය විවාද වන අවස්ථාවේදී විශේෂයෙන්ම අපේ පක්ෂයේ නායක ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට, එතැනින් ගියාම අධ්‍යාපන ඇමති අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා ඇතුළු ඇමතිවරු ගණනාවකට අපි ස්තුති කරන්න වෙනවා. ගරු සභාපති කබීර් හෂීම් මැතිතුමාට. අපි කණ්ඩායමක් හැටියට තීන්දුවක් ගත්තා. අපි මේ ඡන්දයේදී මොකක්ද කරන්නේ කියන එක අපි අගමැතිවරයාගෙන් අහමු. එතකොට අපි ඒ ගමන යන කොට - අපි අගමැතිතුමාට ගිහිල්ලා කිව්වා, ගරු අගමැතිතුමනි, මේ අයවැය ලේඛනයේදී අපි උදව් කරන්න ඕනෑද නැද්ද කියන එක කියන්නය කියලා. එතුමා කිව්වා, ඉසුර ඇතුළු ඔක්කෝටම එක වාගේ උදව් කරන්නය කියලයි. ඒ නිසා ආණ්ඩුවට මේක ඇතුළේ කොයි තරම් බැන්නත්, අගමැතිතුමාට කොයි තරම් මේක ඇතුළේ බැන්නත්, මේ කැබිනට් එකට කොයි තරම් බැන්නත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ කවුරුවත් මන්ත්‍රීවරු

නැති තැන අපට කිව්වේ, ප්‍රධාන ඇමතිවරයා ඇතුළු ඇමතිවරු සියලු දෙනාටම ඡන්දය දෙන්න කියලයි. ඒක තමයි අපට කිව්වේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ වෙන කරන්න දෙයක් නැති නිසා. වෙන කරන්න දෙයක් නැහැනේ? ආණ්ඩු පක්ෂයේ 61 යි විපක්ෂයේ 43 යි. මොනවා කරන්නද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මේක ඇතුළේ මොන පක්ෂය ආවත් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ හින්දා නොවෙයි. ඒකාබද්ධය බෙදුණා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතැනදී අපි ඒ ශක්තිය තමයි පාවිච්චි කළේ. ඒ නිසා ගරු අගමැතිතුමා ඇතුළු ඇමතිවරු ගණනාවකට අපි ස්තුතිවන්ත වෙමින් මේ විසර්ජන ප්‍රඥප්තියේදී ගරු ප්‍රධාන ඇමතිතුමා වෙනුවෙන්, අනෙක් ඇමතිවරු වෙනුවෙන් අපේ සහයෝගය ලබා දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොහොට්ටුව බය වුණා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ වාගේම අපට මේ වෙනුවෙන් උදව් කිරීම සම්බන්ධව සියලුම නිලධාරීන්ට අපේ ගෞරවයත්, ස්තුතියත් පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.11.42]

**ගරු ඉසුර දේවප්‍රිය-** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ 20 වන අයවැය විවාදයේ අවසන් දිනයේ අවසාන මොහොතටයි අපි දැන් පැමිණ සිටින්නේ. අපේ අයවැය විවාදයට සම්බන්ධ වෙලා තමන්ගේ අදහස් හා යෝජනා ඒ වාගේම විවේචන ඉදිරිපත් කිරීම පිළිබඳවමම අපේ සියලුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම අපි මතක් කරන්න ඕනෑ. බස්නාහිර පළාත හැටියට විශේෂයෙන්ම අපි දන්නවා, කොළඹ නගරය කේන්ද්‍ර කර ගත් තදාසන්න ප්‍රදේශවල තිබෙන මාර්ග තදබදය. ඒ වාගේම කැළි කසල ප්‍රශ්නයට අපි විසඳුමක් සෙව්වා සේම, අපි ඉදිරි වර්ෂයේදී කොළඹ රථවාහන තදබදයටත් විසඳුමක් බස්නාහිර පළාත හැටියට අපි යෝජනා කරන්න සූදානමින් ඉන්නවා. අපි හිතනවා, ඒ තුළින් අපේ පළාතේ ජනතාවට මාර්ග තදබදයකින් තොරව ගමනාන්තයක් දක්වා යන්නට, ඒ විසඳුම ප්‍රයෝජනවත් වෙයි කියලා. ඒ වාගේම සමස්තයක් හැටියට පළාත් පාලන ආයතනවල සවි කරලා තිබෙන වීථි ලාම්පු පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ වුණා. මම හිතනවා, සාම්ප්‍රදායික වීථි ලාම්පු වෙනුවට අලුත් වීථි ලාම්පු පද්ධතියක් අපේ පළාතේ ප්‍රධාන නගරවලට එක් වෙන්න ඕනෑය කියලා. ඒ වාගේම ගරු විපක්ෂ නායකතුමා පැහැදිලි කළා.මම මගේ අයවැය කථාවේදී, ඒ ගැන කථා කරන්න ලියාගෙන සිටියේ. ඔබතුමා දන්නවා. දැනටමත් මම අපේ පළාත් පාලන ආයතන හරහා සහ අපේ මුදල් තිබෙන පළාත් පාලන ආයතනවලට පළාත් සභාවෙන් මුදල් ලබා දීලා, මේ වන කොට අපේ පළාතේ අඩු ආදායම්ලාභී සියලුම දරුවන්ට සපත්තු කුට්ටමක අයිතිය ලබා දෙන්නට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒක පැහැදිලිව කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක අපි දේශපාලන භේදයකින් තොරවයි කළේ. අපි ඒ ෆෝරමයක් සකස් කරලා, කලාප කාර්යාලවලට යවලා, කලාප කාර්යාලයෙන් පාසල්වලට යවලා තමයි ඒක ගත්තේ. අපි දේශපාලන පක්ෂයක්, පාටක් බැලුවේ නැහැ. මම හිතන්නේ, විපක්ෂයේ අය දරණ මතයම තමයි අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් දරන්නේ. අද තමයි මේ අය දැනුවත් වෙන්නේ. ඒ අනුව අපි සම්පූර්ණ දේශපාලන භේදයෙන් තොරව තමයි

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. පවතින නීතිරීතිවලට ගරු කරමින්. ඒ අනුව අපි දැන් සියලුම සපත්තු මිලදී ගන්න සියලු කටයුතු සිද්ධ කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාට වෙනමම උත්සවයකට සම්බන්ධ වෙන්න එතුමාගේ ඩයරියේ ඉඩ නැති නිසා, එතුමා මාත් එක්ක එකඟ වුණා. ජනාධිපති ලේකම් කාර්යාලයේදී

සංකේතයක් හැටියට අපේ දරුවන් කිහිප දෙනෙකුට ප්‍රදානය කරලා, ඊට පස්සේ මේ මාසය අවසන් වීමට පෙර එකම දිනයකදී සියලුම පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ඉන්න අපේ සියලුම පළාත් සභා මන්ත්‍රීවරු - පක්ෂ විපක්ෂ සියලුම පළාත් සභා මන්ත්‍රීවරු රැස් වෙලා, තමන් නියෝජනය කරන කොට්ඨාශයේ පළාත් පාලන ආයතනයට සම්බන්ධ වෙලා එකම දිනයකදී එය දරුවන්ට ප්‍රදානය කරන්න අවශ්‍ය සියලුම උපදෙස් පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට මේ වන කොට මමත් පළාත් පාලන කොමසාරිස්තුමියත් දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව අපි පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට දිනය ලබා දෙනවා. අපි මන්ත්‍රීවරුන්වත් දැනුවත් කරනවා. ඒ අනුව ඒ වැඩ කටයුත්ත සියලු දෙනාම එකතු වෙලා කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම අපි නිවාස ව්‍යාපෘතිය පටන් ගන්න සියලු කටයුතු සූදානම් කරලා තිබෙනවා. මේ අයවැය පැවති දින කිහිපය තුළම මමත් ප්‍රධාන ලේකම්තුමාත් අපට තිබෙන ඉඩම් කිහිපයක් පරික්ෂා කරන්න ගියා. අපි හිතනවා, අපට ජනවාරි මුදලදීම මේක ක්‍රියාත්මක කර ගන්න ලැබෙයි කියලා.

ඒ වාගේම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, වේගය පිළිබඳව. ඇත්තටම මම කියන්න ඕනෑ. මම හිතන්නේ, මම ඒක අමුතුවෙන් පැහැදිලි කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. 2017 තුළ අපි කොයි තරම් වේගයකින් යන්න හදනවාද කියන එක අපි තේරුම් ගත්තේ, ඒක මන්ත්‍රීවරුන් දැනුවත් වුණේ, ත්‍රිකුණාමලය සංචාරයේදී. ඒකෙන් පෙනුනා. මෙතෙක් අපි පළාත් සභාවක් හැටියට අපට තිබෙන වේගයට, නිලධාරීන්ගේත් කොයි තරම් උනන්දුවක් තිබෙනවාද කියන එක. මම හිතන්නේ, එදා වැඩමුළුවට සහභාගී වුණු අපේ මන්ත්‍රීවරු එය දැක්කා. ඒ අනුව මන්ත්‍රීවරු ත්‍රිකුණාමලයෙන් ගෙදර ආවේ ඉතාමත් සතුටින්, 2017 වර්ෂයේ අපට ගමනක් යන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා මම හිතනවා. ඇතැම් කාරණාවලදී මටත් වඩා ඉදිරියෙන් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු අපේ ලේකම්වරු සහ විශේෂයෙන්ම අපේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) ඇතුළු ඒ සියලුම නිලධාරීන් ඉතාමත් වේගයෙන් මේ ගමන යන්න, සූදානමින් සිටිනවා. ඒ වෙනුවෙන් අපි 2017 ට දැනටමත් සූදානම් වෙලා තිබෙන බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ නිසා මම හිතනවා, ප්‍රධාන ලේකම්තුමා ප්‍රමුඛ සියලු නිලධාරීන්ගේ ඒ කැපවීම, උනන්දුව මම හිතන්නේ, විශේෂයෙන්ම මන්ත්‍රීවරු හැටියට අපි ලබන ජයග්‍රහණයක් හැටියට මම මේ අවස්ථාවේදී ඒක මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම ඔබතුමා දන්නවා. මේ මුදල් ඇමතිතුමාට අපි බැනලා, විවේචනය කිරීමෙන් ඵලක් වෙන්නේ නැහැ. ඒකෙන් අපට අත් වන, පළාතේ ජනතාවට ඇති වන වාසියක් නැහැ. ඒක අපට දේශපාලන විවේචනයක් වෙයි. නමුත් මම හිතනවා, ඊට වඩා හොඳයි - අපි ඒකට ලැහැස්ති වෙලා තිබෙනවා. අපට කැපුවාට වඩා මුදලක්, අපි 2017 වසරේ ප්‍රාග්ධන වියදම්වලට එකතු කරලා තිබෙනවා. ඒ නිසා මේ සිදු වුණු දේ අනුව අපි ඊයේ වන කොට අපේ ගරු ඉඩම් ඇමතිතුමාත්, අදාළ නිලධාරීන්වත් කැඳවලා මම සාකච්ඡා කළා. අපට තිබෙන ආදායම් එකතු කරන්න.

ඒ අනුව මෙතෙක් ගුවන් විදුලි සංස්ථාව, ඒ වාගේම ස්වාධීන රූපවාහිනී සේවය ඇතුළු අපට දෙන්න තිබෙන බදු මුදල් ගෙවීම පැහැර හැර තිබෙන ආයතනවලට නීත්‍යානුකූල කටයුතු කරන්න අවශ්‍ය පසුබිම අපි මේ වන කොට ක්‍රියාත්මක කරන්න කටයුතු සූදානම් කරලා තිබෙනවා. ඒ අනුව අපි හිතනවා, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එක්ක අපට පැවරිලා තිබෙන බලතල ප්‍රකාර, අපට උරුම සියලු ආදායම් අපි 2017 වසරේ එකතු කර ගන්න අපි සියලු කටයුතු කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපට උපදෙස් දෙන්න කමිටුවක් මේ වන කොටත් අපි පත් කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා, එක් එක් ගරු ඇමතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් රැස් වෙලා තීන්දු තීරණ ගන්න අපි මේ වන කොට කමිටුවක් පත් කරලා, ඒ ලියුම්වලටත් මම අත්සන් තැබුවාය කියන පණිවුඩය මම දෙන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, විනාඩියක් ඉන්න.මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා[යසපාලකෝරලගේ මහතා ]මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමාට අවස්ථාව.

**ගරු ඉසුර දේවප්‍රිය-** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ඒ නිසා ඒ කමිටු අපි පත් කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිරි වර්ෂය තුළ වඩාත් ඵලදායී, ගුණාත්මක සංවර්ධනයක් ඇති කරන්න අවශ්‍ය කටයුතු අපි මේ වන කොට සූදානම් කරලා තිබෙනවා. ඒ වාගේම මේ විවාදයට සහභාගී වීමේදී නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා. පොලිස් බලතල හා ඉඩම් බලතල සම්බන්ධයෙන් අපි ව්‍යවස්ථා කමිටුවට ඉදිරිපත් කරපු යෝජනා පිළිබඳව. මම හිතන්නේ, මේ සම්බන්ධව ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. උතුරේ මහ ඇමතිතුමාවත්, දකුණේ මහ ඇමතිතුමාවත් - පළාත් නවයේම මහ ඇමතිවරු, අපි එකට ඉඳගෙන උත්තර දුන්නේ. මේ සියලු දෙනාම.ගරු සභාපතිතුමනි, උතුරේ මහ ඇමතිතුමා මේ පොලිස් බලතල ඉල්ලුවේ නැහැ. අපි 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට පැවරිලා තිබෙන පොලිස් බලතල ඉල්ලුවේ නැහැ. ඒගොල්ලෝ ඉඩම් බලතල ඉල්ලුවේ නැහැ. ඒ නිසා සියලු දෙනාම එකම යෝජනාවක් තමයි ඉදිරිපත් කළේ. එහෙම නැතිව බස්නාහිරයි, උතුරයි වෙනම යෝජනා ඉදිරිපත් නොකරපු බව මේ සභාවේ දැන ගැනීම සඳහා මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම සැලසුම් නිලධාරීන් පිළිබඳව, ඒගොල්ලන්ට තිබෙන අඩුපාඩු පිළිබඳව සාකච්ඡා වුණා. ඒ අනුව ඒ අයටත් මූලික අඩුපාඩුවක්ව තිබෙන අන්තර්ජාල පහසුකම් ලබා දෙන්නට කටයුතු කරන්නය කියලා මම ගරු සභාපතිතුමා මගින් ප්‍රධාන ලේකම්තුමාටත්, ඒ හරහා අපි නියෝජ්‍ය ලේකම්(සැලසුම්) වෙතත් යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු විපක්ෂ නායකතුමාගේ කථාවේදී එතුමා යෝජනා කළා, මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාද ලබා දෙන්න ඕනෑය කියලා. ගරු සභාපතිතුමනි, මම ඉතා වගකීමෙන් කියනවා. මේ සම්බන්ධයෙන් මම මේ අයවැය විවාදය යන වෙලාවේදී පාර්ලිමේන්තුවේ මේ සම්බන්ධව කටයුතු කරන නිලධාරීතුමියත් එක්ක දුරකථනයෙන් කථා කළා. ඒගොල්ලන්ටත් කැබිනට් අනුමැතිය ආවාට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තවමත් ඒ දීමනා නිකුත් කරලා නැහැ. ඒ නිකුත් කරපු හැටියේ - සාමාන්‍යයෙන් ඒ නිලධාරීන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට දෙන වරප්‍රසාදවල ලේඛනයක්, ඒ කාරණා පළාත් නවයටම දැනුම් දෙනවා. එතකොට ඒ අනුව අපටත් ඒගොල්ලෝ දැනුම් දෙයි. ඒ දැනුම් දීමෙන් පස්සේ අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් ලබා දිය හැකි ඒ සියලු වරප්‍රසාද මම ලබා දෙන්නට කටයුතු කරන බව ගරු සභාපතිතුමා මගින් සියලුම මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න කැමැතියි.

ඒ වාගේම අපි දන්නවා. ගරු අගමැතිතුමා. අපි විශේෂයෙන්ම පළාත් සභා මහ ඇමතිවරු හැටියට ඇතැම් කාරණාවලදී අපි කියන එකට කන් දෙන අගමැතිවරයෙක්. ඒ වාගේම මේ අයවැය විවාදය සම්බන්ධයෙනුත් මට දැන ගන්නට ලැබුණා. එතුමා ප්‍රකාශයක් කරලා තිබුණා, අපට සහයෝගය ලබා දෙන්නය කියලා. ඒ නිසා මම ගරු අග්‍රාමාත්‍යතුමාටත් මේ අවස්ථාවේදී විශේෂ ස්තූතියක් කරන්න අමතක කරන්නේ නැහැ. ඒ නිසා අපේ ශ්‍රීනාත් මන්ත්‍රීතුමා වැරදි චෝදනාවක් කළා. අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීවරුන්ට. මම ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ කිසිම මන්ත්‍රීවරයෙකු මගේ ළඟට ප්‍රතිපාදන ඉල්ලා ගෙන ආවේ නැහැ. ඒක වගකීමෙන් කියන්න ඕනෑ. මගෙන් ප්‍රතිපාදන ඉල්ලාගෙන ආවේ නැහැ. එතුමන්ලාගේ දේශපාලන ප්‍රතිපත්තිය වෙනස් වුණේ, නැහැ. හැබැයි, අද ඒගොල්ලෝ අපිත් එක්ක එකතු වෙලා ඉන්නේ. මොකද, ඒගොල්ලෝ අපට ඉදිරිපත් කළා ජාතික වැදගත්කමකින් යුත් යෝජනා. විශේෂයෙන්ම කැලණි ගඟ සම්බන්ධයෙන් සහ පරිසරය සම්බන්ධයෙන්. මොකද, ඒ කාරණාවලදී ප්‍රධාන

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

ඇමතිවරයා හැටියට මමත් මගේ නිලධාරීනුත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වුණා. ඒ නිසා තමයි ඒගොල්ලෝ මේ අයවැයේදී අපට සහයෝගය ලබා දුන්නේ. මොකද, ඒ ප්‍රධාන ව්‍යාපෘතිවලට පළාත් සභාවක් හැටියට අපි ක්‍රියාත්මක වීම නිසා කියලා මම විශ්වාස කරනවා. ඒ අනුව මම හිතනවා, පාර්ලිමේන්තු සම්ප්‍රදායෙන් මිදිලා, අපට ඒගොල්ලෝ ඡන්දය ලබා දෙයි කියලා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි ඇත්තටම සතුටු වෙන්න ඕනෑ. මොකද, කිසිම පළාත් සභාවක නැති දෙයක්. මම මහ ඇමතිවරයා හැටියට පත් වුණාට පස්සේ මම කිව්වා.

මේ ජාතික ආණ්ඩුවකට වඩා සමගියක් අප තුළ තිබෙනවාය කියලා. කවදාවත් මේ පැත්තේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙක් එක්සත් ජාතික පක්ෂයටවත්, ඒ වාගේම වෙනත් අපේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරයෙකුටවත් යම් ප්‍රතිපාදනයක් දුන්නාය කියලා කිසිම මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා මාව විවේචනය කරලා නැහැ. මාත් එක්ක ඒ ගැන argue කරලා නැහැ. ඒගොල්ලෝ කිව්වේ, විපක්ෂයටත් උපකාර කරන්නය කියලයි. ඒ නිසා මම හිතන්නේ, විපක්ෂයට ආදරය කරන, විපක්ෂයත් එක්ක දුක සැප බෙදා ගන්නා පාලක පක්ෂයක් මේ පළාත් සභාවේ සිටීම ගැන මම සතුටු වෙනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ. මම කියපු වචනය නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට තවම පැහැදිලි වෙලා නැහැ. මම කිව්වේ, මේ සභාවට ඇවිල්ලා විරුද්ධ වුණාට ප්‍රශ්නයක් නැහැ. මට ඡන්දය දෙන්න කියලා නොවෙයි මම කිව්වේ. මේ සභාවේ ඉඳගෙන විරුද්ධ වුණාට කමක් නැහැ. ඡන්දය නොදී සිටියත් කමක් නැහැයි කියලයි මම කිව්වේ. ඒක මම ඉල්ලා අස් කර ගන්න ඕනෑ කාරණාවක් නොවෙයි. මම කිව්වේ, මෙතැනට ඇවිල්ලා ඡන්දය නොදී සිටියත් කමක් නැහැ. මට විරුද්ධ වුණත් කමක් නැහැ. මේ සභාවේ ඉන්න ඕනෑය කියලයි මම කිව්වේ. නැත්නම් මුදල් කපනවාය කියලා මම කිව්වේ නැහැ. ඒ නිසා මම ඒක පැහැදිලි කරන්න ඕනෑ. අපේ හොඳ එකඟතාවයක් තිබෙනවා.

මම හිතන්නේ, පළාතේ ජනතාවට ඒක වැදගත්කමක් තිබෙනවා. මොකද, අපි කුලල් කා ගනිමින්, ඇණ කොටා ගනිමින් කටයුතු කළාට, පළාතේ ජනතාවට වන සෙතක්, ශාන්තියක් නැහැ. ඒ නිසා මම ස්තුතිවන්ත වෙන්න කැමැතියි. මේ පළාත් සභාවේ පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට අපගේ ගරු අමාත්‍යවරුන්ගේ සියලු වැය ශීර්ෂ ඒකඡන්දයෙන් සම්මත කරන්නට කටයුතු කිරීම පිළිබඳව මගේ ගෞරවය, ප්‍රශංසාව සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රකාශ කරන්න කැමැතියි. පසුගිය වර්ෂය තුළදී ඔබතුමන්ලාගේ විශ්වාසය කොයි තරම් දුරට මා දිනා ගත්තාද? එය ආරක්ෂා කර ගනිමින් ඉදිරි වර්ෂය තුළත් ඔබ සියලු දෙනාත් එක්ක සහයෝගයෙන් වැඩ කරන්න මමත්,මගේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුත් සූදානම් කියන පණිවුඩය මම මේ අවස්ථාවේදී ලබා දෙන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ඒ අනුව 2017 වර්ෂයට අදාළව මා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන සඳහා නීතිමය බලය පැවරෙන විසර්ජන ප්‍රඥප්තිය අප විසින් සම්මත කර ගත යුතු වෙනවා. ලබන වර්ෂය තුළ ගෙවිය යුතු පුනරාවර්ථන වියදම්, ප්‍රාග්ධන වියදම් සහ ණය අත්තිකාරම් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම මෙම විසර්ජන ප්‍රඥප්තියේ අරමුණයි. එක් එක් වැය ශීර්ෂය යටතේ රුපියල් හැට එක් බිලියන දෙසිය හැත්තෑ හය මිලියන තුන්සිය හැත්තෑ අට දහසක මුදලක් වෙන් කර ඇති අතර, අත්තිකාරම් කටයුතු යටතේ රුපියල් බිලියන හතරයි - මිලියන තුන්සිය තිස් හය දහසක උපරිම සීමාවක් යටතේ වැය කිරීමට මෙමගින් මම මේ සභාවේ බලය ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, බුද්ධ ධර්මයේ කියා තිබෙනවා. අහන්න. ධාරණය කර ගන්න. හැසිරෙන්න කියන කාරණය. මම හොඳට සිහියෙන් අහගෙන හිටියා. හොඳට ධාරණය කර ගත්තා. මම බලාපොරොත්තු වෙනවා,ඒ ධාරණය කර ගත් දේ අනුව ඉදිරියේදී හැසිරෙන්න. ඔබ සමඟ කටයුතු කරන්න. ඒ අනුව අවසාන වශයෙන් මේ අයවැය විවාදයට එක් වුණු ගරු අමාත්‍යවරුන්ටත්, විපක්ෂ නායකතුමා ප්‍රමුඛ සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තුතිය හා ගෞරවය මම පුද කරන්න කැමැතියි. ඒ වාගේම මේ කටයුතු සඳහා දින හයක් තුළ ඉතා වෙහෙස මහන්සි වූ ගරු සභාපතිතුමාට, නියෝජ්‍යසභාපතිතුමාට, මූලාසනය භාරව කටයුතු කළ අනෙකුත් සියලුම මන්ත්‍රීවරුන් ඇතුළු සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලුම ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්ට, කාර්ය මණ්ඩලයට,විශේෂයෙන්ම සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට, සියලුම ජනමාධ්‍ය මහත්වරුන් ඇතුළු සියලු දෙනාට මාගේ අවංක ආදර ස්තුතිය පුද කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ඒ වෙනුවෙන් මේ අයවැය විවාදය වෙනුවෙන් අපි අද රාත්‍රී හතට පොඩි උත්සවයක් සංවිධානය කරලා තිබෙනවා. පසුගිය වර්ෂයේ වාගේම නාවල ඔපියුලන්ට් කේටර්ස් ආයතනයේදී. දියවන්නා ඔය අභියසට රාත්‍රී හතට පැමිණෙන්නය කියලා ගරු ඔබතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා.අවසාන වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ 29 වන මුදල් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ

භාග්‍ය මට ලබා දුන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු රජයේ සියලු දෙනාටත්, පළාතේ ජනතාවටත් සුභ නත්තලක්, සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් 2017 අයවැය විවාදයේ අවසන් කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***පූ.භා. 11.58 ට 2017 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ විවාදය අවසන් විය.***
*At 11.59 p.m the debate on the Appropriation Statute related to Annual Financial Statement of 2017 was concluded.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ විවාදය අවසන් වුණා. ඒ විවාදය වෙනුවෙන් සහභාගී වුණු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මාගේ ස්තුතිය සහ ප්‍රණාමය පුද කර සිටිනවා. 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද විසර්ජන ප්‍රඥප්තියට අදාළව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

බෙදීමක් ඉල්ලා සිටිනවා.

***ඊට අනුකූලව,***

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව80 යි, විරුද්ධව 06 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*Question put and the Council divided as per Rule No 61 (3), 80 for, 06 against and 00 decliners.*

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, "*දැන් මෙම සභාවේ කාලය විනාඩි 15 කින් දීර්ඝ කරන ලෙස*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 12.03 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 12.03 p.m. the Provincial Council resolved itself in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2016 දෙසැම්බර් 14 වන දින එනම්, ඊයේ දිනයේ ආරම්භ වූ සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ විවාදය අද දිනත් ආරම්භ වූ අතර, පෙ.ව. 10.00 ට එකී වැය ශීර්ෂයන් බෙදීමකින් තොරව සභා සම්මත වූ බව මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. ඉන් අනතුරුව විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ සභාවේ බෙදීමක් ඇති වූ නිසා එම බෙදීමේදී ප්‍රඥප්තියට පක්ෂව ඡන්ද 80 ක්, විපක්ෂයව ඡන්ද 06 ක් හා ඡන්දයෙන් වැළකී සිටි මන්ත්‍රීවරු කිසිවෙක් නැහැ. ඒ අනුව එම විසර්ජන ප්‍රඥප්තිය වැඩි ඡන්ද 74 කින් සභා සම්මත වුණා.

ඊත් එක්කම අපි හැමදාම සම්ප්‍රදායානුකූලව පළාත් සභාවේ ඒ වෙනුවෙන් අපට සහයෝගය දැක්වූ සියලුම දෙනාට ස්තුතිය කිරීමේ අපේ චාරිත්‍රයක් තිබෙනවා. ඒ අනුව මුලින්ම අපට හැමදාම සහයෝගය දක්වන අපේ ගරු ආණ්ඩුකාරතුමා වන කේ.සී. ලෝගේස්වරන් මැතිතුමාට
[ගරු සභාපතිතුමා]

මෙම ගරු සභාවේ ස්තුතිය සහ ගෞරවය පුද කර සිටිනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ දෙවන අයවැය අද මේ අවසන් වෙන්නේ. එතුමා මන්ත්‍රීවරු සියලු දෙනා සමඟම සහයෝගයෙන් කටයුතු කරමින් මේ අයවැය විවාදයේදී අපට විශාල ශක්තියක් ලබා දුන්නා. ඒ නිසා මම මේ අවස්ථාවේදී එතුමාට සහ අපේ අනෙකුත් ඇමති මණ්ඩලයට මගේ ස්තුතිය, ගෞරවය මම මේ අවස්ථාවේ පුද කර සිටිනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමා නිරන්තරයෙන් සභාවේ රැඳී සිටිමින් මට විශාල සහයෝගයක් ලබා දුන්නා. එතුමාට ස්තුතිවන්ත වෙනවා. සභානායකතුමාත් ඒ වාගේම තමයි. එතුමාත් නිරතුරුවම සභාවේ සිටිමින් ලබා දුන් සහායට මගේ ස්තුතිය පුද කර

සිටිනවා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට විශේෂ ස්තූතියක් පුද කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම එතුමා නිරතුරුවම සභාවේ රැඳී සිටිමින් මට විශාල සහායක් ලබා දුන්නා. කථික ලැයිස්තුව වෙලාවට හදලා. සමහර වෙලාවට මම අපහසුතාවයට පත් වුණා විනාඩි 03 ක වාගේ කාලයක් වෙන් කිරීම නිසා. ඒ නිසා එතුමාටත් මගේ ස්තූතිය, ගෞරවය පුද කර සිටිනවා.

ඒ වාගේම සභාපති මණ්ඩලයක් අපේ ඉන්නවා. අපේ හෙක්ටර් බෙත්මගේ හිටපු ඇමතිතුමා, අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා. එතුමා මේ වෙලාවේ සභා ගර්භය තුළ නැහැ. ඒ වාගේම අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත් මට විශාල සහයෝගයක් දැක්වූවා. ඒ වාගේම ඊයේ දවසේ සභාපති නාමාවලියේ කිසිම මන්ත්‍රීවරයෙක් මූලාසනයේ අසුන් ගැනීමට සභා ගර්භය තුළ නොසිටි නිසා සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා මට විශාල සහයෝගයක් දැක්වූවා. එතුමා පැය එකහාමාරකට වැඩි කාලයක් මූලාසනයේ රැඳී සිටිමින් මට විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ නිසා විශේෂයෙන්ම එතුමාට මගේ ගෞරවය සහ ස්තූතිය පුද කර සිටිනවා. ඒ වාගේම ඉතාමත්ම සාර්ථක විවාදයක් පැවැත්වීමට දින හයක් තිස්සේ සහභාගී වුණු ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ස්තූතිය සහ ගෞරවය පුද කර සිටිනවා. ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට. ආණ්ඩුකාර ලේකම්තුමා ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලයට. විශේෂයෙන්ම මේ විවාදය ඉතාමත්ම සාර්ථකව පවත්වාගෙන යාමට මට විශාල ශක්තියක් ලබා දුන් සභා ලේකම් හේමන්ත සමරකෝන් මහතා ඇතුළු සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සුවිශේෂී මෙහෙවරක් ඉටු කළා. ඒ හැමෝටම මම ස්තූතිවන්ත වෙනවා. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට, සියලුම අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු අමාත්‍යාංශවල කාර්ය මණ්ඩලයට, සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු ඇතුළු එතුමන්ලාගේ කාර්ය මණ්ඩලවලට, සියලුම දෙපාර්තමේන්තුප්‍රධානීන්ට සහ එම කාර්ය මණ්ඩලවලටත් මම මේ අවස්ථාවේදී මගේ ස්තූතිය සහ ගෞරවය පුද කර සිටිනවා.

ඒ වාගේම තවත් විශේෂ ස්තූතියක් තිබෙනවා. අපට ආරක්ෂාව සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා පොලීසියේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට, අමාත්‍ය ආරක්ෂක අංශයේ නිලධාරීන්ට, තලංගම පොලීසියේ ස්ථානාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට, බෝම්බ නිෂ්ක්‍රීය අංශයට, බස්නාහිර පළාතේ වෙස්ප්‍රෝආරක්ෂක ආයතනයට මම විශේෂ ස්තූතියක් කරනවා. ඒ වාගේම සේවා සැපයීම වෙනුවෙන් කඩුවෙල මහ නගර සභාවේ කොමසාරිස් ඇතුළු එම කාර්ය මණ්ඩලයටත් විශේෂ ස්තූතියක් අපි කරන්න ඕනෑ.

සභා රැස්වීම් වාර්තාකරණය වෙනුවෙන් සියලුම ජනමාධ්‍ය ආයතනයන්ට, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතනවලටත්, මාධ්‍ය නියෝජිතයන්ටත් මගේ ස්තූතිය හා ගෞරවය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම නිල වාර්තාකරණයෙන් සහාය වූ හැන්සාඩ් කාර්ය මණ්ඩලයට, ගරු මන්ත්‍රීවරුන්ගේ කථා පරිවර්තනයෙන් සහාය දැක්වූ භාෂණ පරිවර්තක මහත්ම මහත්මීන්ට විශේෂ ස්තූතියක් මේ අවස්ථාවේදී මම පුද කර සිටිනවා. සහායක සේවා සැපයීම වෙනුවෙන්, ආහාර පාන, සංග්‍රහ කටයුතු සිදු කරමින් සේවා සැපයූ සියලුම ආයතනයන්ට, පවිත්‍රතා කටයුතු සඳහා සේවා සැපයූ සියලුම ආයතනයන්ට, නන් අයුරින් සහාය දැක්වූ ඉහත ප්‍රකාශ නොකළ යම් පාර්ශවයක් වේ නම් ඒ සියලුම පාර්ශවයන්ට, ඉහළම නිලධාරියාගේ සිට සුළු සේවකයා දක්වා මගේ ප්‍රණාමය ස්තූතිය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම විශේෂයෙන්ම මම ඉතාම සන්තෝෂ වෙනවා, 2017 අයවැය විවාදය වෙනුවෙන් ගරු මන්ත්‍රීතුමන්ලා ලබා දුන් සහයෝගය වෙනුවෙන් මගේ ගෞරවය සහ ස්තූතිය ගරු විපක්ෂ නායකතුමාට, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට, පක්ෂ නායකයින්ට ඒ හැම කෙනාටම මගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කරනවා.

ඒ වාගේම ගරු මහ ඇමතිතුමා ප්‍රකාශ කළා අද රාත්‍රියේදී ඔපියුලන්ට් හෝටලයේදී සුහද හමුවක් පැවැත්වෙනවා කියලා. ඒ සඳහා එතුමා ආරාධනා කළා. මම ආරාධනා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ නිසා හැමෝටම සුභ නත්තලක් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම ලබන්නා වූ 2017 නව වසර ඔබ සැමට සාමය, සතුට පිරි සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

# කල් තැබීම
ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.10 ට, 2017ජනවාරි මස 03 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 12.10 a.m till 09.30 a.m, on 03.01.2017.*